වාර්ෂික වාර්තාව 2017

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පටුන

ආයතනික තොරතුරු	2
කාර්ය මණ්ඩලය	**3**
සභාපතිතුමාගේ පණිවුඩය	**4-5**
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය	**6-7**
අපගේ දැක්ම හා මෙහෙවර	**8**
කාර්ය සාධනය	**9-31**
මූල්‍ය වාර්තාව	**32-50**
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වාර්තාව	**51-63**
විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පිළිතුරු වාර්තාව	**64-76**
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව	**77 - 84**
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	**85 - 88**

ආයතනික තොරතුරු

ආයතනයේ නම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

නීත්‍යානුකූල පනත

2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

අධ්‍යක්ෂ මණ්ඩලය 2017

කීර්ති වික්‍රමරත්න මහතා	**සභාපති**	**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
මාලනී කුමාරිහාමි මිය	සාමාජික	විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය
බී. එන්. දමින්ද කුමාර මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික
අයි. ජේ. අබේරත්න මිය	සාමාජික	කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
ඩී. වී. බන්දුලසේන මහතා	සාමාජික	කෘෂිකර්ම අමාත්‍යාංශය
කේ.බී.ගුරුගේ මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික
ඩබ්. ටී. එච්. රුවිර විතාන මහතා	සාමාජික	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
ඩී. ඩී. ආරියරත්න මහතා	සාමාජික	වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
ඒ. එම්. ආර්. ජේ. කේ. ජයසිංහ මහතා	සාමාජික	ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
එස්. තර්ෂන් මහතා	සාමාජික	මුදල් අමාත්‍යාංශය
ආර්. පී. ආර්. අමරසිංහ මිය	සාමාජික	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
දමිත කුමාරසිංහ මහතා	සාමාජික	මහජන උපයෝගීතා කොමිසන් සභාව
ඩී.ඩී.ආනන්ද නාමල් මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික
ෆර්සානා අනීෆ් මිය	සාමාජික	පත් කරන ලද සාමාජික
ඒ. එම්. සී. පෙරේරා මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික
හිරාන් අජිත් කරුණාරත්න මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික
ජී. මහේන්ද්‍ර පෙරේරා මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික
ජී. විජිත නන්ද කුමාර මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික
සරත් ජයතිලක මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික
චන්ද්‍රසිරි සෙනෙවිරත්න මහතා	සාමාජික	පත් කරන ලද සාමාජික

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 2017

එස්. තර්ෂන් මහතා	සභාපති	**මුදල් අමාත්‍යාංශය**
ෆර්සානා අනීෆ් මිය	සාමාජික	පත් කරන ලද සාමාජික
බී.ඒ.ඩී.ඒ. අබේවර්ධන මහතා	සාමාජික	විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය
එච්.ඒ.ඩී. චාන්දනී මිය	සාමාජික	ජාතික විගණන කාර්යාලය
මාලනී කුමාරිහාමි මිය	සාමාජික	විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

කාර්ය මණ්ඩල සංයුතිය 2017

මුළු කාර්ය මණ්ඩල සංඛ්‍යාව 103 දෙනෙකුගෙන් සමන්විත වන අප ආයතනය සාපේක්ෂව කුඩා ආයතනයකි.

අපගේ කාර්ය මණ්ඩල සංයුතිය පහත දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය

ගොඩනැගිලි අංක 05, පළමු වන මහල,
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07
දුරකථන අංකය : 0112677445
ෆැක්ස් අංකය : 0112682534
ඊමේල් ලිපිනය : info@energy.gov.lk
වෙබ් අඩවිය : www.energy.gov.lk

සභාපතිතුමාගේපණිවුඩය

2017 වර්ෂයේ ක්‍රියාකාරකම්වල කාර්ය සාධන සමාලෝචනය සඳහා මෙම පණිවුඩය එක් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපතිවරයා ලෙස මම සතුටට පත්වෙමි.

බලශක්තිය, රටෙහි දියුණුව සඳහා අවශ්‍ය වන මූලික අවශ්‍යතාවලින් එකකි. එබැවින්, උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගත හැකි වන ආකාරයෙන් බලශක්ති සැපයුම සහ ඉල්ලුම ප්‍රශස්ථ අයුරින් කළමනාකරණය කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දෙමින්, රටෙහි දියුණුවෙහි වැදගත් ආර්ථික මානයක් ලෙස බලශක්ති තිරසාරත්වය හඳුනාගෙන ඇත.

බලශක්තිය භාවිතා කිරීමේ ඉතිහාසය මුළුල්ලෙහි ශ්‍රී ලංකාව, තිරසර බලශක්තිය සඳහා ලබාදිය යුතු සැලකිල්ල ලබා දී ඇති බව මා සඳහන් කරන්නේ සතුටිනි. තිරසර බලශක්තියෙහි එක් වැදගත් මූලිකාංගයක් වන සංරක්ෂණය, අපගේ ජනතාවට සංස්කෘතිකව උරුම වී ඇත. පරිසරයට මුදා හැරීමට ප්‍රථමයෙන් සම්පත්වලින් ලබාගත හැකි උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට අපි පුරුදු වී සිටීමු. එය අපගේ ජීවන රටාවේ කොටසක් විය. පසුව බලශක්ති සම්පත් සම්බන්ධයෙන් වූ විට, කාලයකට පෙර අපගේ සම්පූර්ණ බලශක්ති අවශ්‍යතාවය පුනර්ජනනීය බලශක්තිය තුළින් ලබා ගැනීමට අපට හැකි විය. එසේ වුවත්, විශේෂයෙන් විශාල ජල සම්පත් අවසන් වීමත් සමඟ වෙනත් බලශක්ති සම්පත් කරා යොමු වීමට ශ්‍රී ලංකාවට සිදු විය.

නවීන බලශක්ති භාවිතය තුළ, තිරසර බලශක්තිය සඳහා ගමන් කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත හරහා ශ්‍රී ලංකාව ශක්තිමත් මුලපිරීමක් සිදු කර ඇති බව පෙනී ගොස් ඇත. සංරක්ෂණ ක්‍රියාමාර්ග අපට උරුමයෙන් ලැබී තිබුනද, පාරම්පරික ප්‍රවේශයන් තුළින් වර්තමාන සන්දර්භය තුළ අවශ්‍ය වන සංරක්ෂණය ක්‍රියාවේ යෙදවීමට අපට හැකියාවක් නොලැබෙනු ඇත. බලශක්ති භාවිතය විධිමත්ව කළමනාකරණය කිරීම තුළින් බලශක්ති සංරක්ෂණය ක්‍රියාවට නැංවීම සඳහා නවීන තාක්ෂණය, නීති සම්පාදක ප්‍රවේශයන්, පර්යේෂණ සහ සංවර්ධන, දැනුම සහ දැනුම්වත් කිරීම අපට අවශ්‍ය වේ. එලෙසම, දිවයිනෙහි අනාගත බලශක්ති ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ථ අයුරින් ගොනු කිරීම පිණිස බලශක්ති සම්පත් පරිභෝජනය සම්බන්ධයෙන්ද අප නව්‍ය ප්‍රවේශයන් කරා යොමුවිය යුතු වේ.

දිවයිනෙහි තිරසර බලශක්ති සංවර්ධනය මහා පරිමාණයෙන් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය රාමුවක් මේ වනවිටත් සකස් කර ඇති කාරණය සම්බන්ධයෙන් සලකා බැලූ විට පසුගිය කාල පරිච්ඡේදයේදී ක්‍රියාවට නංවන ලද වැඩසටහන්වල ප්‍රගතිය සම්බන්ධයෙන් අපට සතුටට පත් විය හැක. එය

අනාගතයේදී සංවර්ධනය වූ තිරසර බලශක්ති අදියරක් සඳහා උපකාරී වන වේදිකාවක් වනු ඇත. සූර්ය කෝෂ තාක්ෂණය මඟින් නිපදවන විදුලිය ගබඩා කිරීමේ තාක්ෂණය අනාගත බලශක්ති ගැටළුවට තිරසාර විසඳුමක් වනු ඇති බව මම විශ්වාස කරමි.

දිවයිනෙහි තිරසර බලශක්ති මුලපිරීම් සිදු කිරීම සඳහා ලබාදුන් සහයෝගය වෙනුවෙන් විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයාට සහ සියලු පාර්ශවකරුවන්ට මාගේ හෘදයාංගම ස්තුතිය පළ කර සිටිමි.

කීර්ති වික්‍රමරත්න
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

බලශක්ති තිරසාරත්වය උදෙසා මඟ පෙන්වන ප්‍රධාන ජාතික ආයතනය වන්නේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 2007 වර්ෂයේදී ස්ථාපිත කර ඇති අතර, එය දිවයිනෙහි බලශක්ති ගමන් මඟෙහි වැදගත් සන්ධිස්ථානයකි. බලශක්තිය තර්කාන්විතව භාවිතා කිරීම කෙරෙහි ගෝලීය අවධානය ක්‍රමයෙන් යොමු වෙමින් පවතින බව අවබෝධ කර ගනිමින්, සුනිත්‍ය බලශක්තියෙහි මූලපිරීම් සමඟ සමස්ත දිවයිනම ඊට අනුගත වීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් අපට සතුටු විය හැක. මේ දක්වා ක්‍රියාවට නංවා ඇති ක්‍රියාකාරකම් මඟින් අනාගතයේදී ශ්‍රී ලංකාවට මෙම විෂය සම්බන්ධයෙන් ප්‍රමුඛ රටක් වීම සඳහා අවශ්‍ය වටපිටාව සකස් කර දී ඇත.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කළමනාකරණය යන ප්‍රධාන තේමා දෙකක් යටතේ මෙන්ම දැනුම සහ උපායමාර්ගික විෂය පථයන්හි ක්‍රියාවට නංවන ලද වැඩසටහන් සමඟින් සහ සමාලෝචිත වර්ෂයේ සාක්ෂාත් කර ගැනීම් සමඟින් 2017 වර්ෂයේදී ආයතනයෙහි ක්‍රියාකාරකම්වල විශිෂ්ට ප්‍රගතියක් සනිටුහන් කිරීම සම්බන්ධයෙන් අපට සතුටු විය හැක. පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් බලශක්ති උත්පාදන ධාරිතාවය මෙ.වො. 450 ඉක්මවීමත් සමඟින් විදුලිබල උත්පාදනයෙන් 10%ක් නව පුනර්ජනනීය බලශක්ති සම්පත් භාවිතා කිරීමෙන් සිදු කිරීමේ මුල් ඉලක්කය පසු කර යා හැකි වේ. මේ හා සමානව, නියාමන සහ පහසුකම් සැපයීමේ මැදිහත්වීම් ආකාරයෙන් සිදු කරන බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන් තුළින්, කර්මාන්ත සහ වාණිජ අංශවලත් රාජ්‍ය ආයතනවලත් එමෙන්ම ගෘහස්ථ ක්ෂේත්‍රයේත් ක්‍රියාවට නංවන ලද වැඩසටහන් හරහා විදුලිය, ඉන්ධන තෙල් සහ දර භාවිතා කිරීමේ සැලකිය යුතු අඩු වීමක් සාක්ෂාත් කර ගැනීමට හැකි වී ඇත. මේවාට අමතරව, අනාගත ඉලක්කයක් ඇතිව, විශේෂයෙන් ප්‍රතිපත්ති, උපාය මාර්ග, පර්යේෂණ සහ සංවර්ධන සහ දැනුවත්භාවය ඇති කිරීමෙහි ක්‍රියාවට නංවන ලද වැඩසටහන් මඟින් කෙටි කාලීන අනාගතයෙහි මෙන්ම දීර්ඝ කාලීනව තේමාත්මක ක්ෂේත්‍ර දෙකෙහිම විෂය පථය ඉහළ නැංවීම සඳහා උපකාරී වන තත්ත්වයක් ඇති කරනු ඇත.

දිවයිනෙහි තිරසර බලශක්ති සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම සඳහා සහයෝගය ලබා දුන් සියලු පාර්ශවකරුවන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පළ කර සිටීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. බලශක්ති තිරසාරත්වය උදෙසා දිවයිනට ඉදිරි වැඩ කටයුතු රාශියක් සිදු කිරීමට ඇති බැවින් අපගේ අනාගත සාර්ථකත්වය සඳහා සියළු පාර්ශවයන්ගේ අඛණ්ඩ සහයෝගය ප්‍රධාන අවශ්‍යතාවයක් වේ.

බලශක්ති තිරසාරත්වය උදෙසා දිවයින රැගෙන යන අනාගත වැඩසටහන් සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමි.

රංජිත් සේපාල

අධ්‍යක්ෂ ජනරාල්

අපගේ දැක්ම

බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්

අපගේ මෙහෙවර

ගවේෂණය, සුසාධනය, පර්යේෂණ සහ සංවර්ධන මෙන්ම දැනුම් කළමනාකරණය තුළින් දේශීය බලශක්ති ප්‍රභව සංවර්ධනයට සහ බලශක්ති සම්පත් ඉතිරි කරගැනීමටත් සිදු කෙරෙන්නා වූ ජාතික ව්‍යායාමයට මඟ පෙන්වීම සහ එමඟින් ස්වාභාවික, මානව සහ ආර්ථික සම්පත් සුරකිමින් ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමට මඟ සැලසීම.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කාර්ය සාධනය

1. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි මූලික අරමුණු සහ ක්‍රියාකාරකම්

ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා උපායමාර්ගයන් මගින්, ජාතික හා පෞද්ගලික යන දෘෂ්ටි කෝණයන් දෙක තුළින්ම බලශක්ති සුරක්ෂිතතාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. සෑම පුරවැසියකුටම විශ්වසනීය හා දැරිය හැකි මිලකට පිරිසිදු බලශක්ති ප්‍රමාණයක් ලබා දෙන තත්ත්වයක් ඇතිකිරීම ජාතික බලශක්ති ප්‍රතිපත්තිය මගින් අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (ශ්‍රීලසුබඅ) යනු සියළුම ආකාරයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය හා තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ප්‍රධාන රාජ්‍ය ආයතනයයි. ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය වර්තමානයේ දී බොහෝ අභියෝග වලට මුහුණ දී සිටී. රට පුරා අඛණ්ඩව හා දැරිය හැකි මිලකට විදුලිය සැපයීම සම්බන්ධ කරුණුත්, තාප විදුලිබල උත්පාදනය සඳහා ආනයනය කරනු ලබන පොසිල ඉන්ධන මගින් ආර්ථිකය මත ඇති කරන අහිතකර බලපෑමත් මින් ප්‍රධාන වේ. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා රජය පහත ඉලක්ක ස්ථාපනය කර ඇත.

- ආනයනය කරනු ලබන පොසිල ඉන්ධන සඳහා විකල්පයක් වශයෙන් වර්ෂ 2020 දී නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් 20% ක් ජාල සම්බන්ධිත විදුලියෙන් නිපදවීම.
- විදුලිබල සංරක්ෂණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම තුළින් වර්ෂ 2020 වන විට මුළු බලශක්ති පරිභෝජනයෙන් 10% ක් අඩු කිරීම.

බලශක්ති පුරක්ෂිතතාවය තහවුරු කරමින් මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පහත සඳහන් ක්‍රමෝපායන් භාවිතා කරයි.

- සියළු ආකාරයේ පුනර්ජනනීය බලශක්තිය භාවිතය වැඩි කිරීම
- බලශක්ති වටිනාකම් දාමයන් තුළ බලශක්ති කාර්යක්ෂමතාව හා සංරක්ෂණය වැඩි දියුණු කිරීම
- පොසිල ඉන්ධන පදනමෙන් තිරසාර බලශක්ති පදනමක් බවට බලශක්ති ක්ෂේත්‍රය පරිවර්තනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම.
- රටේ තිරසාර බලශක්ති ආයෝජන සඳහා හිතකර වාතාවරණයක් ඇති කිරීම
- නව තිරසාර බලශත්ති තාක්ෂණය හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම
- තිරසාර ජීවන රටා, වාසස්ථාන හා අසල්වැසි බිම් සඳහා ජනතාව දැනුවත් කිරීම.

2020 වන විට නව පුනර්ජනනීය බලශක්තිය භාවිතා කරමින් 20% ක් විදුලිය නිපදවීමේ අරමුණෙහි සතුටුදායක මං සලකුණක් සනිටුහන් කරමින් නව පුනර්ජනනීය බලශක්තිය (NRE) මගින් විදුලි ජනනය, මුළු විදුලි ජනනයෙන් 10% සීමාව පසුකර ඇත.

බලශක්ති සංරක්ෂණ ක්ෂේත්‍රය තුළ නියාමන මැදිහත්වීම් හා බලශක්ති කාර්යක්ෂමතා සේවා අංශය ශක්තිමත් කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

පහත සඳහන් පරිදි තේමාගත ක්ෂේත්‍ර 4 ක් යටතේ වැඩසටහන් ක්‍රියාවට නැගේ.

- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය - ජාතික පුනර්ජනනීය බලශක්ති ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ඍජුවම දායක වීම.

  (විශේෂිත තේමාව: REAct- අරමුණ වනුයේ පුනර්ජනනී බලශක්ති ක්‍රියාවට නැංවීම)

- බලශක්ති සංරක්ෂණය සහ කළමනාකරණය - අරමුණ වනුයේ ජාතික බලශක්ති සංරක්ෂණ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඍජුව දායකත්වය ලබාදීමයි.

  (විශේෂිත තේමාව: EnMap - බලශක්ති කළමනාකරණ සැලැස්ම)

- දැනුම් කළමණාකරණය - අරමුණ වන්නේ බලශක්ති සවිඥානික ජාතියක් බිහිකිරීම සඳහා බලශක්ති අධ්‍යාපන වැඩසටහන් ක්රියාත්මක කිරීමයි.

  (විශේෂිත තේමාව: SEEK - බලශක්ති දැනුමින් සුනිත්‍ය බලශක්තිය)

- ක්‍රමෝපාය - අරමුණ වන්නේ රට තුළ දිගුකාලීන තිරසාර බලශක්ති ස්ථාපනයට සහාය වීම සඳහා ප්‍රතිපත්තිමය මැදිහත් වීම්, පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් හා තාක්ෂණික සංවාදයන් ඇති කිරීමයි.

  (විශේෂිත තේමාව: SAFE - අනාගත බලශක්ති සඳහා තිරසාර ප්‍රවේශය)

2. ශ්‍රී ලංකාවේ බලශක්ති සංරක්ෂණයේ වර්තමාන තත්ත්වය සහ 2017 දී හඳුන්වාදුන් නව ක්‍රියාමාර්ග

	බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම (EnMap යටතේ)
1	බලශක්ති කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම

ISO 50001 බලශක්ති කළමනාකරණ පද්ධති හඳුන්වාදීම මඟින් වාණිජ, කාර්මික සහ ගෘහස්ත ක්ෂේත්‍රවල බලශක්ති සංරක්ෂණය සඳහා පහසුකම් සපයයි.

- ✓ පෞද්ගලික අංශයේ බලශක්ති කළමනාකරුවන් 205 ක් සහ බලශක්ති විගණනකරුවන් 16 ක් ප්‍රතීතනය කර ඇත. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද SP/ PCMD/ 6/ 2015 යන චක්‍ර ලේඛනයට අනුව රාජ්‍ය අංශයේ බලශක්ති කළමනාකරණ නිලධාරීන් 150ක් පමණ පත්කර ඇත.


SRI LANKA SUSTAINABLE ENERGY AUTHORITY
ACT. No.35 OF 2007

2

<u>ප්‍රමිත සහ රෙගුලාසි හඳුන්වාදීම</u>

කාර්මික, ගෘහස්ත සහ වාණිජ අංශවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීම සහ නිසි නියාමන මැදිහත් වීම් සකස් කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විවිධ ක්‍රියාකාරකම් සිදු කරමින් පවතී.



විස්තර	ප්‍රගතිය
CFL ලාම්පු	CFL ලාම්පු සඳහා වන සංශෝධිත ප්‍රමිති ප්‍රකාශයට පත් කෙරිණි. සංශෝධිත ප්‍රමිති සඳහා වූ රෙගුලාසි පිළියෙල කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇත.

වායු සමීකරණ	බලශක්ති ලේබල්කරණ ප්‍රමිති කෙටුම්පත පිළියෙල කොට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත යවනු ලැබූ අතර, ළඟදීම ප්‍රකාශයට පත්කිරීමට නියමිතයි.
ශීතකරණ	අනෙකුත් රටවල භාවිතා වන ප්‍රමිති අධ්‍යයනය කිරීමෙන්, ශීතකරණ සඳහා වන ප්‍රමිති සැකසීම ආරම්භ කරන ලදි. පූර්ණ පරිමාණයේ බලශක්ති ලේබල් කිරීමකට පෙර, ශීතකරණය සඳහා අවම බලශක්ති කාර්යක්ෂමතා ප්‍රමිති (MEPS) සකස් කර ඇත.
LEDලාම්පු	LED ලාම්පු සඳහා ස්වෙච්ඡා බලශක්ති ලේබලය නිර්මාණය කර බලශක්ති ලේබල වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. අනිවාර්ය පදනම මත බලශක්ති ලේබල වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා, ඊට අදාළ කෙටුම්පත් රෙගුලාසි නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවනු ඇත.
පරිගණක	බලශක්ති ලේබල්කරණ ප්‍රමිති කෙටුම්පත් පිළියෙල කොට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත යවනු ලැබූ අතර, එය ළඟදීම ප්‍රකාශයට පත් කිරීමට නියමිතයි.
සීලිං පංකා	සීලිං විදුලි පංකා සඳහා වන බලශක්ති ලේබල වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාලව පරීක්ෂණාගාර උපකරණ මිලදී ගෙන පරීෂණාගාරයේ ස්ථාපනය සිදු වෙමින් පවතී.

- ✓ සංශෝධිත "බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සංග්‍රහය" ක්‍රියාත්මක කිරීම සඳහා වූ රෙගුලාසි කෙටුම්පත් කර ඇත. ගොඩනැගිලි ශ්‍රේණිගත කිරීමේ ක්‍රමෝපායක් ඇතුළුව මෙම කේතය සම්බන්ධ සමස්ථ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- ✓ "ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති නිවාස සඳහා වන මාර්ගෝපදේශය" භාෂා තුනෙන්ම පූර්ව මුද්‍රණ මට්ටම දක්වා සකස් කර ඇත.

3

<u>උපදේශන සේවා</u>

උපදේශන සේවා, ඉල්ලීම් මත සිදුකරන දැනුවත් කිරීමේ වැඩසටහන්, ISO 50001 විගණනයට සහභාගි වීම ආදියෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරිය කර්මාන්ත හා වාණිජ අංශවලටත් රජයේ ආයතන වලටත් සහාය ලබා දෙයි. බලශක්ති විගණනය කරන පුද්ගලයන්ට මුදල් ගෙවා භාවිතයට ලබා ගැනීම සඳහා උපකරණ බැංකුවක් පවත්වාගෙන යයි. උපදේශන සේවය යටතේ සිදුකරන ලද කාර්යයන් පහත දැක්වේ.

- ✓ ආයතන අටක ISO 50001 විගණන පැවැත්වීම සිදු කරන ලදී.
- ✓ බලශක්ති කාර්යක්ෂමතා වර්ධක, බලශක්ති විගණන සේවා සහ තාක්ෂණ සේවා සැපයුම් යන කාණ්ඩ යටතේබලශක්ති සේවා සැපයුම් ආයතන 44 ක් ලියාපදිංචි කර ඇති අතර, යාවත්කාලීන කරන ලද මෙම ලැයිස්තුව වෙබ් අඩවියෙහි පළ කර ඇත.
- ✓ කළුතර විශේෂ කාර්ය බලකා පුහුණු පාසල තුළ බලශක්ති විගණනයක් සිදුකරන ලදී.
- ✓ ස්වාධීන රූපවාහිනිය,යන්ත්‍රෝපකරණ අධිකාරිය - වයඹ පළාත යන ආයතන තුල සවිස්තරාත්මක බලශක්ති විගණන සිදු කර ඇත.
- ✓ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසලෙහි සවිස්තරාත්මක බලශක්ති විගණනය සිදුකරමින් පවතී.
- ✓ කොළඹ ආරක්ෂක විද්‍යාලය සහ පැලවත්ත හා සෙවණගල සීනි කම්හල් තුල සවිස්තරාත්මක බලශක්ති විගණන සිදු කිරීම සඳහා උපදේශක සේවා, පුහුණු හා තාක්ෂණික සහාය ලබාදෙන ලදි.
- ✓ මධ්‍යම පළාතේ රාජ්‍ය ආයතන 10 ක බලශක්ති විගණන සිදු කරන ලදි.
- ✓ රජයේ රෝහල් හා ආයතන වල සවිස්තරාත්මක බලශක්ති විගණනයන් 16ක් සිදුකිරීම සඳහා සුදුසු බලශක්ති සේවා ආයතන තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් ඇගයීම සිදු කරන ලදී.
- ✓ උපකරණ බැංකුව මඟින් නිකුත් කල උපකරණ වල, සේවා ලබා දී ඇති උපකරණ-දින ගණන 1,200 කි.

4

<u>'විදුල්කා' බලශක්ති ප්‍රදර්ශනය හා සම්මාන ප්‍රදානය</u>

නව තාක්ෂණය හා දැනුම ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් විදුල්කා බලශක්ති ප්‍රදර්ශනය පැවැත්වීම හරහා ජාතික මට්ටමේ ප්‍රවර්ධනාත්මක ක්‍රියාකාරකම් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් දායකත්වය සපයනු ලැබේ. මෙමගින් බලශක්ති සංරක්ෂණයට අදාළ නිෂ්පාදන හා සේවා ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන බලශක්ති අංශයේ ආයතන,

	උපකරණ සැපයුම්කරුවන්, නිෂ්පාදකයන්, නවෝත්පාදකයින් සහ විද්වතුන් සඳහා අනගි අවස්ථාවක් ලබා දෙයි.
5	<u>විශේෂිත ක්ෂේත්‍ර බලශක්ති කළමනාකරණය</u> පළාත් මට්ටමින් බලශක්ති කළමනාකරණ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහාය ලබා දෙයි. ✓ දකුණු සහ මධ්‍යම පළාත්වල බලශක්ති කළමනාකරණය පිළිබඳ තේ කර්මාන්තශාලා කළමනාකරුවන් සහ කර්මාන්තශාලා නිලධාරින් 60 දෙනෙක් සඳහා පුහුණු වැඩ සටහන් දෙකක් ක්‍රියාත්මක කරන ලදි. ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (SLEMA) මගින් මෙම වැඩසටහන් මෙහෙය වන ලදි.
6	<u>මහජනතාව දැනුවත් කිරීම සහ පුහුණුව</u> ✓ මාධ්‍යවේදීන් සඳහා වූ බලශක්ති හා පාරිසරික පාඨමාලාවේ පළමු අදියර නිම කරන ලද අතර මෙම පාඨමාලාව සාර්ථකව නිම කළ මාධ්‍යවේදීන් 17 දෙනෙකු ඇගයීමට ලක්කරන ලදි. 2017 මැයි මස 3 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී දෙවැනි අදියර ආරම්භ කරන ලදී. මාධ්‍යවේදීන් 15 දෙනෙකු මෙම පුහුණුව ලබන අතර, එම වැඩසටහන 2018 අප්‍රේල් මාසයේදී නිම කරනු ඇත. ✓ බලශක්ති සංරක්ෂණය පිළිබඳ ලිපි මාලාව "නැණලිය" පුවත්පතේ පළ කරන ලදී. ✓ සූර්ය බලශක්තිය පිලිබඳ ලිපි මාලාව "විදුසර" පුවත්පතේ පළ කරන ලදී.

7	<u>පර්යේෂණ හා සංවර්ධනය</u> ශ්‍රී ලංකාවේ බලශක්ති කළමනාකරණ ක්‍රමවේද සංවර්ධනය සඳහා නවමු තාක්ෂණයන් භාවිතා කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා පියවර ගනු ලැබේ. ✓ බලශක්ති කාර්යක්ෂමතාව නිරවද්‍යයව ඇගයීමට ලක් කිරිම සඳහා තේ පර්යේෂණ ආයතනයේ (TRI) සහාය ඇතිව, නවීකරණය කල ජල නල, රේඩියේටර්, ක්‍රියාවලි පාලනය සහ පැතිරීමේ යාන්ත්‍රණය ඇතුලත් සම්මත තේ වියලනයක්නිර්මාණය කරන ලදි. මේ සම්බන්ධව තේ පර්යේෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතයි.
8	<u>නියමු ව්‍යාපෘති</u> ත්‍රි-ජනන (ට්‍රයිජෙනරේෂන්) හෝ ඒකාබද්ධ විදුලි සිසිලන හා තාපය (CCHP) යනු එක් බලශක්ති ප්‍රභවයකින් එකවර විදුලිය, තාපය සහ සිසිලනය සිදු කිරීමයි. මේ ක්‍රමය මඟින් බලශක්තිය උපරිම ලෙස භාවිතය නිසා 80% කට වැඩි කාර්යක්ෂමතාවයක් ලබා ගත හැකිය. හෝටල්, රෙදිපිළි, ඇඟළුම් වැනි කේෂත්‍ර සහ කාර්මික කලාප සඳහා ත්‍රි-ජනන නිෂ්පාදන හඳුන්වාදීමේ හැකියාව සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අධ්‍යයනය කෙරේ. මේ සඳහා යෝජනා තෝරා ගැනීමේ අවසන් ඇගයීම් සිදුවෙමින් පවතී.
9	<u>ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමනාකරණ (ODSM) වැඩසටහන</u> විදුලිබල ක්ෂේත්‍රයේ අවධානය යොමු කර ඇති මෑත අධ්‍යයනයකින් පෙන්නුම් කරන්නේ වසර පහක කාල සීමාවක් තුළ රුපියල් බිලියන 135ක් ආයෝජනය කිරීමෙන් වාර්ෂිකව ගිගා වොට් පැය 1895 (රුපියල් බිලියන 28ක්) විදුලිබලයක් ඉතිරි කර ගත හැකි බවයි. විදුලි ඉල්ලුම කළමණාකරණය සඳහා පදනම සපයන මෙම සංකල්පය, ලංකා විදුලිබල මණ්ඩලයේ වසර 2014-2039 දිගුකාලීන විදුලි උත්පාදන සැලැස්මෙහි අඩුම පිරිවැය විකල්පය ලෙස හඳුනාගෙන ඇත. මේ අනුව වාණිජ,ගෘහස්ත හා කාර්මික යන ක්ෂේත්‍ර යටතේ මූලික ව්‍යායාම නවයක් ක්‍රියාත්මක කිරීම සඳහා වන වැඩසටහන "ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමණාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය" හා ජාතික පාලන කමිටුවක උපදෙස් මත ක්‍රියාත්මක කරනු ලැබේ.

වැයම	කරන ලද කාර්යයන්
කාර්යක්ෂම වායු සමීකරණ	විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මගින් වායු සමීකරණ කාර්යක්ෂම භාවිතය සඳහා චක්‍ර ලේඛනයක් නිකුත් කරන ලදි. රාජ්‍ය අංශයේ බලශක්ති කළමනාකරණ නිලධාරීන් (දිවයින පුරා) සහ බස්නාහිර පළාතේ බලශක්ති කළමනාකරණ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදි.
කාර්යක්ෂම ශීතකරණ	ශ්‍රී ලාංකීය වෙළඳ පොළෙන් අකාර්යක්ෂම ශීතකරණ ඉවත් කිරීම පිළිබඳ නීතිමය කෙටුම්පත සකස් වෙමින් පවතී. වැඩසටහනේ පාර්ශව කරුවන් විසින් එය සමාලෝචනය කරනු ඇත. අකාර්යක්ෂම ශීතකරණයක් වෙනුවට කාර්යක්ෂම ශීතකරණයක් ආදේශ කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.
කාර්යක්ෂම සිසිලක	2017 මැයි 31 වන දින බලශක්ති සේවා සැපයුම් ආයතන සඳහා රැස්වීමක් පැවැත්විණි. සිසිලක පිළිබඳ දත්ත එකතු කිරීම සිදු කෙරෙමින් පවතී. ටෙක්සෝල් (පුද්) සමාගම සහ සිලෝන් බිස්කට් ලිමිටඩ් හි ඉංජිනේරුවන් සමඟ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.
කාර්යක්ෂම මෝටර්	මෙම වැඩ සටහන ක්‍රියාවට නැංවීම සඳහා ලංකා විදුලි පෞද්ගලික සමාගමේ බල ප්‍රදේශයෙන් කර්මාන්ත කිහිපයක් තෝරා ගෙන තිබේ. කර්මාන්ත 50 ක කර්මාන්ත පර්ශදයක සමීක්ෂණයක් පැවැත්වීම සඳහා

	සැලසුම් කර තිබේ.
සූත්‍රිකා ලාම්පු භාවිතයෙන් ඉවත් කිරීම	"ශක්ති" නමින් හඳුන්වන LED ලාම්පු බෙදාහැරීමේ ක්‍රමය හඳුන්වා දී ඇත. 2017 වර්ෂය තුළ මාසික විදුලි පරිභෝජනය ඒකක 90 ට අඩු ගෘහස්ත විදුලි පාරිභෝගිකයින් මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වේ. විදුලිබල මණ්ඩලයේ හා ලංකා විදුලි පෞද්ගලික සමාගමේ නියෝජිතයින් හරහා සුදුසුකම් ලත් පාරිභෝගිකයින් සඳහා LED ලාම්පු මිලියන 10 ක් බෙදා දීමට යෝජිත වැඩසටහන මඟින් බලාපොරොත්තු වේ. පොලී රහිතව මාසික වාරික 24 කින් පිරිවැය පාරිභෝගිකයන්ගෙන් අයකර ගනු ලැබේ. තරඟකාරී ලංසු ක්‍රමවේදය තුළින් සුදුසු LED ලාම්පු සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය ආරම්භ කර ඇත. මෙම වැඩසටහන සඳහා සහභාගී වන ගිණුම් හිමියන්ගේ තොරතුරු, නැවත ලබා දෙන සූත්‍රිකා විදුලි බුබුලු හා බෙදා හරින ලද LED පිලිබඳ තොරතුරු එකතුකිරීම, ඇගයීම, බලශක්ති ඉතිරිය ගණනය කිරීම, නිවැරදිව ක්‍රියාත්මක නොවන LED ලාම්පු ප්‍රතිස්ථාපනය කිරීම හා පශ්වාත් ඇගයීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා ඇන්ඩ්‍රොයිඩ් මෘදුකාංගය හා Web based dashboard නිර්මාණය කිරීම ආරම්භ කර ඇත.
හරිත ගොඩනැගිලි	බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා සංශෝධිත නීති සංග්‍රහය අනුව 2018 වර්ෂයේ ඉක්මණින් ක්‍රියාත්මක

	කිරීම සඳහා සම්පූර්ණ වැඩපිළිවෙලක් සකස් කරන ලදී. තෝරාගත් රජයේ ගොඩනැගිලි වල වහලය මත සූර්ය පැනල ස්ථාපනය සඳහා රුපියල් මිලියන 350 ක මුදලක් උපයෝජනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ඇති අතර භූගෝලීය කාණ්ඩ හතක් සඳහා සේවා සැපයුම් ආයතන හතරක් සම්බන්ධ කරගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කරන ලදි.
සුහුරු නිවාස	"ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති නිවාස සඳහා වන මාර්ගෝපදේශය" භාෂා තුනෙන්ම පූර්ව මුද්‍රණ මට්ටම දක්වා සකස් කරන ලදී. සූර්යබල සංග්‍රාමය වැඩසටහන ප්‍රචලිත කිරීම සඳහා පොලි අනුපාත පහල දමන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 1,500 ක් භාවිතා කරන ලදී. 2017 අවසන් වන විට බැංකු 12 ක් මගින් ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.
වෙනත් 1 පාසල් චිත්‍ර තරඟය	✓ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් (කලාවිද්‍යා) දැනුවත් කිරීම / තොරතුරු රැස් කිරීමේ වැඩ සටහන 2017 මාර්තු මස 29 වන දින පවත්වන ලදි. ✓ තරඟාවලියේ ජයග්‍රාහකයින් තෝරා අවසන් කර ඇත. ✓ 2017 සැප්තැම්බර් 21 වන දින ප්‍රදර්ශනය හා සම්මාන ප්‍රදානය සිදු කරන ලදී.
2 විශ්ව විද්‍යාල සඳහා බලශක්ති ඉල්ලුම කළමනාකරණ විෂයමාලා සංවර්ධනය කිරීම	✓ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සඳහා වැඩසටහන 2017 සැප්තැම්බර් 08 දින පවත්වන ලදී.

	හඳුනාගෙන ඇති බලශක්ති කාර්යක්ෂමතා තාක්ෂණයන් 9ක් යටතේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් පහත දැක්වෙන පරිදි 2020 වන විට ඉතිරි කර ගත හැකි බලශක්ති ප්‍රමාණය පහත වගුවේ දැක්වේ.

අංකය	**තාක්ෂණය**	**2020 වන විට වාර්ෂික බලශක්ති ඉතිරිය (GWh)**
1	කාර්යක්ෂම වායු සමීකරණ	84
2	කාර්යක්ෂම ආලෝකකරණය	250
3	කාර්යක්ෂම ශීතකරණ	161
4	කාර්යක්ෂම සිසිලක	41
5	කාර්යක්ෂම මෝටර	86
6	සූත්‍රිකා ලාම්පු ඉවත් කිරීම	139
7	කාර්යක්ෂම විදුලි පංකා	298
8	හරිත ගොඩනැගිලි	43
9	සුහුරු නිවාස	139
එකතුව		**1, 243**

	තිරසාර බලශක්ති ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සංවර්ධනය (SAFE යටතේ)
1	<u>බලශක්ති තොරතුරු විශ්ලේෂණය</u> ✓ ශ්‍රී ලංකා බලශක්ති තුලනය 2016 සකස් කර ඇති අතර, එය මුද්‍රණය වෙමින් පවතී. 2016 දත්ත වෙබ් අඩවියට ඇතුලත් කර ඇත. ✓ අවසන් පරිභෝගිකයින් විසින් බලශක්තිය භාවිතා කරන අන්දම අධ්‍යයනය කිරීම. මේ යටතේ දිවයින පුරා ඉන්ධන පිරවුම්හල්වල සමීක්ෂණය සඳහා සැලැස්ම ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ සකස් කර ඇත.
2	<u>තිරසාර බලශක්ති තාක්ෂණ සංවර්ධනය</u> - සූර්ය බලශක්ති විදුලි ජනනය මහා පරිමාණයෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වසර 2 ක සංකීර්ණ තාක්ෂණික ව්‍යාපෘතිය යටතේ ප්‍රථම වසරේ වැඩ කටයුතු සාර්ථකව නිම කරන ලදි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විදුලි ඉංජිනේරු අංශය සමඟ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතියේ අරමුණු පහත පරිදි වේ. - ශ්‍රී ලංකාවේ මහා පරිමාණයෙන් සූර්ය බල ශක්තිය සංවර්ධනය කිරීමේදී ඇතිවිය හැකි

	තාක්ෂණික ගැටළු සඳහා විසඳුම් ලබාදීම. - D. C. ක්ෂුද්‍ර ජාලය මගින් බලශක්තිය කාර්යක්ෂමව යොදා ගැනීම
3	<u>ජාතික බලශක්ති සම්මන්ත්‍රණය</u> ✓ ජාතික බලශක්ති සම්මන්ත්‍රණය 2017 නොවැම්බර් මස 19, 20 දින වල පවත්වන ලදී. බලශක්ති කාර්යක්ෂමතාව සහ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය කිරීම යන තේමා 2 යටතේ පර්යේෂණ ලිපි 25 ක් ඉදිරිපත් කෙරිණි. ප්‍රතිපත්ති සම්පාදකයන්, කර්මාන්තකරුවන් සහ විද්වතුන්ගේ සහභාගීත්වය ඇතිව ජාතික බලශක්ති සම්මන්ත්‍රණය පවත්වන ලද අතර, මෙම ක්ෂේත්‍රවල ජාතික වැඩසටහන් සඳහා පර්යේෂණ හා සංවර්ධන අංශයේ දායකත්වය ලබා ගැනීමට ක්‍රමවේදයන් ද සාකච්ඡාවට ලක් කෙරිණි. ජාතික නවෝද්පාදන සැසියක් පවත්වා ජෛව ස්කන්ධ නව නිර්මාණ ඇගයීමට ලක් කරන ලදි.
	දැනුම් කළමනාකරණ අංශය (SEEK යටතේ)
1	**බලශක්ති අධ්‍යාපන සංවර්ධන වැඩසටහන** ✓ බලශක්ති අධ්‍යාපන වැඩසටහනේ ප්‍රධානතම වැඩසටහන වන්නේ පාසල් බලශක්ති සමාජ වැඩසටහනයි. දිවයින පුරා සෑම පාසලක්ම ආවරණය වන පරිදි බලශක්ති සමාජ 3,000 ක් පිහිටුවා ඇත. ✓ පාසල් බලශක්ති සමාජ සඳහා සම්මාන ප්‍රදානය 2017 දෙසැම්බර් 27 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ✓ නව නිපැයුම්, ව්‍යාපෘති, පර්යේෂණ, සමීක්ෂණ, ඩිජිටල් පෝස්ටර්, කෙටි චිත්‍රපට, නාට්‍ය හා විවාද යන අංශවල දක්ෂතාවයන් පෙන්නුම් කළ සිසුන්ට මුදල් ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කරන ලදී. ✓ පළාත් 9 ආවරණය වන පරිදි රජයේ පාසල් 88 කින් තෝරා ගන්නා ලද 550 දෙනෙකුට සම්මාන ප්‍රදානය සිදු කරන ලදී. එමෙන්ම, වැඩසටහන සඳහා කැපවූ ගුරුවරුන් සහ නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සම්මාන ප්‍රදානය ද සිදු කරන ලදී

2

සන්නිවේදන වැඩසටහන්

- ✓ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවති 'තිරසාර ලංකා' ප්‍රදර්ශනයට සහභාගී විය.
- ✓ පාසැල් ප්‍රදර්ශන 7 සඳහා සහභාගී විය.
- ✓ කැලණිය විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය අංශය විසින් බලශක්ති මාධ්‍යවේදී සම්මාන සඳහා මාර්ගෝපදේශය දැනටමත් සකස් කර ඇති අතර, ඒ සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.
- ✓ පරිසර දින වැඩසටහන කෑගල්ල නගරයේදී පවත්වන ලදී.

BMICH හි දී පවත්වන ලද “තිරසර ලංකා” ප්‍රදර්ශනය

3. 2017 දී ක්‍රියාත්මක කරන ලද පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති

	පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය (REAct යටතේ)
1	සම්පත් වෙන් කිරීම හා සංවර්ධන ක්‍රියාකාරකම් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා තාවකාලික අනුමැතිය ලබා දීම සහ බලශක්ති බලපත්‍රය නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම මගින් 2017 වර්ෂය අවසන් වන විට ජාතික විදුලිබල පද්ධතියට එකතු වූ ධාරිතාවයන් පහත පරිදි වේ.

පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රය	ව්‍යාපෘති ගණන	ස්ථාපිත ධාරිතාව
ජල විදුලිය	**186**	**362.61 MW**
සුළං ශක්තිය	**15**	**128.45 MW**
ජෛව ස්කන්ධ	**10**	**32.6 MW**
සූර්යය විදුලිය	**8**	**51.36 MW**

2	තාක්ෂණ සංවර්ධනය සහ පර්යේෂණ ✓ බලංගොඩ, සීතා එළිය, කලමැටිය, මුල්ලිපුරම, සිලාවතුර, නදුකුඩා, පොන්නාලෙයි, පුනරීන් හා කෝකිලායි ප්‍රදේශවල දත්ත එකතු කිරීම සිදු කරනු ලබයි. ✓ සම්පත් සිතියම්කරණය සිදු වෙමින් පවති. සීතා එළිය, පුත්තලම, සූරියකන්ද, යාපනය සහ පුනරීන් සඳහා දළ සිතියම් පිළියෙල කෙරිණි. ✓ සුළං කුළුණු නඩත්තු කොන්ත්‍රාත්තුව සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.
3	සූර්ය බල සංග්‍රාමය ✓ 2017 අවසන් වන විට පෞද්ගලික සූර්ය විදුලි සේවා සපයන්නන් 296 ක් ලියාපදිංචි කරන ලදී. ✓ " රිවි අරුණ" යටතේ ආගමික ස්ථානවල සූර්ය විදුලි පද්ධති 135 ක් ස්ථාපනය කරන ලද අතර, පද්ධතියට කිලෝවොට් 270 ක් එකතු කරන ලදි. ✓ සූර්ය විදුලි තාක්ෂණය පිළිබඳ ප්‍රමිතීන් 17ක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ ඒකාබද්ධව ප්‍රකාශයට පත් කෙරිණි. තාක්ෂණික වැඩමුළු තුනක් සහ සේවා සපයන්නන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. ✓ මෙම වැඩසටහන යටතේ මෙගාවොට් 100 ක ධාරිතාවේ මං සලකුණ සැමරුම අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රදානත්වයෙන් පවත්වන ලදී.

4 <u>ජාත්‍යන්තර සහයෝගීතා සම්බන්ධ ව්‍යාපෘති</u>

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් අරමුදල් සපයන ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති දෙකක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ආරම්භ කර, ක්‍රියාත්මකවෙමින් පවතී. මෙම ව්‍යාපෘති දෙක පහත දැක්වේ.

1. පියසි මත සූර්ය විදුලි ජනන ව්‍යාපෘතිය
2. විදුලිබල සැපයුම් විරස්ථායීතාවය වැඩි දියුණු කිරීමට සහාය වීමේ ව්‍යාපෘතිය

පියසි මත සූර්ය බලශක්ති විදුලිබල ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්ති උත්පාදනය උත්ප්‍රේරණය කිරීම හා ජනප්‍රිය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල සූර්යබල නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. රාජ්‍ය අංශය

යටතේ මූලිකවම විශ්ව විද්‍යාල වල ඉංජිනේරු පීඨයන් කෙරෙහි අවධානය යොමු කරයි. මෙම ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- ✓ පේරාදෙණිය විශ්ව විද්‍යාලය,මොරටුව විශ්ව විද්‍යාලය, රුහුණු විශ්ව විද්‍යාලය සහ යාපනය විශ්ව විද්‍යාලය යන විශ්ව විද්‍යාලවල ඉංජිනේරු පීඨ ගොඩනැඟිලිවල පියසි මත සූර්ය විදුලි පද්ධති 4 ක් ස්ථාපනය කිරීම මගින් ජාතික විදුලිබල පද්ධතියට කි.වො. 200 ක් එක්කිරීම.
- ✓ පෞද්ගලික අංශයේ තෝරාගත් ආයතන 22 ක සූර්යබල පද්ධති ස්ථාපනය කිරීම මඟින් ජාතික විදුලිබල පද්ධතියට කි. වො. 1800 ක් එක් කිරීම.

විදුලිබල සැපයුමේ චිරස්ථායීතාවය වැඩි දියුණු කිරීමට සහාය වීමේ ව්‍යාපෘතිය

- ✓ මෙම ව්‍යාපෘතිය මඟින් මූලික වශයෙන්ම උතුරු පළාතේ හඳුනාගත් දූපත් 3 ක ජීවත්වන ජනතාවගේ ජන ජීවිතය වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වේ. ඔවුන්ව ඵලදායී විදුලි පරිභෝජනය පිළිබඳ දැනුවත් කිරීම හා කාන්තාවන් සඳහා ජීවනෝපාය හඳුන්වා දීම ප්‍රධාන වේ.

UNDP/ GEF/ FAO විසින් අරමුදල් සම්බන්ධ ව්‍යාපෘති යටතේ "තිරසාර ජෛව ස්කන්ධ බලශක්ති නිෂ්පාදනය සහ නවීන ජෛව බලශක්ති තාක්ෂණ ප්‍රවර්ධනය" සහ "ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදන හා පරිභෝජන ක්ෂේත්‍ර තුළ කාබන් විමෝචන අඩුකිරීමේ ක්‍රියාමාර්ගයන්" යන ව්‍යාපෘති ක්‍රියාත්මක වේ. එම ව්‍යාපෘති යටතේ පහත ක්‍රියාකාරකම් අවසන් කර ඇත.

තිරසාර ජෛව ස්කන්ධ බලශක්ති නිෂ්පාදනය හා නවීන ජෛව බලශක්ති තාක්ෂණ ප්‍රවර්ධනය

- ✓ මෙම ව්‍යාපෘතිය යටතේ 2017 දී හෝමාගම ජෛව ස්කන්ධ සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කෙරුණි. මොණරාගල හා කුරුණෑගල ප්‍රදේශ වල තවත් එවැනි සැකසුම් මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කිරීම සඳහා වැඩ ආරම්භ කරන ලදි. මහා පරිමාණ කර්මාන්ත හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළ ජෛව ස්කන්ධ භාවිතය සම්බන්ධව බලශක්ති ව්‍යාපෘති 24 ක් නිම කෙරිණි.
- ✓ බිම් මට්ටමේ දැව ඉන්ධන වගා කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉන්ධන වගා අත්පොත ප්‍රකාශයට පත් කෙරිණි.
- ✓ හෙක්ටයාර 600 ක් තුළ පොල් වගා කිරීමේ මණ්ඩලය සමඟ ඉන්ධන වගාව සඳහා මූලික කටයුතු සිදු කරන ලදී.
- ✓ තේ කර්මාන්තශාලා නිලධාරින් සඳහා ජෛව ස්කන්ධ පිළිබඳ දින 3ක පුහුණු වැඩ සටහනක් ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකාව තුළ බලශක්ති උත්පාදනය හා අවසන් භාවිතයේ විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් (NAMA) ව්‍යාපෘතිය

තේ කර්මාන්තශාලා සඳහා කාර්යක්ෂම මෝටර් සවිකිරීම, සූර්ය විදුලි නෙට් මීටරින් හා ජීව වායු පද්ධති හඳුන්වාදීම නියමු ව්‍යාපෘති මේ යටතේ ක්‍රියාත්මක කෙරිණි.

බලශක්ති ක්ෂේත්‍රය සඳහා තාක්ෂණ විශේෂිත විමෝචන පිරිවැය වක්‍රය (MAC Curve) නිර්මාණය කරන ලද අතර එය බලශක්ති පාර්ශවකරුවන් වෙත වැඩමුළු හරහා බෙදාහරින ලදී. බලශක්ති ක්ෂේත්‍රයේ NAMA මැදිහත් වීම් තුළ බහු-නිර්ණායක විශ්ලේෂණය සහ බාධක විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදි. තේ කර්මාන්ත ශාලාවල සඳහා සංඛ්‍යාත විචල්‍යක පද්ධති (VFDs) ස්ථාපනය කිරීම සිදුකරන ලදී. ජීව වායු ඒකක 40 ක් ස්ථාපනය කරන ලදී.

ජීව වායු ඒකක ස්ථාපනය කිරීම සම්බන්ධ තත්ත්ව පාලනය පිළිබඳ වැඩමුළු පහක් පළාත් සභා වල පැවැත්විණි.

5 <u>බලශක්ති උද්‍යාන සංවර්ධනය</u>

භූ-දේශගුණික තත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් කිහිපයක නොමඳ ආශිර්වාදය ලබා ඇත. ශ්‍රී ලංකාව සමකය තීරුවේ පිහිටා ඇති බැවින් වසර පුරා සූර්ය විකිරණ සැපයුමක් පවතී. එමෙන්ම, නිවර්තන කලාපීය උෂ්ණත්ව තත්වයන් සහ ඉන්දියන් සාගරයේ දූපතක් ලෙස පිහිටීම මත, ශ්‍රී ලංකාව සුළං බලයෙන් ආඩ්‍ය වී තිබේ. මෙම පසුබිම, ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්ති සම්පත් වලින් සපිරි රටක් වීමට හේතු වී තිබේ. සූර්ය බලශක්ති සම්පත් සම්බන්ධ සිතියම පසුගිය කාලවලදී එළිදක්වා ඇති අතර, සුළං බලශක්ති සම්පත් සිතියම්ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. සුළං බලශක්ති සම්පත් සම්බන්ධව සැලකීමේදී 2003 වර්ෂයේ දී ජාතික පුනර්ජනනීය බලශක්ති රසායනාගාරය (NREL) මඟින් චන්ද්‍රිකා දත්ත ඇසුරින් සම්පාදනය කරන ලද සුළං බලශක්ති සම්පත් සිතියම මඟින්, වයඹ වෙරළබඩ කලාපයේ

කල්පිටිය අර්ධද්වීපයේ සිට මන්නාරම් දූපත් වලට සහ යාපනය අර්ධද්වීපය දක්වා විශිෂ්ට සුළං සම්පත් සහිත පෙදෙස් හඳුනාගෙන ඇත. එම ප්‍රදේශ ආශ්‍රිතව මිනුම් කටයුතු සිදු කරගෙන යන අතර, එම ක්ෂේත්‍ර දත්ත භාවිතයෙන් සකස් කරනු ලබන සිතියම ඉදිරි වසර තුළ සම්පාදනය කෙරෙනු ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ඉහළ සුළං බලශක්ති විභවයක් සහිත ප්‍රදේශ වර්ග කිලෝ මීටර් 5,000 ක පමණ ප්‍රදේශයක් පවතින බව ඇස්තමේන්තු කර ඇත.

ඉහළ මට්ටමේ සූර්ය සහ සුළං විභවයක් සහිත ප්‍රදේශ "බලශක්ති උද්‍යාන" ලෙස සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇති අතර, ඒ හරහා බලශක්ති සම්පත් සතු ආර්ථික වටිනාකම වඩාත් ප්‍රශස්ථ මට්ටමින් උකහා ගැනීමට කටයුතු කෙරේ. මෙම තත්ත්වය තුළ සම්පත් ඇගයීම, ඉඩම් අත්පත් කර ගැනීම, පාරිසරික සහ අනෙකුත් ව්‍යවස්ථාපිත නිශ්කාශනයන් ලබා ගැනීම සහ යටිතල පහසුකම් ගොඩනැගීම රජය මගින් සිදු කරනු ලබන අතර, ඒ හරහා වඩාත් තරඟකාරී මිල ගණන්වලටම ජාත්‍යන්තර මට්ටමේ ආයෝජකයින් ව්‍යාපෘති සඳහා ආකර්ශණය කර ගැනීමට කටයුතු කෙරේ.

පුනරීන් සුළං සහ සූර්ය බලශක්ති උද්‍යානය

ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ බලශක්ති උද්‍යානය ලෙස පුනරීන් සුළං සහ සූර්ය බලශක්ති උද්‍යානය සංවර්ධනය කිරීමේ වැඩ කටයුතු ආරම්භ කෙරිණි. ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් කමිටුවක් පත් කරන ලද අතර මෙහෙයුම් කමිටුවේ පළමු රැස්වීම 2017 නොවැම්බර් 30 වැනි දින පවත්වන ලදී. ව්‍යාපෘතිය සම්බන්ධ මැණුම් කටුයුතු ආරම්භ කර ඇති අතර, පහත දැක්වෙන භූමි ප්‍රදේශ මැනුම් කෙරෙමින් පවතී.

1) පුනරීන් භූමියේ නැගෙනහිර හා බටහිර වෙරළ තීරය දිගේ මීටර් 200 ක් සුළං විභවය සහිත පළල වෙරළ තීරයක්
2) යෝජිත 2 X 100 MWසූර්ය බලාගාර සඳහා අවශ්‍ය භූමි ප්‍රමාණය

	 ව්‍යාපෘතියට අදාළ පරිසර ඇගයීම් කටයුතු සම්බන්ධ මධ්‍යම පරිසර අධිකාරිය සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. මෙම සාකච්ඡා අවසානයේදී ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනයකට අදාළ නිර්දේශිත අවශ්‍යතාවයන් (Terms of Reference) මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත් කරනු ඇත.

4. නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කළ යුතු නව ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා උපාය මාර්ගයන් හා අනෙකුත් ප්‍රතිපත්ති වලට අනුව ශ්‍රී ලංකාව ප්‍රධාන බලශක්ති ප්‍රවාහය ලෙස ෆොසිල ඉන්ධන වෙනුවට පුනර්ජනනීය බලශක්ති පරිවර්තනයක් කරා ගමන් කරයි. 2050 වන විට ශ්‍රී ලංකාව කාබන් විමෝචනයෙන් තොර රටක් බවට පත්කිරීමට පහත දැක්වෙන වැදගත් ඉලක්ක අනුගමනය කරයි.

සන්ධිස්ථානය	කාල නියමය	තත්ත්වය
ජාලගත විදුලි ජනනයේ 10% ක් නව පුනර්ජනනීය බලශක්ති මගින් ජනනය කිරීම	2016	සැලසුමට වඩා අවුරුද්දක් ඉදිරියෙන් ළගා විය.
නව පුනර්ජනනීය බලශක්තියෙන් (NRE) 20% ක් විදුලිය ජනනය කිරීම.	2020	කඩිනම් වැඩසටහන් දියත් කොට ඇත.
2010 වසරේ පැවති පරිභෝජනයන් 20% ක බලශක්ති ඉතිරියක් ලඟා කර ගැනීම	2020	2017 දී පත් කරන ලද ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් මේ සඳහා දිගුකාලීන වැඩසටහන් 9 ක් දියත් කරන ලදී.
2040 දී පොසිල ඉන්ධන සහිත වාහන භාවිතයෙන් ඉවත් කිරීම	2040	ප්‍රතිපත්ති තීරණ ගෙන ඇත.
පියැසි සූර්ය විදුලි පද්ධති මඟින් මෙගාවොට් 200 ක් ජාලගත කිරීම	2020	මෙගාවොට් 100 ක් ස්ථාපනය කර ඇත.

5. වෙනත් ප්‍රධාන සංවර්ධනයන්

අපේක්ෂිත බලශක්ති සංක්‍රාන්තිය සාක්ෂාත් කර ගැනීම සඳහා ඉදිරි වසර වලදී පහසුකම්, පද්ධති සහ මානව සම්පත් ක්ෂේත්‍රවල සැලකිය යුතු ආයෝජනයන් සිදු කළ යුතු වේ. පොසිල ඉන්ධන ආනයනය සඳහා සෙස් බද්දක් හඳුන්වා දීම හා රාජ්‍ය භාගය අය කර ගැනීම හරහා අරමුදල් සම්පාදනය කිරීමට අපේක්ෂිතය. තිරසාර බලශක්ති අංශය සඳහා අපේක්ෂිත අරමුදල් පහත පරිදි සාරාංශ කර ඇත.

පොසිල ඉන්ධන ආනයන සඳහා ගිගා ජූලයක් සඳහා ශත එකක සෙස් බද්දක් අය කිරීම මඟින් ළඟා කරගත හැකි අරමුදල් ප්‍රමාණය පහත දැක්වේ.

ඉන්ධන	ඒකකයක් සඳහා මුදල	වසර 2016 දී ආනයන සඳහා ලැබිය යුතු මුදල රු. මිලියන *
පෙට්‍රල්	ලීටරයට ශත 34	330
ඔටෝ ඩීසල්	ලීටරයට ශත 38	696
එල්. පී. ගෑස්	කි. ග්‍රෑමයට ශත 44	153
ගල් අඟුරු	කි. ග්‍රෑමයට ශත 24	577
බොර තෙල්	කි. ග්‍රෑමයට ශත 43	727
මුළු වටිනාකම		**2, 483**

*2016 වර්ෂය සඳහා සැබෑ ආනයන ප්‍රමාණය මත පදනම්ව

පුනර්ජනනීය බලශක්ති විදුලි ජනනය කිලෝ වොට් පැය එකක් සඳහා ලබාගත යුතු රාජ්‍ය භාගය ශත 15 ක් නම් ළඟා කළ හැකි අරමුදල් ප්‍රමාණය පහත දැක්වේ.

බලශක්ති මූලාශ්‍රය	අවුරුදු 15+ ක කාලයක් සඳහා ධාරිතාවය (MW)	අපේක්ෂිත උත්පාදනය (GWh / yr)	රාජ්‍ය භාගය (රුපියල් මිලියන)
ජෛව ස්කන්ධ	-	-	-
විශාල ජල විදුලි බලාගාර	1, 227.00	3, 536.69*	1, 768.35
කුඩා ජල විදුලි බලාගාර	31.24	115.67	57.84
සූර්යය	-	-	-
සුළං විදුලිය	3.00	8.41	4.21
මුළු වටිනාකම		3, 660.77	1, 830.39

*සටහන - 2000 - 2016 සාමාන්‍ය ජනනය පදනම්ව

6. අපේක්ෂා සහ ගැටළු

ප්‍රාථමික බලශක්ති සැපයුමේ හා බලශක්ති උත්පාදනයෙහි පුනර්ජනනීය බලශක්තියෙහි දායකත්වය ආරක්ෂා කිරීම පමණක් නොව, එය තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවට හැකියාව තිබේ. කෙසේ වෙතත්, ජාතික සම්ප්‍රේෂණ ජාලයේ තාක්ෂණික ධාරිතාවයන් සම්බන්ධ ගැටළු, නීතිමය බාධාවන් හා සාමාජීය කරුණු නිසා 2012 වසරේ සිට පුනර්ජනනීය බලශක්ති කර්මාන්තයට බාධක වලට මුහුණ දීමට සිදු වී ඇත.

බොහෝ සමාජ-දේශපාලන හේතු නිසා පසුගිය වසර කිහිපය තුළ කුඩා ජල විදුලි ව්‍යාපෘති සඳහා මහජන විරුද්ධත්වය වැඩිවීම නිසා රටේ බොහෝ ප්‍රදේශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපහසු විය. මෙම බාධාවන් හේතුවෙන් සංවර්ධකයින් විසින් අත් විඳින ලද දීර්ඝ ප්‍රමාදයන් හා ලබා දුන් බලපත්‍ර අවලංගුවීම වැනි හේතූන් නිසා ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් අක්‍රිය තත්වයේ පවතී.

එසේම 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතට ඉදිරිපත් කරන ලද සංශෝධනය, කුඩා විදුලි බලාගාර සහ පියසි මත සූර්යබල පද්ධති ඇතුළුව ඕනෑම පාර්ශවයකින් විදුලිය ලබා ගැනීම සඳහා තරඟකාරී ලංසු කැඳවීම සිදුකළ යුතු වේ. මෙම බාධක ජය ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් සුළං බලශක්ති ව්‍යාපාති දෙකක් සහ සූර්ය බලශක්ති ව්‍යාපෘති දෙකක් (10 MW ධාරිතාවය සහිත) සඳහා තරඟකාරී ලංසු කැඳවීම සිදු කර ඇත. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා ගැනීම ඉතාමත් අපහසු වී ඇති අතර, ක්‍රියාත්මක කිරීමේදී දීර්ඝ ප්‍රමාදයන් ඇති වීමට හේතු වී ඇත.

60 X 1 MW සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා ලංසු කැඳවීම ආයෝජක ප්‍රජාව අතර බහුලව පැතිරී ඇති අතර ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ සංකීර්ණතාව නිසා, කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා අපේක්ෂා කළාට වඩා දිගු කාලයක් ගත විය.

සම්ප්‍රේෂණ පද්ධතිය සංවර්ධනය සඳහා ආයෝජනයන් සහ තිරසාර බලශක්ති සංවර්ධන ආයෝජන සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සඳහා අඩු පිරිවැය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වහාම පියවර ගත යුතුව ඇත. මිලදී ගැනීමේ දී මිල තීරණයට බලපාන නීතිමය ගැටළු විසඳීම හා ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා හිතකර සමාජ-දේශපාලන වාතාවරණයක් සම්පාදනය නොකර අනාගතයේදී විශාල සංවර්ධනයක් සිදු වෙතැයි අපේක්ෂා කළ නොහැක.

7. 2018 න් ඔබ්බට සැලසුම්

බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ සංරක්ෂණය පෙරමුණු කර ගනිමින්, 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ ඇති විධිවිධාන හරහා, ගොඩනැඟිලි අංශය හා කර්මාන්ත අංශය ඉලක්ක කර අනිවාර්ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මෙම වැඩසටහන් හරහා නව කාර්යසාධනය පදනම් කරගත් බලශක්ති කාර්යක්ෂමතා සංග්‍රහය (building

code) වාණිජ ගොඩනැඟිලි සඳහා අනිවාර්ය පදනමක් මත ක්‍රියාත්මක කිරීම හා ස්වේච්ඡාවෙන් අනුගත කිරිමේ පදනම මත තිරසාර නිවාස සඳහා මාර්ගෝපදේශයක් හඳුන්වා දීම සිදුවනු ඇත.

ගොඩනැඟිලි ඉලක්ක කරගත් මෙම වැඩසටහන් හැරුණු විට මහා පරිමාණ කර්මාන්ත අංශය ඉලක්ක කරගත් අනිවාර්ය බලශක්ති කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ඇත. මෙම වැඩපිළිවෙල සඳහා නියමිත කර්මාන්තශාලා හා ගොඩනැඟිලි කලින් නියම කරන ලද කාල පරාසයන් තුළ බලශක්ති කාර්යක්ෂමතාව සම්බන්ධව ඇගයීමට ලක් කිරීම සහ වැඩි දියුණු කිරීමේ සැලසුම් ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

ලංකා විදුලිබල මණ්ඩලය සමඟ දිගු කාලීන සංවාදයකින් පසුව නැවත පුනර්ජනනීය බලශක්තිය සඳහා සැලකිය යුතු ආරම්භයක් ලබා ගන්නා ලද්දේ නව පුනර්ජනනීය බලශක්තියෙහි භූමිකාව පුළුල් කිරීම අරමුණු කර ගනිමින් 2020 වන විට 20% ක් පමණ NRE මඟින් ජනනය කිරීමට ඇති හැකියාව පුළුල් කිරීම සඳහාය. මෙය ශ්‍රී ලංකාව 2050 වන විට කාබන් උදාසීන රටක් බවට පත් කිරීමට ජාතික බලශක්ති ප්‍රතිපත්ති හා උපායමාර්ග යෝජනා කෙටුම්පතට අනුව, පොසිල ඉන්ධන පදනම් කරගත් බලශක්ති පද්ධතියක් පුනර්ජනනීය බලශක්තිය පදනම් කරගත් පද්ධතියකට පරිවර්තනය කිරිමේ මූලික පියවරක් වනු ඇත. එකතු කිරීමට අපේක්ෂිත ධාරිතාව, අවශ්‍ය කරන ආයෝජන සහ එක් එක් තාක්ෂණයන්ගෙන් ලබා ගත හැකි ශක්තිය පහත දක්වා ඇත.

තාක්ෂණ	ධාරිතාව (MW)	බලශක්තිය(GWh/ වසර)	ආයෝජන (LKRB)
කුඩා ජල විදුලිය	95	349	22
ජෛව ස්කන්ධ	40	280	18
සුළං	654	2,124	145
සූර්ය	678	1,194	106
මුළු වටිනාකම	1,467	3,949	292

රුපියල් බිලියන 300 ක් පමණ වන මෙම ආයෝජනයන් යථාර්තයක් බවට පත්කිරීම සඳහා රජයට ඉදිරි දශකය තුළ යටිතල පහසුකම් (සම්ප්‍රේෂණ හැර) සහ පද්ධති සංවර්ධනයට ආසන්න වශයෙන් රුපියල් බිලියන 30 ක පමණ වියදමක් දැරීමට සිදුවනු ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශය
(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)

	සටහන	2017	2016
ආදායම			
මෙහෙයුම් ආදායම්	**2**	295,154,682.92	341,238,731
මෙහෙයුම් නොවන ආදායම්	**3**	270,591,538.80	103,869,179
මුළු ආදායම්		**565,746,221.73**	**445,107,910**
වියදම්			
ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් ආදායම්	**4**		
පුනර්ජනනීය බලශක්ති	**4.1**	227,448,436.01	105,639,464
බලශක්ති කළමනාකරණ	**4.2**	16,485,744.59	26,543,131
දැනුම් කළමනාකරණ	**4.3**	20,506,781.98	26,659,199
උපක්‍රමික ක්‍රියාකාරකම්	**4.4**	4,856,913.07	7,618,652
		269,297,875.65	**166,460,446**
පුනරාවර්තන වියදම්	**5**		
වැටුප් හා දීමනා	**5.1**	89,676,107.49	89,359,231
ගමන් වියදම් හා සංයුක්ත දීමනා	**5.2**	1,439,234.15	1,553,237
සැපයුම්	**5.3**	4,418,297.51	4,472,982
නඩත්තු වියදම්	**5.4**	8,486,841.87	8,583,142
කොන්ත්‍රාත් සේවා	**5.5**	35,339,902.55	35,931,662
ක්ෂය වියදම්	**5.6**	92,808,653.51	123,361,618
වෙනත් පුනරාවර්තන වියදම්	**5.7**	12,577,013.87	8,921,899
		244,746,050.95	**272,183,771**
මුළු වියදම්		**514,043,926.60**	**438,644,217**
අතිරික්තය/ ඌණය		**51,702,295.13**	**6,463,693**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ඒ වෙනුවෙන්

....	....	....
අධ්‍යක්ෂ (මූල්‍ය)	**අධ්‍යක්ෂ ජනරාල්**	**සභාපති**

“පිටු අංක 5 සිට 09 හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 09 හි දක්වා ඇති ගිණුම්කරණ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්ගේම අභ්‍යන්තර උපුටා දැක්වීමකි. මෙම මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය සාමූහිකව වගකිව යුතුය.
මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන්ගේ අත්සන් පහත පරිදි දක්වා ඇත."

අධ්‍යක්ෂකගේ නම	**අත්සන**
1 එස්. තර්ෂන්	
2 මාලනී කුමාරිහාමි	

01

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)

	Note	2017	2016 Restated
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	9		
නිදහස් වත්කම්	9.1	877,417,702.70	861,825,491
කල්බදුමය වත්කම්	9.2	42,035,080.08	43,563,628
අස්පෘෂ්‍ය වත්කම්	10	4,969,259.80	6,631,346
නොනිමි කාර්යය	11	35,699,243.00	19,885,854
ආයෝජන	12	84,907,163.74	77,770,893
ණය ආපසු ලබාගැනීම	13	49,780,000.50	51,327,709
මුළු ජංගම නොවන වත්කම්		**1,094,808,449.83**	**1,061,004,921**
ජංගම වත්කම්			
ලැබීමට නියමිත දෑ	14	21,557,401.67	21,201,585
වෙනත් ජංගම වත්කම්	15	37,990,919.21	46,952,362
මුදල් හා මුදල්වලට සමාන දෑ	16	392,179,336.96	346,032,869
මුළු ජංගම වත්කම්		**451,727,657.84**	**414,186,816**
මුළු වත්කම්		**1,546,536,107.66**	**1,475,191,737**
හිමිකම් හා බැරකම්			
හිමිකම්			
සමුච්චිත අරමුදල	17	22,100,336.00	22,100,336
අතිරික්තය/ හිඟය		99,679,846.55	85,482,536
විලම්භිත ප්‍රදාන	18	809,739,764.08	881,213,250
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	20	318,204,589.88	288,663,394
සුනිත්‍ය ඇප අරමුදල		89,899,766.70	81,935,978
ප්‍රත්‍යාගණන සංචිත		101,217,000.00	-
මුළු හිමිකම්		**1,440,841,303.21**	**1,359,395,494**
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික බැරකම්		20,213,314.36	16,844,582
ADB ණය (L 2892 SRI)		49,780,000.50	36,447,709
ADB ණය (L 2733 SRI)		2,020,356.00	16,900,356
මුළු ජං ජංගම නොවන වගකීම්		**72,013,670.86**	**70,192,647**
ජංගම බැ වගකීම්			
වෙනත් ගෙවීමට ඇති දෑ	19	28,631,649.21	40,773,862
ශුද්ධ තැන්පතුව - ඉඩම් අත්පත් කර ගැනීම		5,049,485.00	4,829,735
මුළු ජං ජංගම වගකීම්		**33,681,134.21**	**45,603,597**
හිමිකම් හා බැරකම් මුළු ප්‍රමාණය		**1,546,536,108.28**	**1,475,191,737**

පිටු අංක 5 සිට 21 දක්වා සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කොටසකි.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සම කොටස් වෙනස් වීමේ ප්‍රකාශය

(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)

විස්තරය	සංචිත අරමුදල	ශුද්ධ අතිරික්තය/ හිඟය	විලම්භිත ප්‍රදාන	ප්‍රත්‍යාගණන ශේෂය	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	සුනිත්‍ය ඇප අරමුදල	එකතුව
2016.01.01 දිනට ශේෂය	**22,100,336**	**88,848,196**	**985,822,817**	**-**	**205,446,714**	**76,591,020**	**1,378,809,083**
වැඩිවීම/ අඩුවීම - 2016 වසරේ	-	6,463,693	(104,609,567)	-	87,810,523	5,344,958	**(4,990,393)**
පෙර වසරේ ගැලපුම	-	(879,123)	-	-	-	-	**(879,123)**
පාඩු හා අලාභ	-	(157,454)	-	-	-	-	**(157,454)**
2016.12.31 දිනට ශේෂය	**22,100,336**	**94,275,312**	**881,213,250**	**-**	**293,257,237**	**81,935,978**	**1,372,782,113**
පෙර වසරේ ගැලපුම	-	(8,792,776)	-	-	(4,593,843)	-	**(13,386,619)**
2017.01.01 දිනට ප්‍රති ප්‍රකාශිත ශේෂය	**22,100,336**	**85,482,536**	**881,213,250**	**-**	**288,663,394**	**81,935,978**	**1,359,395,494**
වැඩිවීම/ අඩුවීම - 2017 වසරේ	-	51,702,295.13	(71,473,485.42)	-	-	-	**(19,771,190.29)**
සුනිත්‍ය ඇප අරමුදලට මාරු කිරීම්	-	(7,963,788.70)	-	-	-	7,963,788.70	-
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලට මාරු කිරී	-	(29,541,195.88)	-	-	29,541,195.88	-	-
ඉඩම් ප්‍රත්‍යාගණන	-	-	-	101,217,000.00	-	-	**101,217,000.00**
2017.12.31 දිනට ශේෂය	**22,100,336.00**	**99,679,846.55**	**809,739,764.08**	**101,217,000.00**	**318,204,589.88**	**89,899,766.70**	**1,440,841,303.21**

පිටු අංක 5 සිට 21 දක්වා සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කොටසකි.

03

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)

	සටහන	2017	2016 (Restated)
මුදල් ප්‍රවාහය - මෙහෙයුම් ක්‍රියාකාරකම්			
කාලසීමාවේ අතිරික්තය/ (හිඟය)		51,702,295.13	5,427,116
ගැලපීම්			
පාඩු හා අලාභ		-	157,454
පොලී ආදායම්	3 , 8	(20,285,998.08)	-
ප්‍රති ප්‍රදාන ක්‍රම ක්ෂය (ලත් අරමුදල් සඳහා)	7	(91,280,105.14)	(123,361,618)
බලශක්ති අරමුදලට මාරු කිරීම්		-	(38,573,814)
සේවා පාරිතෝෂිත ප්‍රතිපාදන		4,265,245.36	5,621,087
පාරිතෝෂිත ගෙවීම්		(896,513.00)	(782,260)
ක්ෂය	5.6	92,808,653.51	123,361,618
කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභාංශ		**36,313,577.78**	**(28,150,417)**
(වැඩිවීම/අඩුවීම) - වෙනත් ජංගම වත්කම්		8,605,626.00	(23,934,085)
(වැඩිවීම/ අඩුවීම) - ජංගම වගකීම්		(11,922,462.61)	2,365,983
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ		**32,996,741.17**	**(49,718,519)**
මුදල් ප්‍රවාහය - ආයෝජන ක්‍රියාකාරකම් වලින්			
දේපල, පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම	9.1	(3,993,230.22)	(5,168,444)
අස්පෘෂ්‍ය වත්කම්		-	(8,345,683)
නොනිමි කාර්යය	11	(15,813,389.00)	(6,141,226)
FD & TB හි ආයෝජන	12	(7,136,270.74)	-
ලද පොලී	3 , 8	20,285,998.08	(3,161,729)
සංවර්ධකයින්ට ණය ලබාදීම්		1,547,708.09	(60,539,709)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(5,109,183.79)**	**(83,356,791)**
මුදල් ප්‍රවාහය - මූල්‍ය ක්‍රියාකාරකම් වලින්			
විලම්බිත ප්‍රදාන	18	19,806,619.08	18,752,051
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල		-	126,384,337
සමුච්චිත අරමුදල		-	-
සුනිත්‍ය ඇප අරමුදල		-	5,344,958
මුදල් නැවත ගෙවීම් - විදේශ ආයෝජකවරුන්		-	62,560,065
ණය ADB (L 2892 SRI)	13	13,332,291.50	-
ණය උපයෝජනය ADB (L 2733 SRI)	13	(14,880,000.00)	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**18,258,910.58**	**213,041,410**
මුදල් හා මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම		**46,146,467.96**	**79,966,100**
මුදල් හා මුදල් වලට සමාන දෑ - කාල සීමාව ආරම්භයේ	16	**346,032,869.00**	**266,066,769**
මුදල් හා මුදල් වලට සමාන දෑ - කාල සීමාව අවසානයේ		**392,179,336.96**	**346,032,869**

5 සහ 21 පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

ගිණුම් සටහන්

2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සංයුක්ත තොරතුරු

1.1 සාමාන්‍යය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (සුබඅ) 2007 වර්ෂයේ ඔක්තෝබර් මස 01 වැනි දින ස්ථාපිත කරන ලදි. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) ගොඩනැගිලි අංක 5 හි ස්ථානගත කර ඇත.

1985 අංක 02 දරණ බලශක්ති සංරක්ෂණ අරමුදල පනත, 2007 අංක 35 දරණ සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මඟින් අවලංගු කර ඇත. 2007 සැප්තැම්බර් මස 30 වැනි දිනට බලශක්ති සංරක්ෂණ අරමුදල සතුවන සියලු වත්කම් සහ බැරකම් 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ස්වයංක්‍රීයව සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ගිණුම් වලට මාරු වී ඇත.

විදුලිබල සහ බලශක්ති අමාත්‍යංශයේ නියෝගය පරිදි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ පැවති ආලෝකකරණය සඳහා වන ප්‍රාදේශීය මධ්‍යස්ථානය (RCL) ලංකා විදුලිබල මණ්ඩලය වෙත මාරු කරන ලදි. ඒ අනුව RCL හි වත්කම්, බැරකම් සහ සේවකයින් 2012 වර්ෂයේ දෙසැම්බර් මස ලංවීම වෙත මාරු කරන ලදි.

1.2 අධිකාරියෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින්, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය කිරීම, බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණය ක්‍රියාවට නැංවීමට සහ රටෙහි බලශක්ති භාවිතය තුළ බලශක්ති සුරක්ෂිතතාවය, විශ්වාසනීයත්වය හා පිරිවැය ඵලදායීතාවය ඇති කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම යන ක්‍රියාවලි සිදු කරනු ලැබේ.

1.3 ආයතනයේ අරමුදල්

2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත අනුව අධිකාරිය විසින් පහත සඳහන් අරමුදල් තුන ක්‍රියාත්මක කරනු ලැබේ.

1.3.1 අධිකාරියේ අරමුදල

මූලික වත්කම් තැන්පතු, බලපත්‍ර ගාස්තු, ණය, බදු හා කුලී සහ පාර්ලිමේන්තුව විසින් අනුමත අනෙකුත් ලැබීම් පවත්වාගෙන යෑම සඳහා අරමුදල ස්ථාපනය කර ඇත. තවද, බලශක්ති අධිකාරී පනතේ කාර්ය භාරය ඉටු කිරීමේ දී දැරිය යුතු ගෙවීම් සිදු කිරීම ද මෙමඟින් සිදු කෙරේ.

1.3.2 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල

කාබන් වත්කම් කළමනාකරණය, අයදුම්පත් ගාස්තු, ව්‍යාපෘති ඉඩම්වලට අදාල බදු මුදල්, වෘත්තීමය සේවා මඟින් ලැබෙන ගාස්තු, රාජ්‍ය භාගය හා සෙස් බදු මඟින් ලැබෙන අරමුදල් සම්බන්ධ තැන්පත් පවත්වා ගැනීම මෙම ගිණුම යටතේ සිදු කෙරේ.

පුනර්ජනනීය බලශක්ති විදුලි බලාගාර සඳහා ලබා දෙන සහනාධාර, බලශක්ති කාර්යක්ෂම උපකරණ හා තාක්ෂණයන් ,තාප බලශක්ති පද්ධතිවල විකල්ප ඉන්ධන භාවිතයන්, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ග්‍රාමීය බලශක්ති සේවා සඳහා දිරිදීමනා ලබා දීම සම්බන්ධව ගෙවීම් මෙම අරමුදල මගින් සිදු කළ හැකිය.

1.3.3 සුනිත්‍ය ඇප අරමුදල

බලශක්ති කාර්යක්ෂම ව්‍යාපෘති සඳහා ණය පහසුකම් ලබා ගන්නා ආයෝජකයන් හට ඇප භාරයක් නිකුත් කිරීම සඳහා මෙම අරමුදල භාවිතා කරයි. මේ සඳහා ඒකාබද්ධ අරමුදලින් මූලික වශයෙන් ලැබිය යුතු ප්‍රදානයන් සහ ඇප මුදල් සඳහා ලැබෙන වාර්ෂික ගෙවීම් හා පොලී මුදල් මේ සඳහා භාවිතා කළ හැක.

1.4 සේවක සංඛ්‍යාව

2017.12.31 වැනි දිනට සේවක සංඛ්‍යාව - 103

2.1 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය

2.1.1 සකස් කිරීමේ පදනම අනුකූල වීමේ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව 2017 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය (Equity) වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සකස් කර ඇත.

ශ්‍රී.ල.සු.බ.අ හී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනමින් සකස් කර ඇත. අවශ්‍ය තැන් වලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති පසු සටහන් වල අනාවරණය කර ඇත.

2.1.2 සංසන්දනාත්මක සංඛ්‍යා

වර්තමාන මූල්‍ය වර්ෂයෙහි වෙනස්කම් සඳහා අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා සඳහා ගැලපීම් සිදු කර ඇත. සටහන් අංක 24 ට අනුව 2016 වර්ෂය සඳහා සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශයට පත් කර ඇත.

2.2.1 රජයේ ප්‍රදානයන් සඳහා ගිණුම් තැබීම සහ රජයේ සහාය අනාවරණය කිරීම

රජයේ ප්‍රදානයන් ප්‍රාග්ධන ප්‍රදාන සහ පුනරාවර්තන ප්‍රදාන ලෙස කාණ්ඩ දෙකකට බෙදා වෙන් කරනු ලැබේ. පුනරාවර්තන වියදම්, කාර්ය මණ්ඩල වැටුප්, ගොඩනැගිලි කුලී ආදී වියදම් පියවීම සඳහා යොදා ගනු ලැබේ. ප්‍රාග්ධන ප්‍රදාන ව්‍යාපෘති/ වැඩසටහන් වියදම් සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලැබේ. ව්‍යාපෘති වියදම් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වලින් සමන්විත වන බැවින් එම වියදම් ප්‍රාග්ධන ප්‍රදාන වලින් දරනු ලැබේ.

වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය ඔස්සේ ක්‍රමානුකූල සහ තර්කාන්විත පදනමින් හඳුනාගනු ලබන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස සලකනු ලැබේ.

ව්‍යාපෘති වියදම් සඳහා ප්‍රදානය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ශීර්ෂය යටතේ, පුනරාවර්තන ව්‍යාපෘති/ වැඩසටහන් වියදම් හා සම්බන්ධ වන ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි බැරකමක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

2.2.2 විදේශ ආධාරසඳහා ගිණුම් තැබීම

විදේශීය ආධාර ව්‍යාපෘති ගණනාවක් ශ්‍රී.ල.සු.බ.අ විසින් සිදු කරයි. ආසියානු සංවර්ධන බැංකුව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යන ආයතනවලින් ණය සහ ආධාර බොහෝමයක් ලැබී ඇත. කෙසේ වෙතත් සමහර සැපයුම්කරුවන් සඳහා ගෙවීම් සහ ණය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් ඍජුවම කරනු ලබයි. ඒ සඳහා ශ්‍රී.ල.සු.බ.අ විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.ඒවා මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇත.

2.2.3 දීර්ඝ කාලීන ආයෝජන සඳහා ගිණුම් තැබීම

රජයේ භාණ්ඩාගාර බිල්පත් වල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් වල ආයෝජනය සිදු කර ඇත.

2.2.4 ආදායම හඳුනාගැනීම

බලශක්ති බලපත්‍ර ගාස්තු, විදුලිය විකිණීම, පුහුණු පාඨමාලා ගාස්තු, ප්‍රදර්ශන ආදායම, මිණුම් උපකරණ සේවාවන් සඳහා ගාස්තු සහ වෙනත් ආදායම මඟින් ආදායම නියෝජනය වේ.
සුනිත්‍ය ඇප අරමුදලෙහි පොළිය ආදායමක් ලෙස සලකනු ලැබේ. එහි කොටසක් නැවත ආයෝජනය කරන ලද අතර කොටසක් අරමුදල නඩත්තු කිරීම/ ඒ සඳහා ආදායම ඉපැයීමේ පිරිවැය සඳහා පරිභෝජනය කරන ලදි.

2.2.5 අනිශ්චිත බැරකම් සහ අනිශ්චිත වත්කම්

2008 වර්ෂයේ මාර්තු මස 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින්ගෙන් මිලදී ගන්නා ලද විදුලි බලය සඳහා ඇස්තමේන්තුගත රු. මි. 897 ක් ශ්‍රී.ල.සු.බ.අ. විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු වේ. මෙම ගෙවීම සිදු කිරීම සඳහා මේ වන විට ක්‍රමයක් නොමැති අතර ඒ සඳහා භාණ්ඩාගාර අරමුදල් හෝ සෙස් බදු හෝ රාජ්‍ය භාගය තුලින් උපයාගත යුතු වේ. මේවා භාණ්ඩාගාර අනුමැතියට යටත් වේ. එබැවින් මෙය අවිනිශ්චිත බැරකමක් ලෙස පමණක් අනාවරණය කර ඇත.

2.3 දේපල, පිරියත සහ උපකරණ

2.3.1 පිරිවැය සහ තක්සේරු කිරීම

ස්ථාවර වත්කම්, පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්‍රමක්ෂය ට දක්වා ඇත. රේඛීය ක්‍රමය භාවිතා කරමින් ස්ථාවර වත්කම් වල ක්ෂය සඳහා වෙන් කිරීම් ගණනය කර ඇත.

2.3.2 ක්ෂය කිරීම්

ස්ථාවර වත්කම් ක්ෂය කිරීම පුනරීක්ෂණයට යටත්ව ඇස්තමේන්තු ගත ජීව කාල පදනම මත සිදු කරනු ලැබේ දැනට පවතින ක්ෂය කිරීම් අනුපාතයන් පහත දැක්වේ.

වර්ෂයක කාලයක් සඳහා ක්‍රමක්ෂය අනුපාතය පහත දක්වා ඇත.

අයිතමය	ක්‍රමක්ෂය අනුපාතය
ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	25%
මොටර් ප්‍රවාහන	20%
ඡායාපිටපත් යන්ත්‍රය	25%
පරිගණක	33.33%
විදුලි භාණ්ඩ	25%
පුස්තකාල පොත්	20%
බලශක්ති උපකරණ	33.33%
ප්‍රදර්ශන උපකරණ	25%
සුළං කුළුණු	20%
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5%

සූර්ය බලශක්ති ව්‍යාපෘති/කුඩා ජල විදුලි බලාගාර

A. සූර්ය පැනල්	5%
B. වානේ වලින් සාදන ගොඩනැඟිලි	10%
C. ගොඩනැගිලි	5%
D. විදුලි බෙදාහැරීම් පාලක (Switch gear)	20%
E. අපවර්තක	20%
F. ට්‍රාන්ස්ෆෝමර	5%
G. විදුලි ඉලෙක්ට්‍රෝනික්	33.33%
I. සනීපාරක්ෂක සහ ජලනල වැඩ	5%
J. රථයන්	20%
K. ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ	25%
L. මෙවලම්	33%
M. යන්ත්‍ර සූත්‍ර	20%
H. වෙනත්	20%

2.4 බැරකම් සහ ප්‍රතිපාදන

2.4.1 පාරිතෝෂිත

මූල්‍ය වර්ෂයේ අවසන් මාසයේ වැටුප පදනම් කර ගනිමින් අඩමසක වැටුප හා සමාන මුදලක් පාරිතෝෂිකයක් වශයෙන් සියළුම සේවකයින් සඳහා වෙන් කර ඇත.

2.4.2 EPF & ETF

අදාල නීති සහ නියාමනයන්ට අනුව EPF සහ ETF සඳහා දායකවීමට සේවකයින් හිමිකම් ලබයි. EPF සහ ETF සඳහා ශ්‍රී.ල.සු.බ.අ. හි දායකත්වය පිළිවෙළින් 12% සහ 3% කි.

2.4.3 කළමනාකරණ මණ්ඩල අනුමැතිය

මෙම මූල්‍ය ප්‍රකාශන 2017 ඔක්තෝබර් මස 10 වන දින අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)	*Note*	*2017*	*2016*
සටහන් 02 - මෙහෙයුම් ආදායම			
ප්‍රාග්ධන ප්‍රදාන - මහ භාණ්ඩාගාරයේ	6	45,074,380.78	41,247,949
ක්‍රමක්ෂය - විලම්භිත ප්‍රදාන	7	91,280,105.14	123,361,618
පුනරාවර්ථන ප්‍රදාන - මහ භාණ්ඩාගාරයේ		92,987,000.00	83,416,663
FARDF (17)		-	1,000,000
මහ භාණ්ඩාගාරයේ ප්‍රදාන - ආගමික ස්ථාන වල සූර්ය පැනල සවි කිරීම		20,000,000.00	-
බලශක්ති ජනන ආදායම - හම්බන්තොට		22,959,531.00	33,404,790
බලශක්ති ජනන ආදායම - ඉදුරාන		864,666.00	1,335,492
බලශක්ති කළමනාකරුවන් පුහුණු කිරීම		110,000.00	64,954
Solar Atlas Income		122,500.00	-
සුලං දත්ත ආදායම		500,000.00	-
බලශක්ති විලණන ආදායම		62,135.00	-
බලශක්ති බලපත්‍ර ආදායම		21,194,365.00	57,407,265
එකතුව		**295,154,682.92**	**341,238,731**
සටහන් 03 - මෙහෙයුම් නොවන ආදායම්			
FARDF- නාම		39,557,703.27	2,036,947
LECO - බලශක්ති ඉල්ලුම් කළමනාකරණ වැඩ සටහන්		50,000,000.00	-
ටෙන්ඩර් ගාස්තු		520,000.00	-
ආපදා ණය පොලී		514,197.76	391,525
අනුග්‍රහක		4,500,000.00	6,547,053
වෙනත් ආදායම්		388,245.00	1,644,335
විශේෂ අත්තිකාරම් පොලිය		3,479.16	2,202
විදුල්කා ප්‍රදර්ශන කුටි		1,645,000.00	-
FARDF- යූ.එන්.ඩී.පී. ව්‍යාපෘතිය (ජෛව ස්කන්ධය)		-	2,691,954
යූ.එන්.ඩී.පී. -මහවැලි ව්‍යාපෘතිය		-	530,000
බලශක්ති අරමුදල් ආදායම	8	29,541,195.88	38,573,814
කාර්ය සාධන පරික්ෂාව		-	287,500
ADB ව්‍යාපෘතිය - සම්පත් බැංකුව		121,077,929.04	50,926,214
ADB ව්‍යාපෘතිය - NDB බැංකුව		14,880,000.00	-
පොලී ආදායම		7,963,788.70	237,635
එකතුව		**270,591,538.80**	**103,869,179**

(Contd...)

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)

	Note	2017	2016
සටහන් 04 - ව්‍යාපෘති වියදම්			
සටහන් 04 -1 පුනර්ජනනීය බලශක්ති			
සම්පත් පැවරීම හා සංවර්ධනය		1,008,534.03	883,505
ප්‍රගති අධීක්ෂණය		219,656.25	1,026,650
තාක්ෂණ සංවර්ධනය හා පර්යේෂණ කිරීම		389,553.00	1,809,305
පුනර්ජනනීය බලශක්ති සේවා		68,852,226.76	31,902,188
දාන අරමුදල් සැපයූ ව්‍යාපෘති UNDP - ජෛව ස්කන්ධ ව්‍යාපෘතිය		11,021,719.20	2,691,954
දාන අරමුදල් ව්‍යාපෘතිය - ADB (L 2892 SRI)		121,320,931.74	51,611,502
නාම ව්‍යාපෘතිය		1,777,760.51	2,036,947
ADB ව්‍යාපෘතිය		1,840.00	-
හම්බන්තොට පුනර්ජනනීය බලශක්ති පරිශ්‍රය ක්‍රියාවට නැංවීම		6,427,930.86	8,851,875
ඉදුරාන පරිශ්‍රය ක්‍රියාවට නැංවීම		894,793.16	1,834,814
IFC සූර්ය පැනල ව්‍යාපෘතිය		43,187.00	-
පුනරීන් ව්‍යාපෘතිය		610,303.50	-
දාන අරමුදල් ව්‍යාපෘති - ADB (L 2733 SRI)		14,880,000.00	2,990,724
එකතුව		**227,448,436.01**	**105,639,464**
සටහන් 04 - 2 බලශක්ති කළමනාකරණය			
බලශක්ති කළමනාකරණ පර්ශදයක් පිහිටුවීම		3,125,444.06	10,907,130
ප්‍රමිති හා රෙගුලාසි හඳුන්වාදීම		4,025,435.62	2,321,326
උපදේශාත්මක මග පෙන්වීමේ සේවා සැපයීම		84,400.00	73,904
ජයග්‍රහන ඇගයීම්		5,393,655.09	8,965,350
ක්ෂේත්‍ර විශේෂිත වැඩ සටහන්		107,000.00	1,456,034
පර්යේෂණ හා සංවර්ධන		7,000.00	7,125
බලශක්ති විගණනය		103,360.00	-
ඉල්ලුම් කළමනාකරණය		3,639,449.82	-
හරිත ගොඩනැගිලි වැඩ සටහන 1-7		-	530,000
උපදේශන සේවා		-	408,439
ඉල්ලුම් කළමනාකරණය		-	1,873,823
එකතුව		**16,485,744.59**	**26,543,131**
සටහන් 04 - 3 දැනුම් කළමනාකරණය			
බලශක්ති අධ්‍යාපන වැඩසටහන		19,544,857.73	22,886,248
සන්නිවේදන වැඩ සටහන		961,924.25	3,772,951
එකතුව		**20,506,781.98**	**26,659,199**
සටහන් 04 - 4 උපක්‍රමික ක්‍රියාකාරකම්			
බලශක්ති දත්ත හා තොරතුරු සැකසීම හා ගැළපීම		1,907,205.07	1,392,336
පර්යේෂණ හා සංවර්ධන		1,354,155.00	4,477,600
බලශක්ති හානිය		370,215.50	-
බලශක්ති සම්මන්ත්‍රණ		1,225,337.50	-
ඉන්ධන පිරවුම්හල් ජාතික සමීක්ෂණය		-	21,604
බලශක්ති පාරිභෝගික සමීක්ෂණය		-	1,497,122
සුනිත්‍ය බලශක්ති හඳුන්වාදීම		-	229,990
එකතුව		**4,856,913.07**	**7,618,652**

(Contd...)

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)	***Note***	***2017***	***2016***
සටහන් 05- පුනරාවර්ථන වියදම්			
සටහන් 05- 1 වැටුප් හා දීමනා			
කාර්යමණ්ඩල වැටුප්		44,738,007.42	48,257,110
ජීවන වියදම් දීමනාව		8,654,100.00	8,556,600
ගැළපුම් දීමනාව		5,547,456.00	-
සේ.අ.අ. 12%		7,405,831.89	7,387,725
සේ.භා.අ. 3 %		1,849,797.30	1,845,834
අතිකාල හා නිවාඩු ගෙවීම්		6,086,489.52	5,450,447
සන්තක වාහන භාවිතාව		2,950,000.00	1,920,000
ඉන්ධන දීමනාව		1,993,680.00	2,260,440
වෘත්තීය දීමනාව		4,964,000.00	1,895,000
NAITA වැටුප්		1,221,500.00	-
පාරිතෝෂික වියදම්		4,265,245.36	5,621,087
අතුරු දීමනා		-	4,590,000
වෛද්‍ය රක්ෂණය		-	1,574,988
එකතුව		**89,676,107.49**	**89,359,231**
සටහන් 05 - 2 ප්‍රවාහන හා යැපීම්			
ප්‍රවාහන - දේශීය		598,218.50	603,260
ප්‍රවාහන - විදේශීය		841,015.65	949,977
එකතුව		**1,439,234.15**	**1,553,237**
සටහන් 05 - 3 සැපයුම්			
මුද්‍රණ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා		1,369,203.04	1,124,947
ඉන්ධන හා ලිහිසි තෙල්		2,970,134.47	3,277,015
වෙනත් - පුවත්පත් සහ විවිධ සේවා		78,960.00	71,020
එකතුව		**4,418,297.51**	**4,472,982**
සටහන් 05 - 4 නඩත්තු වියදම්			
වාහන නඩත්තුව, රක්ෂණ හා බලපත්‍ර ගාස්තු		7,291,694.87	7,652,188
යන්ත්‍ර පිරියත		691,232.00	-
කාර්යාල උපකරණ නඩත්තුව		-	832,454
ගොඩනැගිලි හා ව්‍යුහයන් නඩත්තුව		503,915.00	98,500
එකතුව		**8,486,841.87**	**8,583,142**
සටහන් 05 - 5 කොන්ත්‍රාත්තුමය සේවා			
කාර්යාල කුලී හා කුලී ගාස්තු		29,691,288.00	30,519,070
තැපැල් හා දුරකථන ගාස්තු		4,292,163.80	3,800,935
ප්‍රවාහන		696,450.75	1,011,657
විගණන ගාස්තු		660,000.00	600,000
එකතුව		**35,339,902.55**	**35,931,662**

(Contd...)

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)	*Note*	*2017*	*2016*
සටහන් 05 - 6 ක්ෂය වියදම්			
ලිබඩු හා කාර්යාල උපකරණ		1,044,731.52	2,472,572
වාහන		1,247,215.00	1,247,215
ඡායා පිටපත් යන්ත්‍රය		333,293.00	281,070
පරිගණක		1,924,330.00	1,828,688
විදුලි භාණ්ඩ		52,682.00	52,682
පුස්තකාල පොත්		203,408.00	203,408
බලශක්ති උපකරණ		101,102.00	2,238,250
සුළං කුළුණු හා උපකරණ		2,154,088.00	6,433,908
ශීතකරණ පිරික්සුම් රසායනාගාරය		8,433,067.00	8,433,067
හම්බන්තොට හා ඉදුරාන බලශක්ති උද්‍යාන		74,054,465.01	100,100,993
ප්‍රදර්ශන උපකරණ		-	128
යූ.එන්.ඩී.පී. ව්‍යාපෘතිය සඳහා ස්ථාවර වත්කම්		69,637.00	69,637
නිදහස් වත්කම්		1,528,548.37	-
ක්‍රමක්ෂය		1,662,086.60	-
එකතුව		**92,808,653.51**	**123,361,618**
සටහන් 05 - 7 වෙනත් පුනරාවර්ථන වියදම්			
කාර්යාල හා වෙනත් විවිධ වියදම්		1,167,877.30	1,447,355
පුවත්පත් දැන්වීම්		614,067.50	587,220
රක්ෂණ		2,031,616.48	34,103
භාෂා පරිවර්තක ගාස්තු		144,803.00	101,863
අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික දීමනා		1,099,700.00	882,400
සංග්‍රහ වියදම්		1,173,016.54	576,842
දේශීය/විදේශීය පුහුණු වැඩසටහන්		5,526,980.88	2,155,091
බැංකු ගාස්තු		29,576.17	-
ජාතික ගොඩනැගිලි බදු (NBT)		789,376.00	3,137,024
එකතුව		**12,577,013.87**	**8,921,899**
සටහන් 06 - මහ භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන)			
ප්‍රාග්ධන ප්‍රදාන - මහ භාණ්ඩාගාර		64,881,000.00	60,000,000
අඩු කළා:			
වර්ෂය තුලදී කරන ලද නොනිමි වැඩ		(15,813,389.00)	(4,341,226)
අස්පෘෂ්‍ය වත්කම්		-	(9,242,483)
ප්‍රාග්ධන වත්කම් - වත්මන් වර්ෂය තුළ අත්පත් කරගත්		(3,993,230.22)	(5,168,342)
එකතුව		**45,074,380.78**	**41,247,949**
සටහන් 07 - ක්‍රමක්ෂිත විලම්භිත ප්‍රදාන			
වත්මන් වර්ෂය තුළ ක්ෂයවීම්		91,280,105.14	123,361,618
එකතුව		**91,280,105.14**	**123,361,618**
සටහන් 08 - ආදායම් - බලශක්ති අරමුදලින්			
බලශක්ති කළමනාකරණ ආදායම		1,363,812.50	1,270,303
පුනර්ජනනීය බලශක්ති ආදායම		15,855,174.00	114,414,010
ශුද්ධ පොලී		12,322,209.38	10,700,024
එකතුව		**29,541,195.88**	**126,384,337**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍යමය තත්ත්වය පිළිබඳ සටහන්
(සියළු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින්)

සටහන් 09 - දේපළ පිරියත හා උපකරණ
සටහන් 09 - 1 නොමිලේ හිමි වත්කම්

විස්තර	01.01.2017 දිනට ශේෂය(ප්‍රත්ස්ථාපිත)	අත්පත් කර ගැනීම	ප්‍රති ප්‍රමාණය	ඉවත් කිරීම්	සමතුලිතතාවය31.12.2017
ඉඩම්	-	-	101,217,000.00	-	101,217,000.00
ලිබඩු හා කාර්යාල උපකරණ	18,702,703	549,092.39	-	-	19,251,794.94
වාහන	52,266,495	-	-	-	52,266,495.00
ඡායා පිටපත් යන්ත්‍ර	3,879,191	488,750.00	-	-	4,367,941.00
පරිගණක	33,621,270	1,189,340.00	-	-	34,810,610.00
විදුලි භාණ්ඩ	446,964	-	-	-	446,964.45
පුස්තකාල පොත්	1,438,352	-	-	-	1,438,352.00
බලශක්ති උපකරණ	91,583,387	-	-	-	91,583,387.00
සුළං කුළුණු හා උපකරණ	47,238,802	1,753,700.00	-	-	48,992,502.00
ශීතකරණ පරීක්ෂා කිරීමේ රසායනාගාරය	42,165,337	-	-	-	42,165,337.00
<u>සූර්ය හා සුළු ජල ව්‍යාපෘති</u>					
A. සූර්ය පැනල	660,106,452	-	-	-	660,106,452.00
B. වානේ ව්‍යුහය	222,261,738	-	-	-	222,261,738.00
C. ගොඩනැගිලි	131,017,606	-	-	-	131,017,606.00
D. ස්විච් ගියර්	13,973,767	-	-	-	13,973,767.00
E. ඉන්වර්ටර්	79,091,306	-	-	-	79,091,306.00
F. ට්‍රාන්ස්පෝමර්	45,753,626	-	-	-	45,753,626.00
G. විදුලි ඉලෙක්ට්‍රොනික් උපකරණ	31,619,040	-	-	-	31,619,040.00
I.සනීපාරක්ෂක හා ජල නල	166,499,475	-	-	-	166,499,475.00
J. කේබල්	100,224,571	-	-	-	100,224,571.00
K. ලිබඩු හා කාර්යාල උපකරණ	3,014,584	-	-	-	3,014,584.00
L. මෙවලම්	14,248,433	12,347.83	-	-	14,260,780.83
M. යන්ත්‍රෝපකරණ	4,047,375	-	-	-	4,047,375.00
H. වෙනත්	60,039,664	-	-	-	60,039,664.00
ප්‍රදර්ශන භාණ්ඩ	354,853	-	-	-	354,853.00
ස්ථාවර වත්කම් - UNDP ව්‍යාපෘතිය	524,300	-	-	-	524,300.00
එකතුව	**1,824,119,291**	**3,993,230.22**	**101,217,000.00**	**-**	**1,929,329,521.22**

(Contd...)

14

ක්ෂය කිරීමේ ගිණුම

විස්තරය	01.01.2017 දිනට ශේෂය(ප්‍රතිස්ථාපිත)	අවප්‍රමාණය	ඉවත් කිරීම පිළිබඳ සමුච්චිත ක්ෂයවීම්	සමුච්චිත ක්ෂය 31.12.2017	ශුද්ධ පොත් වටිනාකම 31.12.2017
ඉඩම්	-	-	-	-	101,217,000.00
ලිබඩු හා කාර්යාල උපකරණ	17,733,196	1,044,731.52	-	18,777,927.55	473,867.39
වාහන	48,641,839	1,247,215.00	-	49,889,054.00	2,377,441.00
ඡායා පිටපත් යන්ත්‍ර	2,611,554	333,293.00	-	2,944,846.76	1,423,094.24
පරිගණක	30,243,573	1,924,330.00	-	32,167,903.00	2,642,707.00
විදුලි භාණ්ඩ	378,684	52,682.00	-	431,366.21	15,598.24
පුස්තකාල පොත්	696,561	203,408.00	-	899,969.00	538,383.00
බලශක්ති උපකරණ	91,482,285	101,102.00	-	91,583,387.00	(0.00)
සුළං කුළුණු හා උපකරණ	45,348,971	2,154,088.00	-	47,503,059	1,489,443.00
ශීතකරණ පරීක්ෂා කිරීමේ රසායනාගාරය	24,721,594	8,433,067.00	-	33,154,661	9,010,676.00
සූර්ය හා සුළු ජල ව්‍යාපෘති					
A. සූර්ය පැනල	181,757,987	33,025,517.00	-	214,783,504	445,322,948.00
B. වානේ ව්‍යූහය	121,085,714	22,226,174.00	-	143,311,888	78,949,850.00
C. ගොඩනැගිලි	35,003,829	6,560,293.00	-	41,564,122	89,453,484.00
D. ස්විච් ගියර්	13,973,765		-	13,973,767	-
E. ඉන්වර්ටර්	78,642,384	448,922.00	-	79,091,306	-
F. ට්‍රාන්ස්පෝමර්	12,523,820	2,287,681.00	-	14,811,501	30,942,125.00
G. විදුලි ඉලෙක්ට්‍රොනික් උපකරණ	31,291,020	328,020.00	-	31,619,040	-
I. සනීපාරක්ෂක හා ජල නල	45,096,784	8,324,143.00	-	53,420,927	113,078,548.00
J. කේබල්	100,214,087	10,484.00	-	100,224,571	-
K. ලිබඩු හා කාර්යාල උපකරණ	3,002,080	12,504.00	-	3,014,584	-
L. මෙවලම්	14,105,619	57,650.00	-	14,163,269	97,511.83
M. යන්ත්‍රෝපකරණ	3,346,283	701,092.00	-	4,047,375	-
H. වෙනත්	59,967,681	71,983.00	-	60,039,664	-
ප්‍රදර්ශන භාණ්ඩ	354,853	-	-	354,853	-
ස්ථාවර වත්කම් - යූ.එන්.ඩී.පී.ව්‍යාපෘතිය	69,637	69,637.00	-	139,274	385,026.00
එකතුව	**962,293,800**	**89,618,018.52**	**-**	**1,051,911,818.52**	**877,417,702.70**

(Contd...)

15

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍යමය තත්ත්වය පිළිබඳ සටහන්

	Note	2017	2016 (Restated)
සටහන් 11 - නොනිමි කාර්ය			
පුනර්ජනනීය බලශක්ති තක්සේරුව		2,377,000.00	2,377,000
ADB ක්වොන්ටම් බඳුන් -WRA (සුළං බලය)		2,299,935.00	2,299,935
බලශක්ති කාර්යක්ෂමතාවයPV Thru DC මයික්‍රො ග්‍රිඩ් (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)		442,000.00	442,000
ගොඩනැගිලි කාර්යාල සංකීර්ණය		6,797,403.00	3,936,978
විද්‍යුත් මූලාකෘති වාහනය		7,956,800.00	7,956,800
සුළං මාපක කුළුණු - සාම්පූර්		130,550.00	130,550
සුළං මාපක කුළුණු - නාඩුකුඩා		1,775,025.00	1,775,025
පිවිතුරු බලශක්ති ජාල කාර්යක්ෂමතා ව්‍යාපෘතිය		15,788.00	15,788
බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගීමේ පරිචය සඳහා කේත සංශෝධනය කිරීම		951,778.00	951,778
පුනරීන් ව්‍යාපෘතිය		12,952,964.00	-
එකතුව		**35,699,243.00**	**19,885,854**

සටහන් 12 - ආයෝජන

ස්ථාවර තැන්පතු(ජා.තික ඉතිරි කිරීමේ බැංකුව, බොරැල්ල)

Deposit Reg. No.	Date of Maturity	Rate of investment	Net Interest for 2017	Deposit as at 31.12.2017	Deposit as at 01.01.2017
2/0061/11/33829	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33861	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33853	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33888	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33772	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33837	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33845	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33756	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33764	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33802	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33713	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33896	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33799	9/21/2018	11.00%	121,411	1,321,440.00	1,200,000
2/0061/11/33870	9/25/2018	11.00%	46,079	495,540.00	450,000
2/0061/09/60845	10/20/2018	11.00%	44,127	492,537.62	2,894,453
2/0061/11/34051	9/30/2018	11.00%	292,856	3,187,371.64	9,039,590
2/0061/09/49981	5/2/2018	8.50 %	849,889	9,731,118.64	448,169
Total			**2,811,298.26**	**31,085,288.00**	**28,432,212**

TREASIURY BILLS-(In People's Bank, Head Quarters)

Deposit Reg. No.	Date of Maturity	Rate of Investment	Net Interest for 2017	Deposit as at 31.12.2017	Deposit as at 01.01.2017
LKB00819K017	18/01/2018	9.85%	1,604,004.03	16,675,954.53	15,585,004
LKB00819K017	11/7/2018	10.2%	3,548,486.40	37,145,921.21	33,753,677
Total			**5,152,490.43**	**53,821,875.74**	**49,338,681**

TOTAL INVESTMENT	**84,907,163.74**	**77,770,893**

(Contd...)

17

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍යමය තත්ත්වය පිළිබඳ සටහන්

	Note	2017	2016 (Restated)
සටහන් 13 - ණය අයකර ගැනීම			
ADBණය (L 2892/93 SRI) සම්පත් බැංකුව			
එස්.ජී. ජෝෂප් සහ සහෝදරයෝ (Orange Field Tea Factory)		-	9,304,809
Miami Clothing (Pvt) Ltd		-	8,085,000
T5 Escapes (Pvt) Ltd		-	1,485,000
Asia Bike Industrial Ltd		-	8,413,000
Mount Eliza Tea Factory		-	2,718,000
Meezan and Company (Pvt) Ltd		-	3,450,000
Lighthouse (Pvt) Ltd		-	2,991,900
Wimalasurendra and Sons Ltd		12,975,000.00	-
ARK Printing Solutions		2,437,000.00	-
Central Rubber (Pvt) Ltd		9,065,000.00	-
Aitken Spense Hotel Management (Pvt) Ltd		7,924,000.00	-
EB Creasy and Company Plc		8,493,000.00	-
Commercial Export Company		8,886,000.00	-
එකතුව		**49,780,000.50**	**36,447,709**
ADB ණය (L 2892/93 SRI) ජාතික සංවර්ධන බැංකුව			
-සුනිත්‍ය බලශක්ති ආයතනය සඳහා උපයෝගී වන ව්‍යාපෘති			
ඇල්පිටිය ප්ලාන්ටේෂන්		-	7,110,000
වටවල ප්ලාන්ටේෂන්		-	7,770,000
එකතුව		**-**	**14,880,000**
සටහන් 14 - අයවිය යුතුයි			
ස්ථාවර තැම්පතු සඳහා අයවිය යුතු පොලිය		1,262,865.26	1,104,643
භාණ්ඩාගාර බිල්පත් සඳහා අයවිය යුතු පොලිය		3,357,404.69	2,688,109
ලංකා විදුලිබල මණ්ඩල - ආර්.සී.එල්. කුලිය		8,033,271.00	8,033,271
විදුලි ජනකය - හම්බන්තොට/ඉඳුරාන		5,174,781.00	8,691,945
සේවකයන්ගෙන් අයවිය යුතු		2,382.00	2,382
දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අයවිය යුතු		3,472,802.21	280,458
දේශිය පුහුණු වැඩසටහන් (අවිනිශ්චිත)		211,927.50	358,809
ඒවිකන්ස්පෙන්ස් - සංචාරක		6,309.00	6,309
උරුමය - අහුන්ගල්ල		35,659.00	35,659
එකතුව		**21,557,401.67**	**21,201,585**

(Contd...)

18

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍යමය තත්ත්වය පිළිබඳ සටහන්

	Note	2017	2016 (Restated)
සටහන් 15 - වෙනත් ජංගම වත්කම්			
ආපසු ගෙවන තැන්පත්			
ජාතික තරුණ		40,000.00	40,000
ජල සම්පාදන මණ්ඩලය		2,500.00	2,500
වෛද්‍ය රක්ෂණය		500.00	500
තැන්පත් ඉන්ධන		186,500.00	186,500
හම්බන්තොට - CEB		52,000.00	52,000
ඉදුරාන - CEB		62,500.00	62,500
දුරකථන		351,048.00	351,048
හොටෙල් කුලී - හම්බන්තොට		132,000.00	132,000
ස්ප්‍රිනග් වෝටර් ප්‍රයිවට් ලිමිටඩ්		3,500.00	3,500
ඇමරිකන් ප්‍රිමියන් වෝටර්		23,000.00	23,000
මොබිටෙල්		2,000.00	2,000
W.D.G.S Onil - ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්		2,100,000.00	2,100,000
SWRD ජාතික අනුස්මරණ අරමුදල		-	340,429
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය		-	5,000
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රන ශාලාව		354,153.18	-
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය		10,000.00	-
සීමාසහිත වෝටර් එජ්		50,000.00	-
විදුල්කා ප්‍රදර්ශනය		25,000.00	-
අත්තිකාරම්			
බලශක්ති අරමුදලින් අධිකාරියට ලැබිය යුතු		-	12,176,162
වැඩසටහන් වැනි අත්තිකාරම්		311,398.22	190,093
ධීවර අමාත්‍යාංශය - දකුණු පළාත් සභාව		-	64,000
කර්මාන්ත තාක්ෂණ ආයතනය		-	97,680
පානදුර නගර සභාව		-	24,725
දෘෂ්ය ව්‍යාපාර පද්ධති		-	510,622
රංජිත් රුවන් විජේවර්ධන		-	108,000
මහවැලි රීච් හෝටලය		-	231,388
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය		-	84,150
සුගතදාස බණ්ඩාර සහ පුත්‍රයෝ		-	-
ශ්‍රී ලංකා පදනම		-	-
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රුවන්වැල්ල		251,813.80	256,360
NCP අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අනුරාධපුර		-	2,000,000
ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		1,034,596.00	1,253,150
නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		1,323,300.00	1,323,300
උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		1,618,300.00	1,618,300
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		842,682.00	1,120,850
බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය		892,512.00	280,122
මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		-	1,976,480
දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		1,544,949.37	2,156,715
සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		-	1,122,542
රජයේ මුද්‍රණය		2,412,040.00	2,365,000
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		518,585.00	776,750
සුගතදාස බණ්ඩාර සහ පුත්‍රයෝ		-	64,260
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලාව		-	16,010
ඉකො පව(ර්) ලංකා ඉන්ජිනියරින් (පුද්) සමාගම		5,805,000.00	-
වෙනත්		4,576,703.50	2,934,144
එකතුව		**24,526,581.07**	**36,051,780**

(Contd...)

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍යමය තත්ත්වය පිළිබඳ සටහන්

	Note	2017	2016 (Restated)
චක්‍රීය අරමුදල			
ආපදා ණය		12,089,386.22	10,864,008
විශේෂ අත්තිකාරම්		4,585.00	4,585
උත්සව අත්තිකාරම්		51,989.00	31,989
ගංවතුර ණය		1,318,377.92	-
		13,464,338.14	**10,900,582**
වෙනත් ජංගම වත්කම් වල එකතුව		**37,990,919.21**	**46,952,362**
සටහන් 16 - මුදල් හා මුදල් සමාන දෑ			
ජාතික ඉතිරි කිරීමේ බැංකුව - බොරැල්ල - 100610493406		166,914,053.14	160,380,083
මහජන බැංකු ජංගම ගිණුම - 078100188503576		8,512,421.00	13,512,846
මහජන බැංකුජංගම ගිණුම - 078100278503576		4,578,684.00	4,578,684
ලංකා බැංකු ජංගම ගිණුම- 8002630		960,863.69	343,943
ලංකා බැංකු ජංගම ගිණුමt - 74944408		11,228,284.48	20,969,081
ලංකා බැංකු ජංගම ගිණුම - 75803419		153,868,425.24	146,248,232
ලංකා බැංකු ජංගම ගිණුම - 80595356		46,116,605.41	-
එකතුව		**392,179,336.96**	**346,032,869**

සටහන් 17 - සමුච්චිත අරමුදල

සමුච්චිත අරමුදල වල බලශක්ති සංරක්ෂණ අරමුදල (ECF)2007 සැප්තැම්බර් මස 30 වන දිනට මාරු කෙරිනි
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA)2007 ඔක්තෝම්බර් 1 වන දිනට පහත සඳහන් වන්නේ:

	2017	2016 (Restated)
සමුච්චිත අරමුදල 2017 සැප්තැම්බර් 30 දිනට	7,076,392.00	7,076,392
මූලික ප්‍රාග්ධනය	5,000,000.00	5,000,000
ප්‍රාග්ධන ප්‍රදාන -විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	5,761,145.00	5,761,145
ප්‍රාග්ධන ප්‍රදාන - යූ.එන්.ඩී.පී.	3,612,560.00	3,612,560
ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ආධාර ලබා දීම	650,239.00	650,239
එකතුව	**22,100,336.00**	**22,100,336**

සටහන් 18 - විලම්බිත ප්‍රදාන

	2017	2016 (Restated)
ප්‍රාග්ධන ප්‍රදාන 2008	33,770,435.00	33,770,435
ප්‍රාග්ධන ප්‍රදාන 2009	11,955,533.00	11,955,533
විදේශ දීමනා 2009 - ජපන්	24,165,380.00	24,165,380
ප්‍රාග්ධන ප්‍රදාන 2010 - හම්බන්තොට සූර්ය උද්‍යානය	46,693,991.00	46,693,991
- කොටස් නොකළ ප්‍රාග්ධන දීමනාව	10,646,819.00	10,646,819
විදේශ දීමනා 2010 - ජපන්	11,419,569.00	11,419,569
ප්‍රාග්ධන ප්‍රදානt 2011 - ඉදුරාන කුඩා ජල ව්‍යාපෘතිය	15,523,945.00	15,523,945
- කොටස් නොකළ ප්‍රාග්ධන දීමනාව	68,798,341.00	68,798,341
විදේශ දීමනා2011 - ජපන්	1,155,016,402.00	1,155,016,402
-කොරියානු	191,097,075.00	191,097,075
වෙනස් දීමනා 2012 - ADB	15,082,346.00	15,082,346
ප්‍රාග්ධන ප්‍රදාන 2012	23,581,236.00	23,581,236
වෙනස් දීමනා 2013 - ADB	43,416,071.00	43,416,071
වෙනස් දීමනා 2013 - KOIKA	35,662.00	35,662
ප්‍රාග්ධන ප්‍රදාන 2013 - FARDF	41,873,961.00	41,873,961
ප්‍රාග්ධන ප්‍රදාන2014	20,487,827.00	20,487,827
ප්‍රාග්ධන ප්‍රදාන 2015	14,655,015.00	14,655,015
ප්‍රාග්ධන ප්‍රදාන 2016	18,752,051.00	18,752,051
ප්‍රාග්ධන ප්‍රදාන2017	19,806,619.22	-
අඩු කළා:		
- විලම්භිත ආදායම පෙර වසර වල	(865,758,409.00)	(742,396,791)
- විලම්භිත ආදායම වර්ෂයට අදාළ	(91,280,105.14)	(123,361,618)
එකතුව	**809,739,764.08**	**881,213,250**

(Contd...)

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍යමය තත්ත්වය පිළිබඳ සටහන්

	Note	2017	2016 (Restated)
සටහන් 19 - වෙනත් ගෙවීමට ඇති දෑ			
අධිකාරියට ගෙවිය යුතු අරමුදල		-	12,176,162
ස්විච් ඒෂියා පාලන ගිණුම		4,548,176.00	4,548,176
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය		500.00	500
උපචිත වියදම්		11,842,516.77	11,355,012
ඉදිරිපත් නොකළ චෙක්පත්		173,696.00	173,696
පුනර්ජනනීය බලශක්ති සූර්ය පැනල ලියාපදිංචි ගාස්තුව		295,860.00	295,860
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය		470,000.00	470,000
යූ.එන්.ඩී.පී. - නාම ව්‍යාපෘතිය		1,036,803.00	1,036,803
යූ.එන්.ඩී.පී - ජෛව ස්කන්ධ ව්‍යාපෘතිය		1,970,834.00	1,970,834
විගණන ගාස්තු		1,332,636.00	2,822,636
ණයගැතියෝ			
පුනර්ජනනීය බලශක්ති - ඊ නෙට් සොලූෂන්		1,667,500.00	1,667,500
බලශක්ති උපකරණ අත්පත් කර ගැනීම		326,025.00	326,025
රඳවා තබා ගැනීම්		4,154,251.44	3,167,807
නාරාහෙන්පිට ජාතික පොල		99,405.00	99,405
විවිධ ණයගැතියෝ			
ශ්‍රී ලංකා රේගුව		310,748.00	310,748
සුභ සාධක සමිතිය - සුනිත්‍ය බලශක්ති අධිකාරිය		442.00	442
ආපසු ගෙවන තැන්පතු			
ඊ-නෙට් විසඳුම් (පුද්) සමාගම		10,000.00	10,000
ඊ.එන්.එල්.උපදේශක		150,000.00	150,000
සිග්මා තාක්ෂණය		10,000.00	10,000
රේන්කො පුනර්ජනනීය බලශක්ති සමාගම (ප්‍රයිවට්) ලිමිටඩ්		30,000.00	30,000
විදුල්කා ප්‍රදරශනය		9,256.00	9,256
ලංකා ඛනිජ තෙල් සංස්ථාව		54,000.00	54,000
ආපසු ගෙවිය හැකි තැන්පතුව - වාහන		14,000.00	14,000
ඒ.ටී.ඒ.ඉන්ටර්නැෂනල්		50,000.00	50,000
විදුල්කා සම්මන්ත්‍රණය- එන්ටර්ටේන්මන්ට්		25,000.00	25,000
ආපසු ගෙවිය හැකි තැන්පතුව -ජෙන්සෝ පව(ර්)ටෙක්නොලොජීස්		50,000.00	-
එකතුව		**28,631,649.21**	**40,773,862**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍යමය තත්ත්වය පිළිබඳ සටහන්

	Note	2017	2016 (Restated)
සටහන් 20 - ශ්‍රී ලංකා බලශක්ති අරමුදල			
බැංකු ගිණුම අනුව ශේෂය			
ඉතිරි කිරීමේ ගිණුම - ජාතික ඉතිරි කිරීමේ බැංකුව		166,914,053.14	160,380,083
ඉතිරි කිරීමේ ගිණුම - ලංකා බැංකුව		153,868,425.24	146,248,232
		320,782,478.38	**306,628,315**
එකතු කළා:			
ප්‍රතිපාදන මත පදනම්ව පවරනු ලැබූ අරමුදල		-	-
හඳුනා නොගත් ශේෂය		4,102.50	-
අඩු කළා :			
VAT වසර අවසානය දක්වා ආදායම් සඳහා ගෙවිය යුතු (අධිකාරී ගිණුමේ ගිණුමට මාරු කිරීම.))		(2,581,991.00)	(17,964,921)
එකතුව		**318,204,589.88**	**288,663,394**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඊආර්/ඊ/එස්එල්එස්ඊඒ/එෆ්එස්/01/2017/07

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 7 දින

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6)වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 15 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයන්හි අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්,වගකීම්,ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන අයිතමය	වටිනාකම (රු.)
වත්කම්	
ජංගම නොවන වත්කම්	1,080,797,130
ජංගම වත්කම්	417,284,131
මුළු වත්කම්	**1,498,081,261**
ස්කන්ධය හා වගකීම්	
ස්කන්ධය	1,372,782,112
වගකීම්	
ජංගම නොවන වගකීම්	79,404,647
ජංගම වගකීම්	45,894,502
මුළු ස්කන්ධය හා වගකීම්	**1,498,081,261**

මුළු ආදායම	445,107,910
මුළු වියදම	439,680,794
අතිරික්තය	**5,427,116**

2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට 2012 නොවැම්බර් මාසයේදී ආර්සීඑල් (Regional Centre for Lighting) මධ්‍යස්ථානයේ කළමනාකරණය සහ වත්කම් පවරා දීමේදී හිඟ බදු කුලී ලෙස බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පදනමට ගෙවිය යුතුව පැවති රු.8,033,270 ක් ගෙවා තිබුණු අතර 2018 අගෝස්තු 30 දින දක්වා ලංකා විදුලිබල මණ්ඩලයෙන් අය කර ගෙන නොතිබුණි.

2.4 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේ දී නිරීක්ෂණය වු අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) **2007 අංක 35 දරන සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනත** 46 (3) වගන්තිය	බලශක්ති අරමුදලෙහි අරමුණට පටහැනිව සුනිත්‍ය බලශක්ති අධිකාරියට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට හා එම ගොඩනැගිල්ලෙහි සැලසුම් සකස් කිරිම සඳහා 2015, 2016 හා 2017 යන වර්ෂ වලදී එකතුව රු. 54,263,517 ක් අධිකාරිය විසින් එම අරමුදලේ ආයෝජන වලින් ඉවත්කර ගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 454	මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 757(1)	අදාල ආකෘති පත්‍ර පදනම් කරගෙන වත්කම් භෞතික සත්‍යාපනය කර නොතිබුණි.

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ

(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු. 1,961,896,952 ක් වූ ස්ථාවර වත්කම් සඳහා වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිජ්අයි/2002/02 දරන චක්‍රලේඛය	වටිනාකම රු.14,973,433 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන චක්‍රලේඛය	වෘත්තීය දීමනාව සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරින් පමණක් හිමිකම් ලබන නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නොගැනෙන අධිකාරියේ ඉංජිනේරු තනතුර දරන නිලධාරීන් සඳහා 2016 අගෝස්තු මාසයේ සිට 2018 මැයි මාසය දක්වා රු.7,980,000 ක මුදලක් වෘත්තිය දීමනා ලෙස අධිකාරිය විසින් ගෙවා තිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "ස්විච්-ඒෂියා" වැඩසටහන යටතේ යුරෝපා සංගමයෙන් ලැබී තිබුණු රු. 7,334,354 ක මුදලින් රු.3,135,202 ක්, 1994 ජූනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2010 හා 2011 වර්ෂයන්හි දී අධිකාරියේ සියලු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. නීත්‍යානුකූල නොවන මෙම ගෙවීම අදාල නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකිරීමට අමාත්‍යාංශයේ ලේකම් විසින් 2012 දෙසැම්බර් 03 දින දෙන ලද නියෝගය 2018 අගෝස්තු 30 දක්වාම ඉටුකර ගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 01 දින වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නව අධ්‍යක්ෂ ජනරාල්වරයාට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පනතේ 52 (4) වගන්තියට අනුව මාසිකව රු.250,000 ක වැටුපක් ගෙවා තිබුණද මෙතෙක් අදාල තනතුර සඳහා ආයතනය 2/2016 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව HM.2-3 කාණ්ඩය යටතේ රු.98,215 ක් ගෙවීම් කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවද, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් ක්‍රියාකාරි සැලැස්මක් වාර්ෂිකව පිළියෙල කරන නමුත් එහි ප්‍රගතිය සමාලෝචනය කර සමාලෝචිත වර්ෂය අවසානයට වාර්තාවක් සකස් කර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පරමාර්ථ ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බලශක්ති විගණනය හා බලශක්ති සේවා සැපයීම

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත ප්‍රකාරව (Energy efficiency improvement ,Energy Auditing and Energy Service) අධිකාරිය විසින් බලශක්ති උපකරණ බාහිර ආයතනයන්ට කුලියට දීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2008 - 2012 යන කාලපරිච්ඡේදය තුළදී මිලදී ගෙන තිබූ උපකරණ වර්තමානයේ ද භාවිතා කරන නමුත් එම උපකරණ අලුත්වැඩියා කිරීමක් සිදුකර නොතිබුණු බැවින් මෙම මිණුම් උපකරණ භාවිතා කර ලබාගන්නා තොරතුරුවල නිරවද්‍යතාවය හා ගුණාත්මකභාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

(ii) එසේම මෙම උපකරණ අතරින් 2017 භාණ්ඩ සමීක්ෂණය මගින් දෝෂ සහිත ලෙස හඳුනාගෙන තිබුණු උපකරණ අපහරණය කිරීමට, අලුත්වැඩියා කිරීමට හෝ නවීන උපකරණ මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) අධිකාරිය විසින් බලශක්ති මිනුම් උපකරණ කුලියට දීමේදී අයකරනු ලබන ගාස්තු 2010 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබූ අතර 2018 වර්ෂය දක්වාම මෙම ගාස්තු සංශෝධනයක් සිදුකර නොතිබුණි.

(iv) බලශක්ති සේවා අංශයේ කාර්ය මණ්ඩලය තුල ඉංජිනේරුවරයෙකු හා ඉංජිනේරු සහායක නිලධාරියා පමණක් සේවයේ යෙදී සිටීම නිසා සේවා සැපයීම හා උපකරණ නැවත භාරගැනීම ආදී කටයුතු ක්‍රමානුකූලව සිදුකිරීමට අපහසු බව විගණනයේදී නිරීක්ෂණය විය.මේ හේතුවෙන් සේවා සැපයීම පහත වැටීමක් සිදු වන අතර මිනුම් උපකරණ නැවත භාරගැනීමේදී පරීක්ෂා කිරීමකින් තොරව භාරගැනීමට සිදු වීම නිසා දෝෂ සහිතව උපකරණ භාරගනු ලැබූ අවස්ථා ද නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද සූර්ය බලශක්ති ව්‍යාපෘති 3 ක් හා සූර්ය බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 3 ක් වෙනුවෙන් එකතුව රු. මිලියන 74.787 ක ප්‍රතිපාදන සුනිත්‍ය බලශක්ති අරමුදලින් සලසා ගෙන තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති 4 ක කිසිදු කාර්යයක් සිදුකර නොතිබීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර ව්‍යාපෘති 2 ක සියයට 0.2 සිට 1 කාර්යසාධනයක් පමණක් නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා ප්‍රධාන කාර්යාලයක් ඉදිකිරීම වෙනුවෙන් වසර 30 ක කල්බදු පදනම යටතේ 2015 ජූනි 22 දින රු.45,856,451 ක් වැයකර නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉඩමක් ලබාගෙන තිබුණි. නීතිමය උපදෙස් ලබාගැනීමකින් තොරව බදු ගිවිසුමකට එළඹ තිබීම හේතුවෙන් වසර 2 ක් තුල සංවර්ධන කටයුතු නිමකිරීමට අපොහොසත් වුවහොත් බදු දේපලේ අයිතිය බදුකරුට ලැබෙන බවට කොන්දේසියක් ඇතුළත්ව තිබුණි. එහෙත් 2018 සැප්තැම්බර් 30 දින වනවිට වසර 2 ½ ක් ඉක්ම ගොස් තිබුණද ගොඩනැගිල්ලේ සැලසුම් නිර්මාණ කටයුතු පමණක් සිදුකර තිබුණි.

(ආ) අධිකාරිය විසින් 2018 මැයි මාසයේදී අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගිය සේවා කාලය වර්ෂ 5 ඉක්ම වූ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ සේවකයෙකු සඳහා විශ්‍රාමික පාරිතෝෂික ලෙස රු.160,090 ක් ගෙවා තිබුණ ද ඒ සඳහා වාර්ෂික වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයේ වාර්තාව 2012 පෙබරවාරි 03 දින අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබුණ ද එහි සඳහන් නිර්දේශ ආයතනය විසින් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. එම වාර්තාවට අනුව 2007 ඔක්තෝබර් 01 දින සිට 2011 සැප්තැම්බර් 30 දින දක්වා චක්‍රලේඛවලින් බැහැරව වැඩිපුර ගෙවන ලද රු. 2,171,760 ක වැටුප් හා දීමනා අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිළධාරි ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා තිබුණද, ඒ අනුව අය කර ගැනිමට හෝ නිවැරදි කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2007 සැප්තැම්බර් 28 දින ඇති කර ගන්නා ලද ගිවිසුමකට අනුව මාස 18 ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2007 වර්ෂයේ දී බාහිර පාර්ශවයකට රු.7,956,800 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, 2018 අගෝස්තු 30 දින දක්වා වර්ෂ 10 ක් ගත වී තිබුණ ද , එක් වාහනයක් හෝ සංවර්ධනය කිරීමට සංවර්ධකට නොහැකි වී තිබූ අතර වාහන 03ක් සංවර්ධනය කරවා ගැනීමට හෝ ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් අධිකාරිය විසින් ගෙන නොතිබුණි.

(ඉ) **සුළං මාපක කුළුණු**

අන්තර්ජාතික මහපෙන්වීම් (MEASNET Site Assossonent Guig Line 2 April 2016) අනුව සුළං බලාගාර ආකෘති නිර්මාණය සඳහා එක් වර්ෂයක් තුල අඛණ්ඩ පදනමින් එක් රැස් කළ දත්ත ප්‍රමාණවත් වන අතර දත්ත අතර සහසම්බන්ධතාවයක් (Co-Relation) පරීක්ෂා කිරීම සඳහා වර්ෂ 2-3 ක දත්ත ලබාගැනීම ප්‍රමාණවත් වේ. ඒ අනුව 2012 වර්ෂයට පෙර ස්ථාපිත කරන ලද කුළුණු 06 මහින් ප්‍රමාණවත් දත්ත ලබාගෙන තිබුණද එම දත්ත උපයෝගී කර සුළං බල සම්පත් සිතියම් හා සැළසුම් සකස් කිරීම 2018 අගෝස්තු 31 දින දක්වාම අවසාන කර නොතිබුණි.

(ඊ) 2008 මාර්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලංකා විදුලිබල මණ්ඩලය සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධනකරුවන් සඳහා "Cost based tariff "ක්‍රමය යටතේ නව ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ අනුව පිරිවැයෙන් සියයට 90 ක් ලංකා විදුලිබල මණ්ඩලය දැරීමටත් ඉතිරි සියයට 10 සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ප්‍රතිපූරණය කිරීමටත් තීරණය කර තිබුණි. මෙම තීරණය මත 2010 දෙසැම්බර් 31 දිනට සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු. 897,025,999 ක මුදල පියවීමට කිසිදු වැඩපිළිවලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.

3.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "ස්විච් -ඒෂියා" වැඩ සටහන යටතේ ලැබී ඉතිරිව ආපසු ගෙවිය යුතුව තිබූ රු.4,548,176 ක්, 2011 වර්ෂයේ රාජ්‍ය බැංකු දෙකක ජංගම ගිණුමක රු.4,548,176 ක් හා ඉතිරි කිරීමේ ගිණුමක රු. 150,000,000 කට වැඩි මුදලක් වසර ගණනාවක සිට තැන්පත් කර තිබුණි.

(ආ) අධිකාරිය සතු කැබ්රථයක් හා මෝටර් බයිසිකලයක් වසර 3 කට අධික කාලයක සිට නිෂ්ක්‍රියව පවතින අතර ඉහත කැබ් රථය ලංකා ඔටෝ මොබයිල් සංගමය මගින් 2015 ජුනි 17 දිනැති තක්සේරු වාර්තාව මගින් අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. නමුත් මෙම වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට 2018 අගෝස්තු 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර කැබ් රථය එළිමහන් ස්ථානයක දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රතිස්ථාපනය කිරීමේ නිර්දේශය මත ගලවා ඉවත් කරන ලද සාම්පූර් හා මුල්ලිපුරම සුළං මාපක කුළුණු කිසිදු ගිවිසුමක් නොමැතිව සේවා සැපයුම්කරු සතු කැප්පෙටිපොලානේ පිහිටි පරිශ්‍රයකට ප්‍රවාහනය කර තිබූ අතර එම කුළුණු වලින් ගලවා ඉවත් කරන ලද උපකරණ අධිකාරිය වෙත භාරදුන් බවට කිසිදු ලේඛණයක් නොමැතිව සේවා සැපයුම්කරුට මුදල් නිදහස් කර තිබුණි. ගලවා ඉවත් කරන ලද දේපල නැවත භාවිතයට ගැනීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීමට 2018 අගෝස්තු දක්වාම අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඈ) නාඩුකුඩා සුළං මාපක කුළුණ සඳහා 2016 පෙබරවාරි මාසයේදී මිලදී ගත් රු. 1,775,025 ක වටිනාකමින් යුත් උපකරණ අතරින් රු.915,625 ක් වටිනා උපකරණ 2018 අගෝස්තු දක්වාම භාවිතයට ගෙන නොතිබුණු අතර අනෙකුත් උපකරණ මාස 11ක් පමණ ප්‍රමාද වී සවි කර තිබුණි.

3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය ප්‍රකාරව අධිකාරිය සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර අනුමත කරගෙන නොතිබුණි.

ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධිකාරිය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 2017දෙසැම්බර් 31 දිනට 136 ක් වූ අතර සත්‍ය කාර්ය මණ්ඩලය 103 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 33 ක් පැවති අතර මෙම පුරප්පාඩු අතර අධ්‍යක්ෂ තනතුරු 3 ක්, අංශ ප්‍රධාන තනතුරු 4 ක් හා කළමනාකරණ තනතුරු 12 ක් ද විය.

ඇ) ඉහත පරිදි පුරප්පාඩු වූ අධ්‍යක්ෂවරුන් තිදෙනා සහ අංශ ප්‍රධානීන් 4 න් 3 ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.1(ආ) ඡේදයේ නියමයන්ගෙන් බැහැරව නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධිකාරියේ සභාපතිවරයා විසින් 2013 හා 2014 වර්ෂයන්හි දී වැඩ බැලීමේ තනතුරු සඳහා පත් කිරීම් සිදු කර තිබුණි. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.7 ඡේදය හා VII වන පරිච්ඡේදයේ 12.2.6 ඡේදයට පටහැනි ලෙස 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස එකතුව රු. 2,903,361 ක් ගෙවා තිබුණි.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් ද තොරව අධිකාරියේ වැඩ බැලීමේ තනතුරු 06 සඳහා 2008 ජූලි 28 දිනැති අංක පීඊඩී/50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉන්ධන දීමනා ලෙස රු. 2,610,880 ක් ද, අංශ ප්‍රධානී තනතුරු 03 හි අධ්‍යක්ෂවරයෙකු වෙනුවෙන් ප්‍රවාහන දීමනා වශයෙන් 2015 සිට 2017 වර්ෂය දක්වා රු. 4,210,000 ක් ද ගෙවා තිබුණි.

(ඉ) සුළං මාපක කුළුණු නඩත්තු කිරීම, කුළුණු මඟින් දත්ත එකතු කිරීම, මෘදුකාංග මඟින් දත්ත සකස් කිරීම හා ලිපිගොනු පවත්වාගෙන යාම යනාදී සියලු කාර්යයන් 2017 වර්ෂය ආරම්භයේ සිටම එක් තාක්ෂණික නිලධාරියෙකුට පමණක් සීමා වීම නිසා 2017 වර්ෂය

සඳහා සැලසුම් කළ කාර්යසාධන ඉලක්ක ළඟා කරගැනීමට අපොහොසත් වී තිබූ අතර එය අනාගත කාර්යසාධනය කෙරෙහිද අහිතකර ලෙස බලපෑමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු හා අදාලව දැරිය හැකි සහ පිවිතුරු බලශක්ති සැපයුම සම්බන්ධයෙන් "2030" න්‍යාය පත්‍රයට අනුව ඉලක්ක හඳුනා ගැනීම් හා එම ඉලක්ක හා ඉටු කර ගැනීම් අතර විචලනයන් හා ප්‍රගතිය මැනීමේ සුදුසු නිර්නායක ක්‍රියාකාරී සැලැස්ම තුළින් හඳුනා ගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

5.1.1 ප්‍රසම්පාදනයන්

අධිකාරිය විසින් වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදනයන් සඳහා රු.මිලියන 341.409 ක් ප්‍රසම්පාදන සැලැස්මෙන් ඇස්තමේන්තු කර තිබුණද වර්ෂය තුලදී සැලසුම්ගත ප්‍රසම්පාදනයෙන් රු.මිලියන 94.476 ක ප්‍රසම්පාදන කටයුතු පමණක් සිදු කර තිබුණි. ඒ අනුව අධිකාරිය ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ දී ආයතනයේ අවශ්‍යතාවයන් ඉක්මවා ඇස්තමේන්තු සකස්කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මේ දී කාල රාමුවන් හඳුනාගෙන තිබුණ ද එම කාල සීමාවන් තුල ක්‍රමානුකූලව ප්‍රසම්පාදනයන් සිදු කර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව සැපයුම් 50 සිදු කිරීමට සැලසුම් කර තිබුණද සැපයුම් 06 ක් පමණක් සිදුකර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	විවිධ වැය ශීර්ෂ යටතේ දරන ලද වියදම් විශ්ලේෂණය කිරීමට හැකිවන පරිදි පරිගණකගත ලෙජරයන් හඳුන්වා නොදීම
(ආ) මූල්‍ය පාලනය	(i) නිශ්ක්‍රීය මුදල් ශේෂයන් පැවතීම. (ii) වැටුප් ලේඛන පිලියෙල කිරීම, පරීක්ෂා කිරීම සහ වැටුප් චෙක්පත් අත්සන් කිරීම පිළිබඳ මනා වැඩ බෙදීමක් කර නොතිබීම. (iii) චෙක්පත් සඳහා අත්සන් කරන නිලධාරීන් නම් කිරීමේ දී කිසිදු මූල්‍ය සීමාවක් පැනවීමෙන් තොරව චෙක්පත්වලට අත්සන් කිරීමේ බලතල පවරා තිබීම. (iv) ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම, චෙක්පත් අත්සන් කිරීම, වැටුප් ලේඛන පිලියෙල කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශ පිලියෙල කිරීම යන කාර්යයන් වෙන් වෙන් පුද්ගලයින් වෙත පවරා නොතිබීම. (v) ජර්නල් වවුචර්පත් සඳහා පරීක්ෂා කල බවට හා අනුමත කල බවට අත්සන් කර නොතිබීම.ජර්නල් සටහන් සනාථ කරන ලියවිලි ජර්නල් වවුචරයට අමුණා නොතිබීම.
(ඇ) ණයගැති පාලනය	ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු මුදල් අප්‍රමාදව එකතුකර නොගැනීම.
(ඈ) මානව සම්පත් කළමනාකරණය	අධිකාරියේ .අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ කාර්යභාරය හා ප්‍රමාණය අනුව මානව සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කර නොගැනීම.

(ඉ)	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම සඳහා ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කළ පරිදි කාර්යක්ෂමව හා අප්‍රමාදව ක්‍රියාත්මක නොකිරීම.
(ඊ)	වත්කම් කළමනාකරණය	(i) දේපල, පිරියත හා උපකරණ අගය කිරීම, ලේඛන ගත කිරීම, ක්‍රමානුකූලව සිදු නොවීම හා ඒවා අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය නොකිරීම. (ii) ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තු නොකිරීම. (iii) අංශ අතර ස්ථාවර වත්කම් ලැබීමේ ලේඛණ හා නිකුත් කිරීමේ ලේඛන පවත්වා නොගැනීම.
(උ)	තොරතුරු පද්ධති කළමනාකරණය	දත්ත හා තොරතුරු ආරක්ෂා කරගැනීමේ වැඩපිළිවෙලක් නොමැති වීම.
(ඌ)	වාහන පාලනය	2014 වර්ෂයෙන් පසුව ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

<u>ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගනුදෙනු සඳහා විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු</u>

2.1 මූල්‍යප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

2.3 <u>ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්</u>

RCL මධ්‍යස්ථානය පදනම් කරගනිමින් ගෙවන ලද රු. 8,033,270/= ක හිඟ මුදල අමාත්‍යාංශයේ පැවති විගනන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවීමට එකඟ විය.

2.4<u>නීතිරීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

(අ) අප ආයතනයේ ගොඩනැගිල්ල වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් වාර්ෂිකව රුපියල් මිලියන 40 කට අධික ප්‍රමාණයක් දරණු ලැබේ. එබැවින් අප සතු ගොඩනැගිල්ලක් ඉදි කිරීමට 2015 දී තීරණය කරනු ලැබූ අතර, එහි පළමු පියවර ලෙස ඉඩම මිලදී ගැනීම වෙනුවෙන් රු. 54,263,517/= ක් ආයතනයේ මුදලින් දැරූ නමුත් ඉදිරියේ දී ADB ආයතනය සමගමෙමව්‍යාපෘතියකිරීමේදී මෙම මුදල ප්‍රතිපූර්ණය කිරීමට බලාපොරොත්තු වේ.

(ආ) (i) බඩු ලේඛන පොත් පවත්වාගෙන යනු ලැබේ.

(ii) 2017 වර්ෂය සඳහා වත්කම් භෞතික සත්‍යාපනය මේ වනවිට නිම කර ඇත.

(ඇ) (i) 2016 වසර සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා පිළියෙල කර නොතිබුනු අතර, 2016-2017 වසර දෙක සඳහාම භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මේ වන විට පිළියෙල කර අවසන් බැවින් මෙය 2018 දී නිවැරදි කිරීමට හැකි වනු ඇත.

(ii) පරිගණක,
උපාංගහාමෘදුකාංගසම්බන්ධයෙන්ස්ථාවරවත්කම්ලේඛනපවත්වාගෙනතිබේ.

(ඇ) 2012 අයවැය යෝජනා අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අනුයුක්ත නිලධාරීන් සඳහා 2012/01/01 සිට මාසිකව රු. 15,000/= ක දීමනාවක් ගෙවිය යුතු බවට මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇති වී රාජ්‍ය පරිපාලන හා රාජ්‍ය ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් 2011/12/12 දිනැති 28/2011 චක්‍රලේඛනය මඟින් උපදෙස් දී ඇත.

සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සේවයේ නියුතු ඉංජිනේරුවරුන් සඳහා ඉහත සඳහන් වෘත්තීය දීමනාව සඳහා හිමිකම් ඉල්ලා ඉංජිනේරුවරුන් විසින් කරන ලද ඉල්ලීම එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ලේකම් ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම්තුමා විසින් මෙම වෘත්තීය දීමනාව මෙම අධිකාරියේ ඉංජිනේරුවන් හට ගෙවීම නිර්දේශ කර අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර තිබේ.

මෙම චක්‍රලේඛනය පදනම් කරගෙන 2016/07/08 පැවැති මෙම අධිකාරයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඉංජිනේරුවරු සඳහා වෘත්තීය දීමනාව මෙම අධිකාරියේ ඉජිනේරුවරුන්ට ද ගෙවීම අනුමත කර ඇත.

කෙසේ වෙතත් ඉන් පසුව පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී (2016/08/09) අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සනාථ කරන අවස්ථාවේ දී ඉහත සඳහන් වෘත්තීය දීමනා ගෙවීමේ තීරණය අත්හිටවා, කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබාගන්නා ලෙස සටහන් කර තිබූ නමුත්ඊලඟ රැස්වීමේ දී (2016/10/06) මෙම දීමනාව ගෙවීම නතර නොකර එයට අදාල අනුමැතිය කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලෙසට තීරණය කරන ලදි .

ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත වෘත්තීය දීමනා ගෙවීමේ ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

එනමුදු මේ සඳහා විධිමත් අනුමැතියක් මේ දක්වා ලබාදී නොමැති අතර, ඒ ගැන සලකා බලා පිළිතුරක් ලබාදෙන බව කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇත.

මේ සම්බන්ධව දිගින් දිගටම පැන නැගුණු තත්වය හමුවේ 2017/08/15 ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සම්බන්ධ රැස්වීමේ දී මෙම දීමනාව සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර, එහි දී අදාල අනුමැතිය කඩිනමින් ලබාගන්නා ලෙසටත් එතෙක් මෙම දීමනාව තවදුරටත් ගෙවීමට කටයුතු කිරීමටත් උපදෙස් දී තිබේ.

කළමනාකාර සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ප්‍රමාදය හේතුකොටගෙන ඉංජිනේරුවරුන් තුල ඇති විය හැකි නොසන්සුන්තාවය මගහැරීම සඳහා අමාත්‍යාංශ

මණ්ඩලය සංදේශයක් මගින් විශේෂ අනුමැතියක් ලබාගැනීමට මෙම අධිකාරිය මේ වන විට කටයුතු කොට ඇත.

2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) කාර්යමණ්ඩලය වෙත ගෙවන ලද මෙම දීමනාව වෙනුවෙන් එකඟතාවය ඉල්ලා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් මගින් 2012.12.05 දින භාණ්ඩාගාරය වෙත ලිපියක් යවන ලදී. තවද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ උපදෙස් අංක 13 පරිදි පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම් හරහා ද 2013.01.04 දින භාණ්ඩාගාර එකඟතාවය ඉල්ලා ලිපියක් යවා ඇති අතර, තවදුරටත් මේ පිළිබඳව සම්පූර්ණ විස්තර ඇතුලත් ලිපියක් 2014.12.02 දින පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම් හරහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. එහි පිටපත් භාණ්ඩාගාරය හා විගනකාධිපති වෙත ද යොමු කර ඇත. තව ද මේ පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් අනුමැතිය ඉල්ලා භාණ්ඩාගාරය වෙත ලිපියක් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් මගින් 2016.12.06 දින යොමු කර ඇත.

තව ද විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් තුමා විසින් 2012.03.08 දින මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මේ පිළිබඳව කරුණු පැහැදිලි කරමින් අනුමැතිය ඉල්ලා ලිපියක් යවා ඇත. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි විදේශ ව්‍යාපෘතියකින් වෘත්තීය දීමනාව ලෙස එම ව්‍යාපෘතිය සඳහා දායක වූ වෘත්තිකයන්ට ලැබුණු මුදල් එම ව්‍යාපෘතිය සාර්ථක කිරීමට දායක වූ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සේවකයින් අතර බෙදා හැර ඇති ආකාරය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් 2017 නොවැම්බර් 06 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

(ආ) 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ 52(4) වගන්තියට අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව අදාළ වැටුප් ගෙවීම තීරණය කර ඇත. එසේ වුවද දෙවන වර දීර්ඝ කිරීම සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අභිමතය/ අනුමැතිය ඉල්ලා ඇත.

3.0 මෙහෙයුම්සමාලෝචනය

3.1.1 සැලසුම් කිරීම

(අ) **සංයුක්ත සැලැස්ම**

ආයතනය ආරම්භයේදී සකස් කරන ලද සංයුක්ත සැළැස්ම අනුව, ආයතනයේ දිගුකාලීන දැක්ම සහ මෙහෙවර පාදක කර ගෙන රටෙහි බලශක්ති සුරක්ෂිතතාවය අරමුණු කරගෙන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. 2015 - 2025 සඳහා දස වසරක සැලැස්මක් ආයතනය විසින් සම්පාදනය කර ඇති අතර ඒ යටතේ හඳුනාගන්නා ලද වැඩසටහන් පාදක කරගෙන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.තවද, අමාත්‍යාංශය මඟින් වරින්වර ලැබෙන උපදෙස් මත එක් එක් කාලයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම පසුබිම තුළ ආයතනය සඳහා නව සංයුක්ත සැලැස්මක් සෑදීම සිදු නොකරන ලද අතර, රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2014 මඟින් ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් අවශ්‍ය නොවන බව නිගමනය කරන ලදී.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කර අදාළ වාර්තාව සම්පාදනය කර ඇති අතර, වාර්ෂික මහ බැංකු වාර්තාව සඳහා පාදක කර ගැනීම උදෙසා එම වාර්තාව, අමාත්‍යාංශය හරහා මහ බැංකුව වෙත යවා ඇත.

(ඇ) මානව සම්පත් සංවර්ධන සැලැස්ම

ආයතනික බඳවාගැනීම් පටිපාටිය සකස් වූ පසු කාර්යසාධනය පදනම් කරගත් පුහුණුසැලැස්මක් හා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට පියවර ගනු ලැබේ.

3.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

(අ) බලශක්ති විගනනය හා බලශක්ති සේවා සැපයීම

1. දෝෂ සහිත උපකරණ සහ ක්‍රමාංකනය කළ යුතු උපකරණ හඳුනාගෙන තිබුණු අතර එහිදී දෝෂ සහිත උපකරණ අලුත්වැඩියාව සඳහා අදාල උපකරණවල නියෝජිතයන් මඟින්ම සිදුකළ යුතු අතර, සමහර උපකරණවල ක්‍රමාංකනයන් විදේශ රටවලින් පමණක් සිදුකළ යුතුව ඇත. ඒ සඳහා අධික වියදමක් දැරීමට සිදුවන බැවින් ඒ වෙනුවට එම උපකරණ අලුතින් මිලදී ගැනීමට කටයුතු කරමින් පවතී. ඇතැම් උපකරණ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ක්‍රමාංකනය කර නිරවද්‍යතාවය සහතික කර ඇත.

2. දෝෂසහිතඋපකරණ 2017 වර්ෂයේදී හඳුනාගෙන ප්‍රසම්පාදනය සඳහා අවශ්‍යකටයුතු සිදුකරනු ලැබීය. නමුත් ප්‍රසම්පාදනයේදී සිදුවූ ප්‍රමාදය හේතුවෙන් 2017 වර්ෂයේදී හඳුනාගත් දෝෂ සහිත උපකරණ මිලදී ගැනීමට අවශ්‍යකටයුතු යොදා ඇත'

3. එම උපකරණ භාවිතා කරනුයේ, බලශක්ති කාර්යක්ෂමතා සේවා සපයන ආයතන ^ESCO& බලශක්ති කළමනාකරණ, කර්මාන්ත, රජයේ ආයතන සහ විශ්වවිද්‍යාල සිසුන් සඳහා සාධාරණ මිලට මෙම උපකරණ ලබාදෙනු ලැබේ. මෙහිදී බලශක්ති විගණන කටයුතු සඳහා^ESCO&විශාල කාර්යය භාරයක් ඉටු කරන අතර, ඔවුන් මෙම සේවා ලබාදෙන්නේ ලාභදායී නොවන ව්‍යාපාරයක් වශයෙනි. එම නිසා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඔවුන්ව දිරිමත් කිරීමේ අරමුණ ඇතිව සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහල නැංවීම අරඹයා මෙම සේවාව පුළුල් කරමින් රටේ බලශක්ති කාර්යක්ෂමතාව ඉහල නැංවීමට කටයුතු කරමින් සිටී. ඉහත කරුණු පදනම් කරගෙන මෙම උපකරණ කුලියට දීමේ දී අයකරන මුදල 2010 වසරේ සිට සංශෝධනයක් කිරීම සිදු නොකිරිනී.

4. සංශෝධනය කරන ලද ආයතන බඳවාගැනීමේ පටිපාටිය තුලින් ඉදිරියේදී කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය වන සේවාවන් සැපයීම, දත්ත ලබාගැනීම සහ නඩත්තු කටයුතු වෙනුවෙන් නිලධාරීන් බඳවා ගැනීමට නියමිතය. එමගින් සඳහන් කරන ලද අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු යොදා ඇත'

(ආ)ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

i. RE/03/01 – Study on a Smart Grid

ස්මාර්ට් ග්‍රිඩ් සිස්ටම් එකක් හඳුන්වා දීම සඳහා ඊට අදාල ආයතන සමග මූලික සාකච්ඡා සිදුකර සුහුරු ජාල පද්ධතියකින් සිදුවන කාර්යය එවැනි පද්ධතියක් ස්ථාපිකරණ ආකාරය පිළිබඳ මූලික අධ්‍යනයක් සිදුකර ඇත. ස්මාර්ට් පද්ධතියක් පවතින පද්ධතියකට හඳුන්වාදීමේ දී මූලික වශයෙන්ම පවතින පද්ධතිය අළුත්වැඩියා කිරිමේ කාර්ය තාක්ෂණයට ගැලපෙන පරිදි සිදුවිය යුතුය.නව පද්ධතිය සැකසීම ආදී ප්‍රායෝගික කරුණු සැලකිල්ලට ගැනීමේදී, මෙම පද්ධතිය පවතින පද්ධතියකට වඩා නව ඉදිකිරීම් සඳහා හඳුන්වාදීම පහසුවේ. නමුත් ස්මාර්ට් ග්‍රිඩ් සිස්ටම් එකක් පවතින පද්ධතියකට අනුගත කිරීම ප්‍රායෝගික වශයෙන් ඉතා සංකීර්ණ කාර්යයක් සිදුකිරීමට ඇති බැවින් මෙය ක්‍රමාණුකූළව සිදුකල යුතු කාර්යක් බව හඳුනා ගන්නා ලදි.

ii. **RE/08 – IFC Solar Project**

මහාපරිමාණ, පුනර්ජනනීයව්‍යාපෘතිආරම්භකිරීමසඳහාමුදල්වෙන්කරගත්ත ද,මෙමකාර්යසඳහාපුනරින් ප්‍රදේශයේව්‍යාපෘතියක්ද,මොනරාගලප්‍රදේශයේව්‍යාපෘතියක්දආරම්භකරනලදී . මේසඳහාවිශාලමුදල්ප්‍රමාණයක්වැයවනඅතර,ව්‍යාපෘතිආයෝජකයන් මෙහි ආයෝජනය සඳහා ආකර්ෂණයකිරීමහාජාත්‍යන්තරවශයෙන් ආයෝජකයන් මෙහි ආයෝජකයන් ගෙන්වා ගැනීමට ගත් පියවරක් ලෙස මේ සඳහා IFC ආයතනය සම්බන්ධ විය. ඒ අනුවIFC ආයතනය සමඟ කෙටිකාලයක් මෙම ව්‍යාපෘති කටයුතු සිදු කලද එම ආයතනයේ සහයෝගය දීම හදිසියේ නතර වූ නිසා අප වෙන්කල මුදල් ද වියදම් කිරීමට නියමිත කාලයට නොහැකි විය.

iii. **RE/10 – Hambantota Solar Park**

හම්බන්තොටප්‍රදේශයේපුනර්ජනනීයබලශක්තිඋද්‍යානයක්ස්ථාපිතකිරීමසඳහාමුදල්වෙන්කරගත්තද , ඉඩම්බලශක්තිසංවර්ධනප්‍රදේශයක්ලෙසප්‍රකාශයටපත්කලද,හම්බන්තොටඇතිවූනවසංවර්ධන සැලැස්ම මත අපගේ ව්‍යාපෘති සඳහා කටයුතු කිරීමට නොහැකි විය.

iv. **EM/05 – Sector Specific Programs**

EM/05/02 – Improvement of Energy Utilization Efficiency in HotelSector

මෙම වැඩසටහන මධ්‍යම, දකුණු හා ඌව පළාත් වලින් එක් පළාතක් තෝරා එක් වැඩසටහනක් කලින් කිරීමට සැලසුම් කර තිබුණි.මෙය අප සැලසුම් කළ පරිදි, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි වී ඇති පුහුණු වැඩසටහන් කරන ආයතන වලින් ප්‍රසම්පාදන ක්‍රමවේදය (LNB)/ Consultancy Services(QCBS) යටතේ තෝරා ගැනීමට නියමිතව තිබූ අතර එය සඳහා යන වියදම රු මිලියන 02කට වැඩි බව අප කල ඇස්තමේන්තු වලට අනුව නිගමනය විය. නමුත් 2017 – Budget (අයවැය) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට මහ භාණ්ඩාගාරයෙන් ලැබුණු අඩු කිරීම් යටතේ ලැබුණු මුදල රු. මිලියන 1.5 කි. මෙම වැඩසටහන නේවාසික (Residential) වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුන ද, මෙයට යන වියදම, මෙසේ ටෙන්ඩර් පටිපාටිය යටතේ කලහොත් වියදම පියවා ගැනීමට නොහැකි බව පැහැදිලි විය. මෙම නිසා මෙම වැඩසටහන, පිටස්තර ආයතනයකින් ටෙන්ඩර් පටිපාටිය යටතේ සිදු කර ගැනීමට ඇති අපහසුව නිසා, අප ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන්, බලශක්ති කළමණාකරන අංශයෙන් සිදු කිරීමට පූර්ව නිගමනය කලේය.

එසේම, බලශක්ති කළමණාකරන අංශයේ ඉංජිනේරු හා අනෙකුත් අය ඉතා සුළු පිරිසක් පමණ සේවය කරන බැවින්ද, වෙනත් කටයුතු, විගණන, උපදේශන සේවා, දැනුවත් කිරීම් ආදී කටයුතු වල යෙදීමත් නිසා මේ සඳහා කාලය සොයා ගැනීමට අපහසුවීමෙන් මෙම වැඩසටහන 2017 දී කිරීමට නොහැකි විය.

v. **EM – 06 Development of Standard Withering Trough**

ඉහත ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන්කිරීම් 2016 වසරේදී සිදු කෙරුණ ද ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා වන පත්‍රිකාව සහ අදාල අවබෝධතා ගිවිසුම් පිළියෙල කිරීම ආදී මූලික කටයුතු 2017 වසරේදී සිදුවිය. මෙය පර්යේෂණ මට්ටමේ කටයුත්තක් නිසා අදාල ව්‍යාපෘතිය පිළිබඳ තාක්ෂණ මට්ටමේ සාකච්ඡා කිහිපයක් පවත්වා අදාල වියදම් ආදියද බොහෝ දුරට නිවැරදිව තක්සේරු කර ගැනීමට තරමක කාලයක් ගතවිය. මෙම ව්‍යාපෘතිය සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුනේ 2018 පෙබරවාරි මස වන අතර ඒ සඳහා වන අවබෝධතා ගිවිසුම අත්සන් කෙරුණේ 2018 මැයි මාසයේදීය. මෙම කටයුතු කඩිනමින් අවසන් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

vi **ST- 02 Wide Petrol Shed Survey**

මෙම සමීක්ෂණය සැලසුම් කිරිමේදී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉන්ධන හල් 1500 කට වැඩි ප්‍රමාණය නිසිසේ නියෝජනය වන නියැදියක් තෝරා ගැනීමට අවශ්‍යාව තිබිණ.මෙම නියදිය නිර්ණය කිරීම සඳහා මේ පිලිබඳ 2016 වසරේ අවසන් කරන ලද නියමු සමීක්‍ෂණ දත්ත 186000ක් පමණ විශ්ලේශනය කල යුතුව තිබිණ.මේ විශ්ලේෂණය පිලිබඳ කටයුතු ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ සහයද ඇතිව අවසන් කල හැකි වූයේ 2017 වසරේදීය. එම නිසා එම සමීක්‍ෂණය එම වසරේදී ක්‍රියාත්මක කල නොහැකි විය.මෙම විශ්ලේෂණ වාර්තාව අධිකාරිය පිලියෙල කොට ඇති නිසා මෙම සමීක්‍ෂණය ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති බව කරුණාවෙන් දන්වමි.

3.2 **කලමනාකරණ ක්‍රියාකාරකම්**

(අ) නාගරික සංවර්ධන අධිකාරිය සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය අතර බදු ගිවිසුමේ 1.8 වගන්තියේ ප්‍රකාර 2015 ජූනි 22 සිට වර්ෂ දෙකක් තුල සංවර්ධන කටයුතු නිම කිරීමට අධිකාරියට නොහැකි වුවහොත් බදු ගිවිසුම අවලංගු වී බදු දේපල බදු දෙන්නාට ස්වයංක්‍රීව අයිති වන බව සඳහන් කර ඇති මුත් ඔවුන් වෙතින් ලබාගත යුතු අනුමැතීන් ලබාගැනීම සඳහා වසර දෙකක ට ආසන්න කාලයක් වැය විය. එනමුදු 2018 මාර්තු මස මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භය සනිටුහන් කිරීම පිණිස ගරු අමාත්‍ය, නියෝජ්‍ය අමාත්‍ය හා ලේකම් තුමන්ලාගේ සහභාගීත්වයෙන් මංගල පස්පිඩැල්ල කපා මුල්ගල් ස්ථාපනය කරණ ලදි.

(ආ) අධිකාරිය විසින් වාර්ෂික විශ්‍රාමික පාරිතෝෂිතය ගණනය කරණු ලබන්නේ ස්ථිර සේවයේ නියුතු සේවකයන් ගණනය කිරීමෙනි. එසේ කරණුයේ කොන්ත්‍රාත් පදනමෙන් සිටින සේවකයන් ගේ සේවා කාලය කඩින් කඩ කණ්ඩනයට ලක් කරන නිසාය. එනමුදු සේවයේ

අවශ්‍යතාවය මත මෙම නිලධාරියාගේ සේවය අඛණ්ඩව වසර 5 ක් තිබීම හේතු කොටගෙන මෙම නිලධාරියාට විශ්‍රාමික පාරිතෝෂිතය ගෙවීමට ආයතනයට සිදු විය.

(ඈ) සුනිත්‍ය බලශක්ති අධිකාරිය ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේදී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගැනීමට නොහැකි බව තීරණය කර ඇත. නව විමර්ශන කමිටුවක් පත්කර එහි නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ආයතනික විගණන හා කළමනාකරණ කමිටුවේදී තීරණය විය.

(ඇ) මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ බාහිර පාර්ශව දිගින් දිගටම මෙම කාර්යභාරය මඟහරිමින් සිටින බැවින් ඔවුනට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කොට ඇත.නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි මේ සඳහා බේරුම්කරුවකුගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඇති බව කරුණාවෙන් දන්වමි.

(ඉ) සුළං සම්පත් සමීක්ෂණ වැඩසටහන යටතේ සුළං සම්පත් සිතියම සකස් කිරීම සඳහා පහත සඳහන් පියවරයන් කිහිපයක් අනුගමනය කිරීමට අවශ්‍ය වේ.

- පළමුව දත්ත එකලස් කිරීම
- දත්ත විශ්ලේෂණය
- දත්ත ප්‍රමාණයේ පරිදි අනුපිලිවෙල සකස් කිරීම
- සිතියම් සකස් කිරීමට අදාළ මුදුකාංග වලට අනුරූප ලෙස දත්ත සකස් කිරීම

මේ සඳහා ප්‍රමාණවත් කාලයක්අවශ්‍ය වේ.දැනට මෙම පිළිවෙල ඉහත පරිදි ක්‍රමානුකූලව සකස් කරමින් පවතී.ඉන් අනතුරුව ප්‍රමාණවත් කාලයකට පසුව සුළං සම්පත් විභව සිතියම සකස් කිරීමට බලාපොරොත්තු වේ.ඒ සඳහා තවත් මාස08-10 අතර කාලයක් අවශ්‍ය වේ.

(ඊ) මෙම මුදල මගින් විදුලිබලාගාර ක්‍රියාකරුවන්ට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර යොදා ගනිමින් පිරිවැය පාදක අයක්‍රම මූලධර්ම අනුව සිදුකරන ලද ගෙවීම් සහ සාමාන්‍ය උත්පාදන සංකලනයෙන් විදුලිබල උත්පාදනයේ 90% මගහරවා ගන්නා ලද පිරිවැය අතර වෙනස අදහස් කෙරේ. 2010 වර්ෂය තුලදී උපයෝගීතා ආයතනය විසින් සිදු කල අයක්‍රම ගොනු කිරීමේදී, මෙම අඩුව පුරවා ගැනීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා තිබේ. මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙම මුදල පාරිභෝගිකයන් වෙතින් අයකිරීමට 2010 වර්ෂයේදී එකග වී ඇත. ඒ සඳහා තවදුරටත් කටයුතු කිරීමට අවශ්‍ය නොවන බව අප ආයතනයේ මතයයි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) ස්විච් ඒසියා වැඩසටහන යටතේ ලැබී ඉතිරිව ඇති මුදල් කිසිඳු ආයෝජන කටයුත්තක් සඳහා මේ දක්වා යොදා නොගත්තේ මෙහි මුදල් සම්බන්ධයෙන් කෝප් කමිටුවේ මේ වන විට ප්‍රශ්න කරමින් පවතින නිසාය.

(ආ) ඔබගේ වාර්තාවේ සඳහන් පරිදි අධිකාරිය සතු 3189-54 දරණ කැබ් රථය මේ වනවිට අවුරුදු 2½ ක පමණ කාලයක් තිස්සේ නිෂ්ක්‍රීයව පවතී. 17 .06 .2015 මේ සම්බන්ධයෙන් වන දින Automobile Association of Ceylon ආයතනයෙන් තක්සේරු වාර්තාවක් ලබාගෙන ඇති අතර එහි සඳහන් පරිදි එම රථය අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන නිසා අපහරණය කිරීමට නිර්දේශ කරන බවයි. ඒ අනුව ආයතනික කළමණාකරණ මණ්ඩලය සමඟ සාකච්ඡා කොට එය අපහරණය කිරීමට 2018.02.27 දින ආයතනික ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත.මේ සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ වාර්තාව ලැබීමෙන් අනතුරුව ඉදිරි වැඩ කටයුතු සිදු කරනු ලැබේ.

ඇ) සුනිත්‍යබලශක්තිඅධිකාරියBMICH භූමියේ කුලී පදනම මත සිටින බැවින් ගබඩා පහසුකම් නැත. තවද ගලවා ඉවත් කල කොටස් හම්බන්තොටට ප්‍රවාහනය කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවේ. එබැවින්, සේවා සැපයුම් කරුගේ පරිශ්‍රයේ කුළුණු වල කොටස් අපේ අධීක්ෂණය යටතේ සුරැකිව තබා ඇත. ඒවාට කිසිදු ගෙවීමක් නොකරන අතර ඉවත් කල උපකරණද බොහොමයක් නැවත නැවත පාවිච්චි කිරීමට නොහැකි නමුත් ඒවා අධිකාරිය සතුව තිබේ.

ඇ) මෙම උපකරණ විදේශ රටවලින් මිලදී ගැනීමට සිදු වී තිබෙන නිසා කාලය ගතවී ඇත. තවද අත්‍යවශ්‍ය උපකරණ එකවර මිලදී ගත් බැවින්, රු. 1,775,025 වටිනාකමක් අවද, අත්‍යවශ්‍ය උපකරණ ලෙස රු. 915,625 ක උපකරණ නඩුකුඩා සුළං මාපක කුළුණේ සවි කර ඇති අතර අනිත් උපකරණ අවශ්‍යතාවය අනුව සවි කිරීමට අධිකාරිය සතුව පවතී.

3.4 කාර්යමණ්ඩල පරිපාලනය

(අ) බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යවා ඇත. මේ වන විට එය සංස්කරණය වෙමින් පවතී.

(ආ) මේ වන විට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා 2018.06.06 වන දින නව කාර්යමණ්ඩලයක් (170) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත. අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් නොමැති බැවින් ආයතනික බඳවා ගැනීම් කටයුතු තාවකාලිකව නවතා ඇත. නව බඳවා ගැනීමේ පටිපාටිය 2018.09.19 වන දින පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතය. අධ්‍යක්ෂ මණ්ඩල

අනුමැතියෙන් පසුව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ.

(ඇ) මෙම වැඩ බැලිමේ තනතුරු ප්‍රදානය කර ඇත්තේ ආයතනික අවශ්‍යායතාවය මත ආයතනයේ කාර්යය සාධනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන හා පළපුරුද්ද ලත් නිලධාරීන් ආයතනය හැරයෑම වැළැක්වීම සඳහායි.තවද මෙම පත්කිරීම් සහය සේවා අංශ ප්‍රධානී, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන අංශය භාරව කටයුතු කළ) හා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය සහිතව එවකට අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රධානී සභාපතිතුමන් විසින් සිදුකර ඇත.(අදාල ලිපිගොනු පරික්ෂා කිරීමෙන් මෙය තහවුරු කර ගත හැක).මේ වන විටත් ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර නොමැති බැවින් මෙම නිලධාරීන් හට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමේ අපහසුතාවය පිළිබඳ ඔබතුමන්ගේ ප්‍රධානත්වයෙන් අප කාර්යාලයේ පැවති සාකච්ඡා වලදී වාචිකවත් දැනුවත් කර ඇත. වැඩ බැලීම් පත්වීම් දීර්ඝ කිරීම් සිදුකර ඇත්තේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත වී නොමැති බැවින් ස්ථිර පත්වීම් ලබාදිය නොහැකි නිසාය. ඒ සම්බන්ධව එක් එක් නිලධාරීන් වෙත 2014.11.10 දින නිකුත් කරන ලද පත්වීම් දීර්ඝ කිරීමේ ලිපි මඟින් පවසා ඇත්තේ " ප්‍රතිව්‍යුහගත කරන වැඩසටහන අවසන් වීමෙන් පසු ඔබගේ පත්වීම් ස්ථිර කිරීම අදාළ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පරිදි සිදු කරන බව වැඩිදුරටත් දන්වමි" ලෙසයි. ඒ අනුව මේ වන විටත් ආයතනික බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වී නොමැති බැවින් එම වැඩ බැලීමේ පත්වීම් ස්ථිර කිරීමේ හැකියාවක් නොපවතී. තවද සුනිත්‍ය බලශක්ති සේවක සංගමයද පවසා සිටින්නේ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වන තුරු එම තනතුරු ස්ථිර කිරීම නොකළ යුතුය බවයි.

(ඈ) ආයතනය තුළ නිසි බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත වී නොතිබීම හේතුවෙන් ආයතනය සතු මානව සම්පත ආයතනය හැර යෑමේ අවධානමක් පැවැති අතර ආයතනික අවශ්‍යතාවය මත වැඩ බැලීමේ පත්වීම් ලබාදීමට සිදුවිය. ඒ අනුව අදාළ තනතුරුවලට අදාළව වැඩ බැලීමේ දීමනා ගෙවීමටද සිදුව ඇත. මේවන විටත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා HM-1-1 තනතුරු 14 ක අනුමතවී ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුව මෙම වැඩ බැලීමේ පත්වීම් ලබා දී ඇති නිලධාරීන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බැවින් බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කළ වහාම බඳවා ගැනීම් පටිපාටියට අනුව ස්ථිර පත්වීම් ලබා දී වැඩ බැලීමේ දීමනාව අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. තවද වැඩබැලීම් සඳහා පත්කළ නිලධාරීන්ගේ තිදෙනෙකු HM-1-1 වැටුප් කේතයට අයත්වන අතර ඔවුනට 2015/05/25 දින සිට චක්‍රලේඛ අංක PED/1/2015 මඟින් නිල වාහනයක් වෙන් කිරීම හා අදාල ඉන්ධන දීමනාව අනුමත කර ඇත. ඒ අනුව වැඩ බැලීමේ පදනම මත වාහන වෙන්කර ඇත්තේ නිලධාරීන් දෙදෙනෙකු සඳහා පමණි. (මේ වනවිට වැඩ බලන සහයසේවා, අංශ ප්‍රධානී සේවයෙන් ඉල්ලා අස්වී ඇත.)

ඉ) 2017 වසරේ දත්ත ප්‍රතිශතයක් ලෙස සැකසීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වේ. මෙම කාර්ය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති අතර 2016 සිට ආයතනයේ බඳවා ගැනීමේපටිපාටිය සැදෙන බැවින් මෙම ක්‍රියාවලිය සඳහා මිනිස් ශ්‍රමය ලබාගත නොහැකි මට්ටමක් ඇත.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසාර සංවර්ධනඅරමුණු ලඟා කර ගැනීම

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු ළගාකරගැනීම සඳහා බලශක්ති සංරක්ෂණය හා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය යන ක්‍රියාදාම දෙකම වැදගත්වේ. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන සමස්ථ ව්‍යාපෘතින් හා වැඩසටහන් එම ක්ෂේත්‍ර දෙක ආවරණය වනසේ සිදුකරන නිසා, ආයතනය මගින් සිදුකරන සියලුම වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු ළගාකර ගැනීම සඳහා දායක වනු ඇත.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

(අ) ප්‍රසම්පාදන සැලසුම පිලියෙල කරනු ලැබුවේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුවය. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් සාධක වල ඌණතා නිසා එම සැලැස්ම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් මෙම ඌණ යෝජනය සිදුවී ඇත. මෙම තත්වය සලකාබලා සැලසුම් පිළියෙල කිරීමට මින් ඉදිරියට කටයුතු කරන බව කරුණාවෙන් දන්වමි.

(ආ) ආයතනයේ පූර්ණ ධාරිතාවය සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට නොහැකි වී ඇත.ඒ නිසා කාලානුරූපව සැලසුම් ක්‍රියාත්මක කිරීමට උග්‍ර ගැටළු පැන නැගී ඇත.බඳවාගැනීමේ පටිපාටියට අනුමැතිය ලැබී සේවක සංඛ්‍යාව අවශ්‍ය තරමට වර්ධනය වූ පසු මෙම තත්වය නිවැරදි වනු ඇති බව කරුණාවෙන් දන්වමි.

(ඇ) අධිකාරිය විවිධ ක්ෂෙත්‍ර ගණනාවක් හරහා සේවා සම්පාදනය කරන නිසා විවිධ ආයතනයන්, අමාත්‍යාංශ හා වෙනත් පාර්ශව විසින් යොමු කරවන්නා වූ වැඩසටහන් වලට යොමු වීමට සිදු වී ඇත.මෙම කාර්යන් වසර එලඹීමට පෙර පිලියෙල කරනු ලබන වාර්ෂික සැලැස්මක හෝ ප්‍රසම්පාදන සැලසුමක අන්තර්ගත කිරිම උගහටය. මෙම පරිභාහිර ක්‍රියාකාරකම් පාලනය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව කරුණාවෙන් දන්වමි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

(අ) මේ වන විට පරිගණක ගත ලෙජරයක් හඳුන්වාදීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති අතර, ඉදිරි සති දෙක තුල දී ඔවුන් විසින් මෙම මෘදුකාංගය ආයතනයට හඳුන්වාදීමට නියමිතය.

(ආ)

(i) ඉදිරියේදී මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට එම මුදල් ආයෝජනය කිරීමටකටයුතු සිදු කරමින් පවතී.

(ii) වැටුප් ලේඛන පිළියෙල කිරීම මූල්‍ය අංශයෙන් සිදු කරනු ලබනුයේ පාලන අංශය විසින් දෙනු ලබන දත්ත උදා:- මූලිකවැටුප්, වැටුප්වර්ධක, පඩිරහිතනිවාඩුසිටිනසේවකයන්ගේදත්ත, දීමනාපදනම්කරගෙනය.

වැටුප් හා අදාලව මූලාශ්‍ර ලේඛන පිළියෙල කිරීම හා පරීක්ෂා කිරීම කණිෂ්ඨ වෘත්තික මූල්‍ය සිදු කරන අතර, එය පරීක්ෂා කිරීමේ දී කළමනාකාර සහායිකාවගේ ද උපකාර ලබාගනු ලැබේ. එබැවින් ඇයගේ ද අත්සන මින් ඉදිරියට ලේඛන වල යෙදීමට ක්‍රමවේදයක් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙහි වැටුප් චෙක් පත් අත්සන් කිරීම සෑම විටම අංශ ප්‍රධානී මූල්‍ය සමඟ වෙනත් චෙක් පත් අත්සන් කිරීම සඳහා බලතල ඇති නිලධාරි මහතකු විසින් කරන අතර, මේ සඳහා කිසිවිටකත් කනිෂ්ඨ වෘත්තික මූල්‍ය විසින් සිදු කරනු නොලැබේ.

තව ද, මෙම සියළුම කටයුතු මොවුන් දෙදෙනාට සිදු කිරීමට සිදුව ඇත්තේ බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගන්නා තෙක් පමණි. අනුමැතිය ලද පසු පවතින පුරප්පාඩු වලට නව නිලධාරින් බඳවා ගැනීමත් සමග මෙය යථා තත්ත්වයට පත් කළ හැක.

(iii) 2007 ආයතන ආරම්භයේ සිටම මූල්‍ය අගය පදනම් කරගෙන චෙක්පත් අත්සන් කරන ක්‍රමවේදයකට යොමු වී නොමැති අතර, 2019 බලතල බෙදී යාමේ ලේඛනය (Delegation of Authority)පිළියෙලකිරීමේදීමෙයනිවැරදිකිරීමටකටයුතුකරනුලැබේ.

(iv) ගෙවීම් වව්චර් පරීක්ෂා කිරීම, චෙක්පත් අත්සන් කිරීම, වැටුප් ලේඛන පිළියෙල කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම යන කර්තව්‍ය සියල්ල කණිෂ්ඨ වෘත්තික (මූල්‍ය) ට කිරීමට සිදුව ඇත්තේ දැනට විධායක ශ්‍රේණියේ එක් තනතුරක් පමණක් පවතින නිසාවෙනි. දැනට බඳවාගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදේශනයන්ට

යටත්ව සැකසෙමින් පවතින නිසා එය අනුමත වූ පසුව පවතින පුරප්පාඩුවලට නියමිත බඳවාගැනීමෙන් පසුව මෙම වැඩ බෙදීම නිසියාකාරව සිදු කිරීමට හැකිවනු ඇතයි අපේක්ෂා කරමි.

(v) ඔබ විසින් පෙන්වා දී ඇති සියලුම ජර්නල් වව්චර් දසනායක මහතා අංශ ප්‍රධානීව සිටි කාලයේ ඔහු විසින් අත්සන් කළ යුතු ඒවාය. එනමුදු එය ගිණුම් ගත කරන විට එහි ඔහු විසින් අත්සන් තැබීම ප්‍රතික්ෂේප කරන ලදි. එනමුදු මූල්‍ය වාර්තාව පිළියෙල කිරීමේ දී ඒවා නිවැරදි කර සටහන් තබා ඇත. මින් ඉදිරියට ජර්නල් වවුචර් පිළියෙල කළ දිනයේම ඒවාට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට උපදෙස් දෙන ලදී.

(ඈ) අප ආයතනය සතුව ණයගැතියන් ලෙස පවතින්නේ ලංකා විදුලිබල මණ්ඩලය පමණක් වන අතර, වෙනත් ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා එම ආයතන වලට ලිපි යොමුකර කටයුතු කර ඇත.

(ඇ) ආයතනික බඳවාගැනීම් පටිපාටිය සකස් වූ පසු කාර්යසාධනය පදනම් කරගත් පුහුණු සැලැස්මක් හා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට පියවර ගනු ලැබේ

(ඉ) අදාළ වසර තුළදී ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර කිහිපවරක් වෙනස් වූ නිසා වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අසීරුවේ. එම නිසා ව්‍යාපෘති කාර්යයන් සැලසුම් කළ පරිදි කාර්යක්ෂම ලෙස සිදු කිරීම සඳහා එමඟින් බලපෑමක් ඇතිවී ඇත.

(ඊ) වත්කම් කළමනාකරණය පිළිබඳ විගණකාධිපතිතුමා විසින් දක්වා ඇති නිරීක්ෂණයන්ට අවධානය යොමුකර හැකිතාක් කාර්යක්‍ෂමව කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

(උ) නව ආයතනික බඳවාගැනීම් පටිපාටියෙහි තොරතුරු තාක්‍ෂණ අංශයක් වෙනමම ඇති අතර එය ස්ථාපිත කිරීමෙන් පසු මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගනු ලැබේ.

(ඌ) ඉන්ධන තුළනය පිළිබඳ වන වාර්තාව 2018 වර්ෂයට අදාළව සිදුකර ආයතනික අභ්‍යන්තර විගණන අංශයට ඉදිරිපත් කර ඇත. මින් ඉදිරියට වාර්ෂිකව අදාළ තුළනයන් සිදු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

මගේ අංකය / எனது இல. / My No. පීඕඊ/ඊ/එස්එල්එස්ඊඒ/එෆ්එස්/01/2017/07   ඔබේ අංකය / உமது இல. / Your No.   දිනය / திகதி / Date 2019 ජුනි 28 දින

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 50(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මකකරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා **1971** අංක **38** දරන මුදල් පනතේ **13** වගන්තියේ **(3)** හා **(4)** උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ දී අධිකාරිය විසින් දෙවරක්ම එනම් 2018 අප්‍රේල් 27 හා 2018 සැප්තැම්බර් 14 දිනයන්හි විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හේතුවෙන් ප්‍රතික්ෂේප කරන ලදි. ඉන්පසු නියමිත පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ මාස 11ක ප්‍රමාදයකින් පසුව 2019 ජනවාරි 17 දිනදීය.

2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කළ හැකි දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ හෙළිදරව් කළ යුතු වුවත් අධිකාරිය විසින් 2017 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ ක්ෂය කර ඇති රු. 382,274,438 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් එසේ හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම, ඇස්තමේන්තුකරණ දෝෂයක් වේ නම් එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 03 ප්‍රකාරව නිවැරදි කර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට ද කටයුතු කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති පහත සඳහන් අඩුපාඩු 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදි වී නොමැති බව නිරීක්ෂණය විය.

(i) සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ඊට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා දිගුකාලීන බදු පදනම මත රු.45,856,451 ක් වැය කර 2015 වර්ෂයේදී ඉඩමක් මිලදී ගෙන තිබූ අතර ඉඩම බදු ගැනීම වෙනුවෙන් බලශක්ති අරමුදලින් ලබා ගත් රු. 47,000,000 ක මුදල ප්‍රාග්ධන ලැබීම් ලෙස නොව අයභාර ලැබීමක් ලෙස හඳුනාගෙන 2015 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයෙහි වෙනත් ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි. මේ හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු. 47,000,000 කින් අධිගණනය වී තිබුණි.

(ii) අධිකාරිය විසින් ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.60,000,000 ක මුදලින් දරන ලද ප්‍රාග්ධන වියදම් අඩුකර ශේෂය අයභාර ආදායමක් ලෙස මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයට බැර කරනු ලබන අතර මෙහිදී අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද රු.8,345,683 ක වියදම වෙනුවට සාවද්‍ය ලෙස රු.9,242,483 ක් අඩු කර ඉතිරි රු. 41,247,949 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට බැර කිරීම හේතුවෙන් රු. 896,800 ක් අඩුවෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය බැර වී තිබුණි.එම නිසා 2016 වර්ෂයේ අතිරික්තය එම වටිනාකමෙන්ම අඩුවෙන් ගිණුම් ගත වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී ද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ණය ආපසු අයකර ගැනීමේ වගකීම අධිකාරියට නොපැවරුණු රු. 51,800,357 ක් වූ ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක තිරසාර බලශක්ති අංශය අදියර 2 ව්‍යාපෘතිය හා පිවිතුරු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිකුත් කරන ලද ණය, අධිකාරිය විසින් ලබා ගත් ණයක් ලෙස ජංගම නොවන බැරකම් යටතේ මූල්‍යතත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(ඉ) ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක තිරසාර බලශක්ති අංශය අදියර 2 ව්‍යාපෘතිය හා පිවිතුරු බලශක්තිය සහ ජාල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතීන් සඳහා වෙනම ව්‍යාපෘති ගිණුම් පිළියෙල කළද එම ව්‍යාපෘතීන්වලට අදාල ආදායම් රු. 135,957,929 ක් හා වියදම් රු. 136,200,932 ක් 2017 වර්ෂයේ අධිකාරියේ ආදායම් ප්‍රකාශනයේ මෙහෙයුම් නොවන ආදායම් සහ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදනය කිරීමේ දී අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුලත් ක්ෂය ප්‍රතිපත්තියෙන් බැහැරව කටයුතු කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දී බලශක්ති අරමුදලට බැර කල යුතු ආදායම රු. 29,541,196 ක් හා ඇප අරමුදලට බැර කල යුතු රු. 7,963,788 ක පොලී ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුලත් කිරීම නිසා වර්ෂයේ අතිරික්තය රු. 37,504,984 කින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

2.3 පැහැදිළි නොකළ වෙනස්කම්

ඇප අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය හා එදිනට ආයෝජනයේ ශේෂය අතර රු. 372,333 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය.

2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ දී පළාත් 09 වෙනුවෙන් අධ්‍යාපන කලාප වැඩ සටහන් සඳහා දැනුම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.13,348,087 ක් අත්තිකාරම් ලබා දී තිබූ අතර එයින් රු.6,882,412 ක අත්තිකාරම් මුදල් 2017 දෙසැම්බර් 31 දින දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ගෙවීම් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු. 7,280,210 ක් අතරින් රු. 3,052,237 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිටද රු. 4,227,973ක ගෙවිය යුතු ගෙවීම් තුල ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 173,696 ක් ද ඇතුලත්ව වර්ෂ 01 සිට 04 ක කාලයක සිටද, ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර මෙම මුදල නිරවුල් කිරීමට හෝ ඒ සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

උපචිත වියදම් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු. 11,842,517 ක් අතරින් රු. 7,322,281 ක් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණ ද එම මුදල නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

2.5 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

නීතිරීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව	අනුකූල නොවීම්
(අ) භාණ්ඩාගාර චක්‍රලේඛ	
(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක **842** දරන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු.**1,929,329,521** ක් වූ ස්ථාවර වත්කම් සඳහා ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/**2002/02** දරන චක්‍රලේඛය	වටිනාකම රු. **6,631,346** ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	
2003 ජුනි **02** දිනැති අංක PED/12 දරන චක්‍රලේඛය	මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. **51,702,295** ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.**6,463,693** ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.**45,238,602** ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වාර්තාවේ **2.1.3** (එ) ඡේදයේ දක්වා ඇති එකතු වටිනාකම රු. **37,504,984** ක්වූ වැරදි ගිණුම්කරණය මෙලෙස මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් පෙන්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 දායකත්වය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී අඛණ්ඩව අතිරික්තයන් ලබා තිබුණ ද 2013 සහ 2014 වර්ෂයන් අතර එය සියයට 68 කින් පහත බැස තිබුණි. එසේ වුවද සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ක්ෂය සැලකීමේදී අධිකාරියේ 2014 වර්ෂය තුල 2013 ට සාපේක්ෂව දායකත්වයේ අඩු වීම සියයට 5 ක් විය. 2015 දී එය 2014 ට සාපේක්ෂව සියයට 18කින් වැඩිවී තිබුණි. 2016 වර්ෂයේ දී දායකත්වය 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 22 ක අඩු වීමක් නිරීක්ෂණය වූ අතර, 2.1.3 (අ)(i) ඡේදයේ දක්වා ඇති පරිදි 2015 මූල්‍ය ප්‍රකාශනයේ සිදු වූ වැරදි ගිණුම්කරණය මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. ක්ෂයවීම් රු. මිලියන 32 කින් අඩුවීම සහ 2.1.3 (එ) ඡේදයේ වැරදි ගිණුම්කරණය හේතුවෙන් අතිරික්තය රු. මිලියන 45 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂයේ දී දායකත්වය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 5 කින් වැඩිවීමට හේතු වී තිබුණි. එසේවුවද සදොස් ගිණුම්කරණ වටිනාකම ඉවත් කර ගණනය කිරීමේදී 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ දායකත්වය සියයට 11 කින් අඩුවී ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇති ක්‍රියාකාරකම් 10 න් රු. 15,948,876 ක් වටිනා ක්‍රියාකාරකම් 8ක් වර්ෂ කිහිපයක සිට ක්‍රියාත්මක නොවන බව හා ඒ සඳහා 2017 වර්ෂයේ දී ද කිසිදු වියදමක් දරා නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. මෙම වැඩ සටහන් සම්පූර්ණ කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

5. අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) අයවැය මගින් ප්‍රාග්ධන වියදම් සඳහා රු. 13,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඉන් රු. 5,674,522 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන වෙන්කිරීම් වලින් රු. 7,325,478 ක් එනම් සියයට 56 ක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර ගෙන නොතිබුණ ද,ඉහත සඳහන් ඉතිරි ප්‍රතිපාදනවලින් ගොඩනැඟිලි හා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රු. 3,701,140 ක වියදමක් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ව්‍යාපෘති **04** ට අදාලව අයවැයගත වියදම රු. **381,762,247** ක් හා සත්‍ය වියදම රු. **133,204,389** ක් වූයෙන් ප්‍රතිපාදනයෙන් රු. **248,557,858** ක් එනම් සියයට **65** ක් ඉතිරි වී ඇති බව නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී.පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

ගිණුම්කරණය

(අ) අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම පිළිබඳ සටහනක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ලෙජරය තුලනය කර වර්ෂය අවසාන ශේෂය පෙන්නුම් කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) ලෙජරයේ සටහන් කරන ලද ගිණුම් සටහන් බොහෝ අවස්ථාවලදී කපාහැර දමා තිබූ අතර ඒ සඳහා කෙටි අත්සනක් හෝ එම සටහන නැවත සටහන් කරන ලද ගිණුම හෝ සඳහන් කර නොතිබුණි.

(ඇ) **2017** වර්ෂයේ ජර්නල් වවුචර් සඳහා පරීක්ෂා කල බවට හා අනුමත කල බවට අත්සන් කර නොතිබුණු බොහෝ අවස්ථා නිරීක්ෂණය වූ අතර ජර්නල් සටහන් සනාථ කරන ලියවිලි ජර්නල් වවුචරයට අමුණා නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී වික්‍රමරත්න

විගණකාධිපති

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ආයතනයේ අභ්‍යන්තර පාලන දුර්වලතාවයක් ලෙස හඳුනාගෙන ඇති මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම යටතේ දක්වා ඇති ගිණුම්අවසන්වුවද මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම ආයතනයේ සේවකයන්ගේ හිගකම මත සිදු වුවක් වන අතර, මූල්‍ය අංශයේ ප්‍රධානියෙකු නොමැති බව ප්‍රධාන වශයෙන් බලපෑ හේතුවක් විය.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරලීම 2018 වර්ෂයේ අවස්ථා දෙකක දී සිදු කළ ද, ප්‍රමාණවත් පරිදි අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සම්පූර්ණ කර නොමැති බව උපුටා දක්වන ලද අතර, එබැවින් නිවැරදි පරිදි අනුමැතීන්ට යොමු කිරීමේ දී සැලකිය යුතු කාලයක් ගත වූ අතර, නිවැරදි අනුමැතීන් සහිත මූල්‍ය ප්‍රකාශන 2019 ජනවාරි 17 දින විගනකාධිපති තුමා වෙත යොමු කර ඉහත අතපසුවීම් හා මගහැරීම නිවැරදි කරලීමට ආයතනය කටයුතු කර ඇත.

2.2.2

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් පරිහරණය කල හැකි දේපල පිරියත උපකරණ වල දළ ධාරණ අගය ගණනය කරමින් පවතින අතර 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල එය ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

2015 වර්ෂයේ බලශක්ති අරමුදලින් ලබාගත් රු.47,000,000ක මුදල පදනම් කර ගනිමින් ආයතනය සඳහා කාර්යාලයක් ගොඩනැගීමට බදු පදනම යටතේ ඉඩමක් ලබා ගෙන ඇති අතර, එම මුදල් ලබා ගැනීම අයහාර ලැබීමක් ලෙස ගිණුම් ගත කර ඇති බැවින් 2015 වර්ෂයේ මූල්‍ය අදායම රු. 47,000,000 ප්‍රමාණයකින් අධි ගණනය වී ඇත.

විගණනයේ සඳහන් පරිදි අයහාර ලැබීමක් ලෙස හඳුනා ගෙන 2105 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා ඇති අගය මගින් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය අධි තක්සේරු වූ අගය වන රු. 47,000,000 නිසි පරිදි ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය හරහා ඉදිරි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගැලපුම් කිරීමට කටයුතු සිදු කරමි.

සුනිත්‍ය බලශක්ති අධිකාරි ගිණුම නිවැරදි කිරීමේ ජර්නල් සටහන්

රඳවාගැනීමේ සංචිත (Net surplus)	Dr	-රු. 47,000,000
ගෙවිය යුතු ගිණුම - බලශක්ති අරමුදල (Energy Fund)	Cr	-රු. 47,000,000

ii) විගණනකාධිපති වාර්ථාවේ දක්වා ඇති 2016 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත භාණ්ඩාගාර මුදල් ලැබීම් අදායම් ලෙස හඳුනා ගැනීමේදී ගණනය කිරීමේ දෝෂයක් නිසා ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම් වල අගය රු.896,800 කින් අධිගණනය කිරීම මත 2016 මූල්‍ය වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන රු.896,800 කින් ඌන තක්සේරුව සිදු වී ඇති අතර 2017

වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්ට ද එම ඌන ගණනය වූ අගය ගලපා නැත. එබැවින් 2018 වර්ෂයේ අවසාන ගිණුම් සඳහා එම අතපසු වීම නිවැරදි කිරීමට කටයුතු සිදුකිරීමට බලාපොරොත්තුවේ.

නිවැරදි කිරීමේ ජර්නල් සටහන්

- Differed Grant 2016	Dr	Rs.896,800
- Net surplus	Cr	Rs.896,800

ඇ) ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක තිරසාර බලශක්ති අංශය අදියර 2 ව්‍යාපෘතිය හා පිවිතුරු බලශක්තිය හා ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිකුත් කරන ලද ණය අධිකාරිය විසින්ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක වන අතර මෙය ජංගම නොවන බැරකම් යටතේ මූල්‍යකරණ ප්‍රකාශයේ දක්වා තිබුන විගණකාධිපතිවරයා පෙන්වා දෙන පරිදි 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු යොදා ඇත.

ඉ) ව්‍යපෘති වලට අදාල අදායම් හා වියදම් ද විගණකාධිපතිවරයා පෙන්වා දී ඇති පරිදි අදායම් ප්‍රකාශයෙන් ඉවත් කිරීමට කටයුතු යොදා ඇත.

ඊ) 2017 වර්ෂයේ දී ද පෙර වර්ෂයන් හී ක්ෂය ප්‍රතිපත්තියම අනුගමනය කළ අතර, 2017 වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන කිරීමේදී ආයතනයේ පූර්ණ වර්ෂයන් හී ලබා ගත් ක්ෂය ප්‍රතිපාදනය කල යුතු වත්කම් පිළිබද තොරතුරු ලබා ගැනීමට ඇති අපහසුතාවය මත පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට හදුනාගත්ක්ෂය ප්‍රතිපාදන මත පදනම්ව ක්ෂය ගණනය කිරීමක් සිදුකර න ලදී. ආයතනයේ වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සිදුකරන බැවින් මෙය 2019 වර්ෂය වනවිට ක්‍රමානුකූල තත්වයට පත්වනු ඇත.

උ)සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන් සඳහා පොලී අදායම ලෙස රු.37,504,984 ක මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කර ඇති අතර එම හඳුනා ගත මුදල නිවැරදි ලෙස ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය හරහා බලශක්ති සංරක්ෂණ අරමුදල හා ඇප අරමුදල වෙත බැර කර ඇත.නිවැරදි පරිදි පොලී ආදායම වෙනත් ආදායම් යටතේ ආයතනයේ ආදායම් ප්‍රමාණයට/මූල්‍ය කාර්ය ප්‍රකාශයට ලබාගත යුතු වේ. මන්ද යත් එය ආයතනයේ මුදල් හරහා ආයතනයට වර්ෂය තුල ලැබිය යුතු පොලී ආදායම බැවිනි.එය ජනනය වූවේ බලශක්ති අරමුදල හරහා සහ ඇප අරමුදලේ මුදල් භාවිතය තුලින් වන බැවින් සමස්ථ ආදායම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හරහා අදාලඅරමුදල් ගිණුම් වලට බැර කිරීම මතින් මූල්‍ය ප්‍රකාශන වලට නිවැරදි ලෙස සටහන් කිරීමක් සිදු වී ඇති බව අපගේ මතයයි.

තව ද ආයතනයේ පුනර්ජනනීය බලශක්ති ඉපයීම්/බලශක්ති කළමනාකරණඉපයීම් හා වෙනත් ආදායම් ලෙස හදුනාගත් පොළී ආදායමයනු ආයතනයේම මුදල් ප්‍රවාහයන් තුලින් ජනනය වන ආදායම් වේ. පසුගිය ගිණුම් වර්ෂ වල එම මුදල් මූල්‍ය කාර්යපාදන ප්‍රකාශයන්ට ඇතුලත් නොකරනු ලැබ ඇති අතර, ඒ හේතුවෙන් ආදායම්/ මූල්‍ය ප්‍රථිඵලය ඌන ගනනය වී ඇත. 2017 වර්ෂයේ සලකා බලනු ලැබ මුලු ආදායම මූල්‍ය ප්‍රකාශයන්ට හදුනාගෙන ඇති අතර, නිවැරදි පරිදි එම උපයාගත් ආදායම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශ හරහා ඇප අරමුදලට හා බලශක්ති අධිකාරි අරමුදල වෙත ගිණුම්ගත කිරීමක් සිදු කර ඇත.

2.3 විගනණ වාර්තාවේ පැහැදිළි නොකළ වෙනස්කම් යටතේ දක්වා ඇති ඇප අරමුදලේ ශේෂය හා ආයෝජන ශේෂය අතර පවතින රු. 372,333.00 ක වෙනස 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දි නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්.

(අ) අධ්‍යාපන කලාප වැඩසටහන සඳහා ලබාදුන් අත්තිකාරම් මුදල් පියවීමේ කාර්යය මන්දගාමීව සිදු වන බැවින් එය විධිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග සිදු කරන අතර, දැනටමත් පියවීම සිදු කිරීමට අපොහොසත් ආයතන සඳහා ලිපි මගින් දැනුම් දීම් සිදු කර ඇති අතර, බහුතරයක් ඒ සඳහා දක්වන ප්‍රතිචාර මත අත්තිකාරම් මුදල් පියවීම් සිදු කළ අතර, තවදුරටත් පියවීමට ඇති අත්තිකාරම් මුදල් සඳහා නැවත දැනුම් දීමටත් සිදු කර, එසේ ද සිදු නොවුනහොත් ආයතනයේ AMC හරහා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා උපදෙස් පැතීමට කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

(ආ)වසර 5 කට වඩා වැඩි වෙනත් ගෙවීම් හා උපචිත වියදම් සඳහා සැපයුම්කරුවන් වෙත සත්‍යාපන ලිපි යවා ඇති අතර, එම මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

2.5 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

(අ) භාණ්ඩාගාර චක්‍රලේඛ

(i) භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමින් පවතී.

(ii) පරිගනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යනු ලැබේ.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන් සඳහා පොළී අදායම ලෙස රු.37,504,984 ක මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කර ඇති අතර, නිවැරදි පරිදි පොළී ආදායම වෙනත් ආදායම් යටතේ ආයතනයේ ආදායම් ප්‍රමාණයමූල්‍ය කාර්ය ප්‍රකාශයෙහි දක්වා ඇත. මන්ද යත් එය ආයතනයේ ක්‍රියාකාරකම් හරහා ආයතනයට වර්ෂය තුල ලැබිය යුතු පොළී ආදායම බැවිනි.එය ජනනය වූවේ බලශක්ති අරමුදල හරහා සහ ඇප අරමුදලේ මුදල් භාවිතය තුලින් වන බැවින් සමස්ථ ආදායම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හරහා අදාලඅරමුදල් ගිණුම් වලට බැර කිරීම මගින් මූල්‍ය ප්‍රකාශන වලට නිවැරදි ලෙස සටහන් කිරීමක් සිදු වී ඇති බව අපගේ මතයයි.

තව ද ආයතනයේ පුනර්ජනනීය බලශක්ති ඉපයීම්/බලශක්ති කළමනාකරණඉපයීම් හා වෙනත් ආදායම් ලෙස හදුනාගත් පොළී ආදායමයනු ආයතනයේම ක්‍රියාකාරකම් තුලින් ජනනය වන ආදායම් වේ. පසුගිය ගිණුම් වර්ෂ වල එම මුදල් මූල්‍ය කාර්යසාදන ප්‍රකාශයන්ට ඇතුලත් නොකරනු ලැබ ඇති අතර, ඒ හේතුවෙන් ආදායම්/ මූල්‍ය ප්‍රථිඵලය ඌන ගනනය වී ඇත. 2017 වර්ෂයේ සලකා බලනු ලැබ මුලු ආදායම මූල්‍ය ප්‍රකාශයන්ට හදුනාගෙන ඇත. එබැවින් මෙහිදී වැරදි ගිණුම්කරණයක් සිදු නොවී ඇති අතර, ආයතනයේ සමස්ථ ප්‍රතිඵලය වඩා නිරවද්‍ය ආකාරයෙන් ඉදිරිපත්කොට ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

ඉහත දක්වා ඇති කරුණු වලට අදාළ ක්‍රියාකාරකම් සහ එම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවාට අදාළ වර්තමාන තත්වය පහත පරිදි වේ.

අංකය	ක්‍රියාකාරකම	ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
1	පුනර්ජනනීය බලශක්ති විභවයන් ඇගයීමේ ව්‍යාපෘතිය	බගවන්තලාව සුළං කුලුණ ඉදිකිරීම, ඉඩම් ගැටළුවක් නිසා ප්‍රමාද වූ අතර, එය නිරාකරණය කර ඉදිකිරීම් සිදුකරන ලදී. මේ වනවිට ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.
2	ADB Quantum Leap ව්‍යාපෘතිය	ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.
3	සූර්ය විදුලි ජනනයේ කාර්යක්ෂම භාවිතය සඳහා ක්ෂුද්‍ර විදුලි පද්ධති	කෙටුම්පත් අවසන් වාර්තාව ලබාදී ඇති අතර, ඒ සම්බන්ධ ආයතනය මගින් ලබාදෙන ලද නිරීක්ෂණ පාදක කර අවසන් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.
4	කාර්යක්ෂම විදුලි වාහන ව්‍යාපෘතිය	මෙම ව්‍යාපෘතිය සම්බන්ධව සිදුවී ඇති පමාව හේතුවෙන් සමථ මණ්ඩලය වෙත යොමු කර ඇත.
5	සාම්පූර් සුළං මැනීමේ කුළුණු	ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.
6	නඩු කුඩා සුලං මැනීමේ කුළුණු	ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.
7	පිවිතුරු බලශක්ති පද්ධති ඉහළ නැංවීමේ ව්‍යාපෘති	ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.
8	කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා උපදේශන සංග්‍රහය සමාලෝචනය කිරීම	ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.

5. අයවැය ලේඛනමය පාලනය

විගණකාධිපතිතුමා විසින් පෙන්වා දී ඇති පරිදි අයවැය ලේඛනය මූලික කරගත් මූල්‍ය පාලනයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කොට 2019 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ.

6. පද්ධති හා පාලනයන්

විගණකාධිපතිතුමා විසින් පෙන්වා දී ඇති ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඒවා අදාල අරමුණු පරමාර්ථ ඉටු කර ගැනීම යොමු කිරීමටත් අදාල දුර්වලතාවයන් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමටත් පියවර ගනු ලැබේ. මෙහි සඳහන් පරිගණක ලෙජර් ක්‍රමය හඳුන්වා දී ඇති අතර, 2019 වසරේ සිට එමගින් ගිණුම් කටයුතු සිදු කෙරේ.